# වාර්ෂික වාර්තාව 2013

## කාර්මික තාක්ෂණ ආයතනය

තාක්ෂණ හා කාර්මික ප්‍රවර්ධනයේ ඔබේ සහකරු

# පටුන


| | |
|---|---|
| ගුණාත්මක බව පිළිබඳ කාර්මික තාක්ෂණ ආයතන ප්‍රතිපත්තිය | 1 |
| පනත හා නීති රෙගුලාසි | 2 |
| සතු බලතල හා වගකීම් | 2 |
| දර්ශනය | 2 |
| මෙහෙවර | 2 |
| පාලක මණ්ඩලය හා කමිටු | 3 |
| සංවිධාන ව්‍යුහය | 4 |
| ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය | 5 |
| සභාපතිතුමාගේ පණිවුඩය | 6 |
| විධායක වාර්තාව | 11 |
| සුවිශේෂී නිපුණතා | 19 |
| ගුණාත්මක යටිතල පහසුකම් | 25 |
| අධිවේගී කර්මාන්ත තාක්ෂණ ප්‍රවර්ධනය | 28 |
| තරඟකාරීත්වයේ අනභිභාවනීයත්වය | 31 |
| පාරිසරික දූෂණ නිරීක්ෂණය හා වැලකුම් ක්‍රියාමාර්ග | 34 |
| මානව සුභ සාධන හා සමාජ ආර්ථික ප්‍රවර්ධනය සඳහා තාක්ෂණය | 36 |
| සම්මන්ත්‍රණ, සමුළු, පුහුණු වැඩසටහන් හා වැඩමුළු | 37 |
| ධාරිතා වර්ධනය හා ඵලදායිතා ප්‍රවර්ධනය | 41 |
| නව ප්‍රවණතා | 47 |
| සංයුක්ත දැනුවත් කිරීම් | 52 |
| කර්මාන්ත සඳහා තොරතුරු | 56 |
| ප්‍රදානයන් හා සම්මානලාභීන් පිළිගැනීම් | 60 |
| සමාජ සුභ සාධන හා ආගමික කටයුතු | 64 |
| ප්‍රකාශන, ඉදිරිපත් කිරීම් හා පේටන්ට් බලපත් | 66 |
| මානව සම්පත් | 85 |
| විධායක කාර්ය මණ්ඩලය | 89 |
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශන | 100 |
| විගණකාධිපති වාර්තාව | 118 |
| විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු | 128 |

# ගුණාත්මක බව පිළිබඳ කාර්මික තාක්ෂණ ආයතන ප්‍රතිපත්තිය

ජාතික ගුණාත්මක ප්‍රතිපත්තිය මත පිහිටමින් පරීක්ෂණ හා ක්‍රමාංකන සේවා ISO 17025 ගුණාත්ම කළමණාකරණ පද්ධතියට එකඟව ද ආයතනය පූර්ණ වශයෙන් ISO 9000 ගුණාත්ම කළමණාකරණ පද්ධතියට එකඟව ද සේවාලාභීන් වෙත වෘත්තීමය ප්‍රමිතීන්ට අනුකූලව උසස් සේවාවන් සැපයීමට කාර්මික තාක්ෂණ ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමණාකරණය නොපැකිලිව ඉදිරිපත්ව සිටී.

කාර්මික තාක්ෂණ ආයතනයේ සියලු සේවක සේවිකාවන් ක්‍රියාත්මක සංකල්පය පිළිබඳව මනාව දැනුවත් කර ඇති හෙයින් අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූල වන අයුරින් සියලු සේවා සැපයීමට සැදී පැහැදී සිටී.

සේවාලාභීන්ගේ අභිමතාර්ථයන් හැකි ඉහළම අයුරින් ඉටුකර දෙමින් සපයන සේවාවන්ගේ නිරන්තර ප්‍රවර්ධනය සහිතව ISO 17025 ගුණාත්ම රීතීන් අනුව කාර්මික සේවා සැපයීමත් ISO 9000 ප්‍රමිතියට අනුව ගුණාත්ම කළමණාකරණ සේවා ඉටුකිරීමටත් ආයතනයේ සියලුම සේවක සේවිකාවන් බැඳී සිටී.

## පනත හා නීති රෙගුලාසි

කාර්මික තාක්ෂණ ආයතනය (ITI) ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. 1994 විද්‍යා හා තාක්ෂණ ප්‍රවර්ධන පනතේ අංක 11 ට අනුව, 1998 අප්‍රේල් 01 දින සිට බලපවත්වන අයුරින් ස්ථාපිත කොට ඇත. 1955 පිහිටුවන ලද ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය (CISIR) ඇවෑමෙන් කාර්මික තාක්ෂණ ආයතනය බිහි විය. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ පවත්නා, ශ්‍රී ලංකා රජයේ පූර්ණ අයිතිය ක්‍රියාකාරීත්වය හා අධීක්ෂණය ඇති කාර්මික තාක්ෂණ ආයතනය තම සේවාලාභීන් හා අනෙකුත් පාර්ශව කරුවන් වෙළඳපොල කරා මෙහෙයවන මග පෙන්වන්නෙකු ලෙස සිය කාර්යභාරය ඉටු කරයි.

## සතු බලතල හා වගකීම්

1994 දී ඉදිරිපත් කරන ලද විද්‍යා හා තාක්ෂණ ප්‍රවර්ධන පනතේ අංක 11 ට අනුව, 1998 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මකව පවත්නා අප සතු බලතල හා වගකීම් පහත දක්වා ඇත.
තාක්ෂණ ආයතනය ඉල්ලුම විසින් මෙහෙයවනු ඇත. තාක්ෂණ ආයතනයේ අභිමතාර්ථය විය යුත්තේ සීඝ්‍ර කාර්මික සංවර්ධනයක් සඳහා ශ්‍රී ලංකාවේ තාක්ෂණ ප්‍රවර්ධන කටයුතු ඉහළ තලයකට ගෙන යාමයි.

## දර්ශනය

ජාතික සංවර්ධනය උදෙසා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ක්ෂේත්‍රයේ විශිෂ්ඨ කලාපීය මධ්‍යස්ථානය ලෙස කටයුතු කිරීම.

## මෙහෙවර

ශ්‍රී ලාංකීය ජන සමාජයේ උන්නතිය සඳහා අන්තර්ජාතික තරඟකාරී නව කාර්මික පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රවේගකාරී අයුරින් පවත්වාගෙන යාම.

# පාලක මණ්ඩල හා කමිටු

**සභාපති**

මහාචාර්ය ඩබ් අබේවික්‍රම
මහාචාර්ය පරිපෝෂිත විද්‍යා
වෛද්‍ය පීඨය, කැළණිය විශ්ව විද්‍යාලය

**සාමාජිකයින්**

ආචාර්ය ජී ඒ එස් ප්‍රේමකුමාර
*අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී, කාර්මික තාක්ෂණ ආයතනය සභික*

අසේල ඉද්දවෙල මහතා
*උප සභාපති, තිරසාර සංවර්ධන හා බාහිර කටයුතු, හොල්සිම් ලංකා පුද්ගලික සමාගම*

ආචාර්ය එන වී චන්ද්‍රසේකරන්
*ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, රසායන විද්‍යා අංශය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය*

මහාචාර්ය සුදන්ත ලියනගේ
*අංශ ප්‍රධානී, ව්‍යවහාරික විද්‍යා අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය*

ආචාර්ය ශාන්ත අමරසිංහ
*ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, රසායනික ක්‍රියාවලි ඉංජිනේරු, මොරටුව විශ්ව විද්‍යාලය*

මහේන්ද්‍ර ජයසේකර මහතා
*කළමණාකරණ අධ්‍යක්ෂ, ලංකා ටයිල්ස් පුද්ගලික සමාගම*

ඩබ් ඩී ජයසිංහ මහතා
අතිරේක ලේකම්, කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය

එස් එම් රාජපක්ෂ මහත්මිය
සහකාර අධ්‍යක්ෂ , රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මුදල් හා සැලසුම් අමාත්‍යාංශය

රේණුකා ජයතිලක මහත්මිය
*ආයතන ලේකම් හා ලේකම්, පාලක මණ්ඩල හා විගණන කමිටුව*

# සංවිධාන ව්‍යුහය

**සභාපති**
**පාලක මණ්ඩලය**

කළමණාකරණ
කමිටුව

**අධ්‍යක්ෂ (ප්‍රධාන විධායක නිලධාරී)**

ප්‍රතිපත්ති

උපදේශන

කමිටුව

- **ජෛව තාක්ෂණ ඒකකය (BTU)**
- **පර්යේෂණ හා සංවර්ධන අංශය (R & D)**
  - ආහාර තාක්ෂණ අංශය (FTS)
  - ශාක තාක්ෂණ අංශය (HTS)
  - ද්‍රව්‍ය තාක්ෂණ අංශය (MTS)
  - පාරිසරික තාක්ෂණ අංශය (ETS)
- **තාක්ෂණ සේවා අංශය (TS)**
  - රසායන හා ක්ෂුද්‍රජීවී රසායනාගාරය (CML)
  - ද්‍රව්‍ය තාක්ෂණ රසායනාගාරය (ML)
  - කර්මාන්ත මිණුම් රසායනාගාරය (IML)
  - විද්‍යුත් තාක්ෂණ රසායනාගාරය (ETL)
- **තොරතුරු සේවා මධ්‍යස්ථානය (ISC)**
- **පරිපාලන හා මෙහෙයුම් අංශය (A & O)**
  - මානව සම්පත් දෙපාර්තමේන්තුව (HRD)
  - අලෙවි හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව (MBD)
  - ප්‍රවාහන ඒකකය (TU)
  - ඉංජිනේරු සේවා අංශය (ES)
- **මූල්‍ය දෙපාර්තමේන්තුව (FD)**
  - ගබඩාව (STO)
  - සැපයුම් (SUP)
- **තත්ව සුපරීක්ෂණ දෙපාර්තමේන්තුව (QAD)**
- **අභ්‍යන්තර විගණන අංශය (IA)**
- පරිගණක ඒකකය **(CU)**

# ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය

**අධ්‍යක්ෂ ජෙනරාල් / ප්‍රධාන විධායක නිලධාරී**
ආචාර්ය ජී ඒ එස් ප්‍රේමකුමාර

**අතිරේක අධ්‍යක්ෂ, කාර්මික සේවා**
ඒ එස් පත්තිල මයා

**අතිරේක අධ්‍යක්ෂ, පර්යේෂණ හා සංවර්ධන**
ආචාර්ය ජේ කේ ආර් ආර් සමරසේකර මිය

**අතිරේක අධ්‍යක්ෂ, පාලන හා මෙහෙයුම්**
ඩී සී ඒ සතෘකුලසිංහ මයා

**පර්යේෂණ හා සංවර්ධන**

ආචාර්ය ඉල්මී ජී එන් හේවාජුලිගේ මිය
*ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ආහාර තාක්ෂණ අංශය*

*ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ශාක තාක්ෂණ අංශය*
*පුරප්පාඩුව පවතී*

ආචාර්ය අයි ආර් එම් කෝට්ටේගොඩ මිය
*ප්‍රධානී, ද්‍රව්‍ය තාක්ෂණ අංශය*

එච් එම් ගුණදාස මයා
*ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ, පාරිසරික තාක්ෂණ අංශය*

ආචාර්ය එස් ජී සේනාරත්න මිය
*ප්‍රධානී, ජෛව තාක්ෂණ ඒකකය*

**තොරතුරු සේවා මධ්‍යස්ථානය**
*ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ, තොරතුරු සේවා මධ්‍යස්ථානය*
*පුරප්පාඩුව පවතී*

*ප්‍රවර්ධන*
**අභ්‍යන්තර විගණන අංශය**
කේ ඒ එස් පී කළුආරච්චි මයා
*ප්‍රධාන අභ්‍යන්තර විගණක*

***මූල්‍ය දෙපාර්තමේන්තුව***
ජොන්සන් සොලමන් මයා

*ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ, මූල්‍ය දෙපාර්තමේන්තුව*

**කාර්මික සේවා**

ජේ කේ ඒ බී විජේගුණසේකර මයා
*ප්‍රධානී, රසායන හා ක්ෂුද්‍රජීවී රසායනාගාරය*

ජේ එම් එස් ජයතිලක මයා
*ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ද්‍රව්‍ය රසායනාගාරය*

ආචාර්ය ඩබ් එම් එස් විජේසිංහ මයා
*ප්‍රධානී, කාර්මික මිණුම් රසායනාගාරය*

ආර් එම් වීරසිංහ මයා
*ප්‍රධානී, විද්‍යුත් තාක්ෂණ රසායනාගාරය*

**තත්ව සුපරීක්ෂණ දෙපාර්තමේන්තුව**
එච් පී පී එස් සෝමසිරි මයා
*වැඩ බලන නිලධාරී , තත්ව සුපරීක්ෂණ දෙපාර්තමේන්තුව*

**පරිපාලන හා මෙහෙයුම්**
*ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ, පාලන හා මානව සම්පත්*
*(පුරප්පාඩුව පවතී)*

මනෝරි විජේමාන්න මහත්මිය
*ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ, අලෙවි හා ව්‍යාපාර*

ඒ එස් ආරච්චි මයා
*ප්‍රධානී, ඉංජිනේරු සේවා*

**ආයතන ලේකම්**
ඒ එම් කේ ආර් ජයතිලක මිය

- සුරනී සමරසේකර මහත්මිය, තොරතුරු සේවා මධ්‍යස්ථානයේ *ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ* ලෙස 2013 දෙසැම්බර් දක්වා කටයුතු කරන ලදි.
- තිලක් සමරසේකර මහතා මානව සම්පත් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස 2014 නොවැම්බර් 30 දක්වා කටයුතු කරන ලදි.

# සභාපතිතුමාගේ පණිවිඩය

කාර්මික තාක්ෂණ ආයතනයේ සභාපති ලෙස කටයුතු කල මහාචාර්ය විජය කුමාර් මහතාගේ සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව 2013 ජූලි මස 30 වන දින මවිසින් කාර්මික තාක්ෂණ ආයතනයේ සභාපති ධූරයේ රාජකාරී ආරම්භ කරන ලදි.

මහින්ද චින්තන අසිරිමත් අනාගතයක පෙර දැකුම් වැඩසටහන තුලින් ඉදිරිපත්කොට ඇති අදහස් මෙන්ම තාක්ෂණ හා පර්යේෂණ ගරු අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතාගේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නගා සිටුවමින් කෘෂිකාර්මික, පශු සම්පත් හා ගෘහ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය තුලින් සමාජයීය ජීවන තත්වය නගා සිටුවීමේදී කාර්මික තාක්ෂණ ආයතනය සතු දැනුම හුවමාරු කොට සෑම නිවැසි ඒකකයක් වෙත තම ගෘහස්ත ආදායම් ඉහල අගයකට ගෙන ඒම තුලින් ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව තහවුරු කොට වියදම් ප්‍රමාණ පහල අගයකට ගෙන ඒම මත ස්වයං සක්‍යතා සහිත ආර්ථිකයක් ස්ථාපිත කිරීමට ඇති අභියෝගය භාරගන්නා ලදි.

ගරු අමාත්‍යතුමන්ගේ දැක්මට සමගාමීව කාර්යක්ෂම ශ්‍රම බලකායක් ප්‍රතිස්ථාපනය අරමුණු කොට S5 වැඩසටහනක් හා S5 ඒකකයක් ආයතනය තුල ස්ථාපනය කොට කාර්යභාර නිලධාරියෙකු පත්කරන ලදි.

ශාක තාක්ෂණ අංශ ප්‍රධානී මෙන්ම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස කටයුතු කොට කෙටි කාලයක් සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන) ලෙස සේවය කල ආචාර්ය ජී ඒ එස් ප්‍රේමකුමාර මහතා 2013 ජනවාරි 4 වන දින සිට කාර්මික තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදි. කාර්මික තාක්ෂණ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන) තනතුර සඳහා ආචාර්ය රාධිකා සමරසේකර මහත්මිය පත් කිරීම 2013.01.07 දින සිදු කිරීම මගින් ආයතනයේ පුරප්පාඩුව පැවති නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු ත්‍රිත්වයම සපුරා ගැනීමට හැකි විය.

කාර්මික තාක්ෂණ ආයතනයීය විද්‍යුත් තාක්ෂණ රසායනාගාරයේ නිෂ්පාදිත වීථි ලාම්පු පාලක පද්ධතිය හා ශ්‍රවණ ප්‍රමාණ මැණ බැලීමේදී භාවිතයට ගනු ලබන අඩු පිරිවැය සහිත මනා නිරවද්‍යතාවයක් සහිතව පාවිච්චි කල හැකි මෙවලම ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් සංවිධානය කල සහසක් නව නිමැවුම් ප්‍රදර්ශනයේදී පිළිවෙලින් දෙවන හා ප්‍රථම ස්ථාන සඳහා පිරිනැමෙන තිළිණ හිමිකරගන්නා ලදි.

# සභාපතිතුමාගේ පණිවිඩය

## අන්තර්ජාතික විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය

දකුණ තිරසාර සංවර්ධනය උදෙසා පිහිට වූ විශිෂ්ටතා මධ්‍යස්ථානය අක්රා, ඝානා හි 2013 මැයි මස පවත්වන ලද 16 වන සම්බන්ධතා කවුන්සිලය වෙතින් කාර්මික තාක්ෂණ අයතනය COMSATS ජාලයේ සාමාජිකයෙකු ලෙස පත්කරගන්නා ලදි.

ආයතන සේවක පිරිසගේ වෛද්‍ය පහසුකම් පිරිමැසීම සඳහා කාර්මික තාක්ෂණ ආයතන කාර්ය මණ්ඩලය සඳහා දීර්ඝ කාලයක සිට අත්‍යවශ්‍යව පැවැති වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් ශ්‍රී ලංකා රක්ෂණ සමාගමය හා එක්ව කොටස්කාර රක්ෂණ ක්‍රමයක් සාර්ථක ලෙස ස්ථාපිත කරන ලදි.
පර්යේෂණ කටයුතුවල යෙදෙන පර්යේෂණ නිලධාරීන් විසින් සිදු කරනු ලබන විද්‍යාත්මක පර්යේෂණ දිරිමත් කිරීම සඳහා PF 380 චක්‍රලේඛය යම් ප්‍රමාණයකට ක්‍රියාත්මක කොට උපදේශක සේවා සඳහා ගෙවීම් ක්‍රියාවට නගන ලදි.

කථිකත්වය පිළිබඳව උපාධි සහිත සේවකයින් වරලත් කථිකයින් ලෙස උත්සව අවස්ථාවන්හිදී සව්දිය පිරීමේ කථික සමාගමයක් කාර්මික තාක්ෂණ ආයතනයේ පිහිටුවීම පදනම්කොට ආයතන නිලධාරීන් 20 දෙනෙකුගෙන් සැදුම්ලත් සංගමයක් ආරම්භ කිරීමට අවශ්‍ය මූලික පදනම ස්ථාපිත කරන ලදි.

2012 වසර හා සංසන්දනාත්මකව 2013 වසරේදී ආයතනයේ ඉපැයීම් ප්‍රමාණය 30.25% වර්ධනයක් පෙන්නුම් කරමින් ආදායම රුපියල් මිලියන 159.3 සිට මිලියන 207.5 දක්වා වර්ධනය විය. පසුගිය තෙවසරක් තුල ලද ආදායම් වර්ධනය සන්සන්දනය කිරීමේදී 2012 හා 2013 වසර වලදී පිලිවෙලින් ලද 7.8 ක හා 17.3% ක ආදායම මෙම වසර තුලදී වාර්තාගත ලෙස වර්ධනය වී 30.25% ක ඉහල අගයක් පෙන්නුම් කරයි.

තාක්ෂණ සේවා අංශය නොකඩවා ආදායම් ඉපැයීමේ ප්‍රමුඛ කාර්යභාරය සිදුකරමින් පසුගිය වසර තුල ඉපැයූ රුපියල් මිලියන 124.2 ප්‍රමාණය සන්සන්දනාත්මකව වර්ධණය කරගනිමින් රු.මිලියන 160 දක්වා ඉහල නංවා ගන්නා ලදි. කොන්ත්‍රාත් පදනම මත ඉටුකල ව්‍යාපෘති වෙතින් 2012 වසරේ ඉපැයූ රු. මිලියන 8.1 ක ආදායම 2013 වසරේදී රු. මිලියන 12.4 ක් දක්වා සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහල නංවාගෙන ඇත.

තාක්ෂණික සේවා අංශ මගින් සිදු කරන ලද සුවිශේෂී කාර්යයක් ලෙස එම අංශය විසින් නවෝත්පාදන පර්යේෂණය හැකියාවන් ප්‍රදර්ශනය කොට නිෂ්පාදිත වර්ෂාපතන මානය තාක්ෂණ හුවමාරු කොට පැවරීමේ ව්‍යාපෘතිය සාර්ථක ලෙස නිම කිරීම පෙන්වාදිය හැක.

# සභාපතිතුමාගේ පණිවිඩය

එමගින් තාක්ෂණ හුවමාරු වෙතින් 2013 වසරේදී ලද රු. මිලියන 2.8 ක ආදායම රු. මිලියන 3 දක්වා 2013 වසරේදී වර්ධනය කරගැනීමට හැකිව ඇත. කෙසේ වුවද ආදායම් හා ප්‍රතිපූරක වියදම් අනුපාතය 2013 පැවති 94.5% ක ප්‍රමාණය 87% දක්වා පහල අගයකට ගෙන ඒමට සමත්ව ඇත.

නව වැටුප් පරිමාණයන් හා අනුමත බඳවා ගැනීමේ පටිපාටි ගෙවීම් හේතුකොට පුද්ගල වැටුප් හා දීමනා 2013 වසරේදී 25% ක වැඩි අගයකින් රු. මිලියන 51.4 දක්වා ඉහල ගිය අතර ප්‍රතිපූරක වියදම්හි උද්ධමනය 19.3% ක් විද්‍යාමාන වීමට හේතු ලෙස ආර්ථිකයේ විදේශ විනිමය විචල්‍යතා පෙන්නුම් කල හැක. මෙම ප්‍රවණතා වෙතින් එක් සේවකයෙකු සඳහා 2013 වසරේ පැවති වියදම 0.06% මෙම වසර හා සන්සන්දනාත්මකව එක් සේවකයෙකු මගින් ඉපැයූ ආදායම 0.09% අගය හා ඉතා ඉහල අගයක් පෙන්නුම් කරයි.

කාර්මික තාක්ෂණ ආයතනය විසින් ඉපැයූ ආදායම් යොදාගනිමින් මාලඹේ ඉදිකෙරෙන නව කාර්මික තාක්ෂණ ආයතන සංකීර්ණයේ කෘෂි හා ආහාර තාක්ෂණ ගොඩනැගිල්ලේ අතිරේක මහල් ඉදිකිරීම් කටයුතු සිදුකල අතර පිරිපාලන ගොඩනැගිල්ල හා කෘෂි හා ආහාර තාක්ෂණ අංශ ඉදිකිරීම් අවසන් කරන ලදි. අවශ්‍ය අතිරේක ඉඩම් අත්පත් කරගනිමින් චන්ද්‍රිකා කුමාරතුංග මාවතේ සිට සංකීර්ණය වෙත පිවිසුම් මාර්ගයේ පාලම ඉදිකිරීම නිමා කරන ලදි. උසස් ද්‍රව්‍ය තාක්ෂණ අංශ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීම සඳහා අදාල අධිකාරී ආයතන සමග සාර්ථක සාකච්ඡා ආයතනය විසින් පවත්වන ලදි.

ආයතනයේ ක්‍රියාත්මකව පවත්නා වැටුප් හා වෙනත් සේවක දීමනා වෙනත් ආයතන සමග තරඟකාරීව නොපැවතීම හේතුවෙන් තවමත් පර්යේෂණ කාර්ය මණ්ඩලය සඳහා උසස් ගුණාත්මයෙන් යුත් කාර්ය මණ්ඩලයක් ආයතනය සතුකර ගැනීමට නොහැකි තත්වයක පවතී. එසේ වුවද පර්යේෂණ සඳහා දීමනා (භාණ්ඩාගාර අරමුදල් යොදා ක්‍රියාත්මක ව්‍යාපෘතීන්ද ඇතුලත්ව) හා පර්යේෂණ ව්‍යාපෘති තුලින් ලබන ආදායම් සේවකයින් අතර බෙදාදීම වැනි පියවර ගැනීම මගින් මෙම බාධක සැහෙන පමණකින් මගහරවා ගැනීමට හැකිව ඇත. නමුදු පෙර සිදුකරන ලද උසස්වීම් හා තනතුරු ප්‍රතිස්ථාපන කටයුතු සඳහා ගෙවිය යුතු හිඟ මුදල් මාස 4 ක කෙටි කාලයක් තුල වේගවත්ව සිදුකරන ලදි.

ප්‍රවීණතා පදනම් කොට විද්‍යාඥයින් සඳහා ක්‍රියාත්මක දිරිගැන්වීමේ දීමනා හා වෙනත් දිරිගැන්වීමේ කටයුතු නොකඩවා ආයතනය තුල ක්‍රියාවට නගන ලදි. සේවක සබඳතා සාර්ථකව පැවතිණ. අන්තර්ජාතික හා දේශීය ප්‍රතීතකරණය සහිත රසායනාගාර සේවාවන් විවිධ පරාසයන් තුල ශ්‍රී ලාංකීය කර්මාන්ත සඳහා ඉටුකරමින් කාර්මික තාක්ෂණ ආයතනය ප්‍රධාන කාර්යභාරයක් නොකඩවා සිදුකරන ලදි.

# සභාපතිතුමාගේ පණිවිඩය

කාර්මික තාක්ෂණ ආයතනයේ ප්‍රමුඛ අංශ 7 ක් අතුරින් 3 ක් SWEDEC සංවිධානය හා SLAB ආයතනය වෙතින් ප්‍රතීතකරණයට භාජනය කර ඇති අතර තවත් එක් ප්‍රමුඛ අංශයක් ශ්‍රී ලාංකික SLAB ආයතනය මගින් ප්‍රතීතකරණය කර ඇත. තව ද 130 කට වැඩි සේවා සංඛ්‍යාවක් SWEDEC සංවිධානය වෙතින් ප්‍රතීතකරණය කර ඇත.

දේශීය කර්මාන්ත ක්ෂේත්‍රය වෙත දීර්ඝ පරාසයක් තුල විහිදුනු ක්‍රමාංකණ සේවා සපයමින් ආයතනය සේවා සපයන ලදි. ක්‍රමාංකණ සේවා අතරට එක් කරන ලද නව සේවාවක් ලෙස නවමු ගුණාංග සහිතව මිණුම් ටේප් පටි ක්‍රමාංකණය සඳහා යොදාගත හැකි මිණුම් උපකරණයක් ද ඇතුලත්ය.

කාර්මික තාක්ෂණ ආයතනය තම අන්තර්ජාතික ප්‍රතිරූපය නිරංතරව රැකගනිමින් විදේශීය රසායනාගාර සේවා පවත්වමින්ද තත්ව කළමණාකරණය හා ක්ෂුද්‍ර ජීවී විශ්ලේෂණ පුහුණු වැඩසටහන් විදේශීය විද්‍යාඥයින් සඳහා පවත්වන ලදි.

ව්‍යවහාරික තාක්ෂණික දැනුම හා එය කර්මාන්ත වෙත හුවමාරු කිරීම සඳහා අත්‍යාවශ්‍යව (ඇබෑර්තුව) පැවති වාණිජ කළමණාකාර තනතුර ස්ථාපනය කරන ලදි.

කර්මාන්ත මුහුණ දෙන ගැටළු මෙන්ම රට මුහුණ දෙන අවදානම් ගැටළුකාරී තාක්ෂණික ප්‍රශ්න පිළිබඳව පර්යේෂණ කටයුතු නිරංතරව පවත්වන ලදි. පිටිකිරි නිෂ්පාදන DCD සංයෝගයෙන් දූෂණය වීම පිළිබඳව පරීක්ෂණ කටයුතු ආයතනය මගින් සිදුකල අවස්ථාවේ කාර්මික තාක්ෂණ ආයතනය සිදුකල කාර්ය භාරයට අමතරව ස්වභාවික කරුණු හේතු කොට ගෙන ඇතිවන උවදුරු පිළිබඳව ආයතනය වෙතින් ඉටුකෙරුණු කාර්ය භාරය වාර්ෂික වාර්තාවේ පහත පිටු තුල සවිස්තරාත්මකව පැහැදිලි කොට ඇත.

රතුපස්වල හා හංවැල්ල ප්‍රදේශ තුල පැවති කර්මාන්ත ආශ්‍රිත දූෂණ තත්වය පරීක්ෂණයට ලක්කොට පාරිසරික සාම්පල විශ්ලේෂණයට ලක් කිරීම කාර්මික තාක්ෂණ ආයතනය සිදු කල ප්‍රධාන ජාතික ගැටළු සඳහා ප්‍රතිකර්ම ලෙස පෙන්වාදිය හැක.
රාජ්‍ය අංශය හා පුද්ගලික අංශය මෙන්ම ශ්‍රී ලංකා අධිකරණය විසින්ද කාර්මික තාක්ෂණ ආයතනයේ දායකත්වය එම අවස්ථාවන්හිදී ඉල්ලා සිටි බව මෙහිදී විශේෂයෙන් සඳහන් කල යුතුය. කාර්මික තාක්ෂණ ආයතනය සතු විශ්වාසනීයත්වය හා භක්තිය පාර්ශවකරුවන් තුල කෙසේ පවතීද යන්න එම අවස්ථාවන්හිදී මනාව පිළිබිඹු කර ඇත. කර්මාන්ත වෙතින් ඇති කෙරෙන පාරිසරික උවදුරු නිරීක්ෂණය මෙන්ම ඒ සඳහා ගත යුතු වැලකුම් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ද කාර්මික තාක්ෂණ ආයතනය ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරමින් කර්මාන්ත ක්ෂේත්‍ර සඳහා සහාය විය.

# සභාපතිතුමාගේ පණිවිඩය

වාර්තාවේ සවිස්තරාත්මකව සඳහන් කර ඇති පරිදි ඉහත කර්තව්‍යයන් ශබ්ද හා කම්පන හේතුවෙන් ඇති වන දූෂණය විශේෂයෙන් නව නිෂ්පාදන ලෙස එලිදැක්වූ නාවික යාත්‍රා, මහා මාර්ග, වායුගෝලීය මෝචන හා ඝන අපද්‍රව්‍ය මෙන්ම අපසන්දන ජල කළමණාකරණය යන ක්ෂේත්‍රයන්හිය.

ඩෙංගු වසංගත තත්වය පිටු දැකීම සඳහා අවට පරිසරය පිරිසිදුව තබාගනිමින් ද මදුරුවන් බෝවන ස්ථාන වලක්වමින් කාර්ය මණ්ඩලය ඩෙංගු උවදුරු වලක්වා ගැනීම පිළිබඳව දැනුවත් කරමින් කාර්මික තාක්ෂණ ආයතනය ඩෙංගු මදුරු ප්‍රවාහක පාලනය අරමුණු කොට ක්‍රියාත්මක මහා පරිමාණ ව්‍යාපෘතියක කොටස්කරුවකු ලෙස කටයුතු කරයි.

ජනතාව මාරාන්තික වකුගඩු වසංගත රෝගයෙන් ආරක්ෂා කරගැනීම සඳහා ආරම්භක ක්‍රියාමාර්ගයක් ලෙස මැටියෙන් තැනූ අඩු වියදම් ජල පෙරණය රෝගය රෝගය පැතිරී ඇති ප්‍රදේශ තුල බෙදාහරින ලදී. මෙහි පවත්නා විශේෂත්වය වනුයේ ෆ්ලොරයිඩ හා බැර ලෝහ වන ආසනික් හා කැඩ්මියම් පෙරා ඉවත් කිරීමට ඇති හැකියාවයි. කාර්මික තාක්ෂණ ආයතනය මගින් පැවැත්වීමට නියමිත පරීක්ෂණ කටයුතු අවසන් කිරීමෙන් පසු මෙම පෙරනය කාර්මික තාක්ෂණ ආයතනයීය වෙළඳ නාමය සහිතව අනාගතයේදී වෙළඳපලට නිකුත් කිරීමට සමත් වනු ඇත.

ආයතනය සතු උපකරණ හා පහසුකම් යොදාගනිමින් පුද්ගලික අංශය සමග කෙරෙන ව්‍යාපෘතීන් තුලින් උපයාගන්නා ආදායම බෙදාගැනීම සඳහා ආකෘතියක් ස්ථාපිත කර ඇති අතර අනාගතයේදී එවන් පාර්ශවීය කරුවන් වැඩි ප්‍රමාණයක් සමග එක්ව කටයුතු කරමින් භාවිතයට යොදාගනු ඇත.

කාර්මික තාක්ෂණ ආයතනයේ විවිධ තනතුරු දරමින් වසර ගණනාවක් සේවයේ යෙදුනු ආචාර්ය සිරිමල් ප්‍රේමකුමාර මහතා නව අධ්‍යක්ෂ ජෙනරාල් / ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් පත්ව ආයතනයට නායකත්වය ලබාදුනි. පාලක මණ්ඩලය වෙනුවෙන් ආයතනය වෙත ඔහු විසින් කෙටි කාලයක් තුල අධ්‍යක්ෂ ජෙනරාල් / ප්‍රධාන විධායක නිලධාරී ලෙස දැක්වූ සහාය වෙනුවෙන් මාගේ ස්තූතිය පුද කිරීමට මෙය අවස්ථාව කර ගනිමි.

අවශ්‍ය අවස්ථාවන්හිදී මට සහාය දැක්වූ කාර්මික තාක්ෂණ ආයතනයේ මීට පෙර සිටි සභාපතිතුමන් හා අධ්‍යක්ෂ තුමන් වෙතද මාගේ ස්තූතිය පුද කරමි.
රටෙහි ප්‍රමුඛ කාර්මික පර්යේෂණ ආයතනය ලෙස කාර්මික තාක්ෂණ ආයතනයේ ප්‍රතිරූපය ආරක්ෂා කරගනිමින් පමණක් නොව කර්මාන්ත ක්ෂේත්‍රයේ විශ්වාසනීයත්වය ගොඩනගාගනිමින් ආයතනයීය හැකියාවන් මනාව පිලිබිඹු කරමින් තම කටයුතු ඉටු කිරීමට වෙහෙසගත් ආයතනයේ කළමනාකරණය හා සේවක මණ්ඩලය වෙත මාගේ ස්තූතිය පිරිනමමි.

මහාචාර්ය ඩබ්. අබේවික්‍රම
සභාපති

# විධායක වාර්තාව

සමාලෝචනයට ලක්කෙරෙන වසර තුල ආයතනය ප්‍රශංසනීය අයුරින් කටයුතු කොට ඇත. වසර තුල සිදුකල සුවිශේෂී තාක්ෂණික සේවා හා පර්යේෂණ කටයුතු අතුරින් සමහරක් පමණක් ඉස්මතුකර දක්වා ඇත.

## කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය උදෙසා සිදුකල පර්යේෂණ හා සංවර්ධන කටයුතු.

### තාක්ෂණ හුවමාරු කටයුතු

වර්ෂාපතන මාන නිෂ්පාදනය තාක්ෂණය හුවමාරු කිරීම සඳහා සිවිකොන් පුද්ගලික සමාගමය හා කාර්මික තාක්ෂණ ආයතනය එකඟතා ගිවිසුමකට අත්සන් තබන ලදී. 2007 වසරේදී මුල් වරට නිෂ්පාදිත ස්වයං ක්‍රියාකාරී වර්ෂාපතන මානය විශ්වාසනීයත්වය හා නිවැරැදිතාව වැඩිදියුණු කරමින් නිරංතරව ප්‍රවර්ධනය කරන ලදී. කෘමි සතුන් පාලනය සඳහා දේශීය බැසිලස් තුරෙන්ජිනේසිස් යෙදූ කොලියෝප්ටරෙන් කෘමීන් එළවලු හා පලතුරු මත සිදුකෙරෙන හානි වැළැක්වීමට නිෂ්පාදිත කෘමිනාශක නිෂ්පාදන තාක්ෂණ හුවමාරුව සීමාසහිත බයෝපවර් ලංකා සමාගම වෙත පවරාදෙන ලදී.

කොන්ත්‍රාත් පදනම මත පසුගිය වසරේ භාරගන්න ලද ඇඟලුම් වර්ණගන්වන කර්මාන්තයතනයක අපජල ප්‍රතිකාරක පද්ධතියක් හා වාහන නඩත්තු සේවා ස්ථානයකින් නික්මෙන අපජල ප්‍රතිකාරක පද්ධතියක් වසර තුලදී සාර්ථක ලෙස නිමාකරන ලදී.

### විද්‍යා හා තාක්ෂණ දැනුම කුඩා හා ක්ෂුද්‍ර පරිමාන ප්‍රවර්ධනය සඳහා

රජය මගින් ක්‍රියාත්මක ගැමි ආර්ථික ප්‍රවර්ධන විදාතා හා දිවිනැගුම වැඩසටහන් සඳහා කාර්මික තාක්ෂණ ආයතනය ක්‍රියාකාරී අයුරින් සහභාගී විය.
ඉඟුරු නිර්ජලීකරණය අගය වැඩි කල ඉඟුරු නිෂ්පාදන, ඖෂධීය බාම් හා තෙල් නිෂ්පාදනය ආදී විවිධ තාක්ෂණ ක්‍රම විධි පිළිබඳව විදාත මධ්‍යස්ථාන නිලධාරීන් ගනණාවක් විවිධ තාක්ෂණ දැනුම සහිත ගුරුවරුන් ලෙස පුහුණු කරන ලදී.

මඩකලපුව, පොලොන්නරුව, ගාල්ල හා කුරුණෑගල ප්‍රදේශ අලලා පුහුණු වැඩසටහන් පවත්වා දිවිනැගුම වැඩසටහන යටතේ 200 කට අධික පුද්ගලයින් පුහුණු කරන ලදී. දිවිනගුම බැංකු සායන, ද්‍රව්‍ය බෙදාහැරීම් හා සනීපාරක්ෂක වැඩසටහන් සම්පාදනය සඳහාද කාර්මික තාක්ෂණ ආයතනය දායක විය.

# විධායක වාර්තාව

ග්‍රාමීය ආර්ථිකය ඉහල නැංවීම සඳහා රාජ්‍ය හා අන්තර්ජාතික සංවිධාන අනුග්‍රහයෙන් කුඩා හා මධ්‍ය පරිමාන තාක්ෂණ හුවමාරු කිරීම සඳහා පුහුණු වැඩසටහන් ගනණාවක් පවත්වන ලදී. මත්ස්‍ය නිෂ්පාදන සැකසීම, සහල් පාදක නිෂ්පාදන, බෝතල් කරන ලද බැදූ හාල්මැස්සන්, කිතුල් බීම වර්ග සහ කිතුල් ජෙලි වැනි වැඩි ඉල්ලුමක් සහිත නිෂ්පාදන පුහුණු වැඩසටහන් වසර තුලදී ක්‍රියාත්මක කරන ලදී.

# අන්තර්ජාතිකව තරඟකාරී තාක්ෂණ සේවා සැපයුම්

## කර්මාන්ත ක්ෂේත්‍රයේ තරඟකාරී බව වැඩිදියුණු කිරීම

දිවයිනෙහි ප්‍රතීතක පරීක්ෂණ සේවා හා ක්‍රමාංකන සේවා සපයන ප්‍රමුඛ ආයතනයක් ලෙස කාර්මික තාක්ෂණ ආයතනය පරීක්ෂණ හා ක්‍රමාංකන සේවා 12,000 ක් හා උපකරණ 40 ක අලුත්වැඩියා කටයුතු සේවාලාභීන් 2000 කට අධික පිරිසක් වෙනුවෙන් නිර්දේශ හා රෙගුලාසි ක්‍රියාත්මක කෙරෙන CEA, BOI, කෘමිනාශක ලියාපදිංචි, ධීවර දෙපාර්තමේන්තුව, පොහොර ලේකම් කාර්යාලය, රේගුව, තේ මණ්ඩලය යන ආයතන සඳහා සපයන ලදී. ඊට අමතරව රසායනාගාර තත්වපාලන කළමනාකරණය, කාර්මික ක්‍රමාංකනය, ආහාර ආරක්ෂණ සේවා (HACCP, ISO 17025, ISO 15819) (වෛද්‍ය පරීක්ෂණ) පර්යේෂණ ආයතන හා විවිධ කර්මාන්ත වෙත සපයන ලදී.

ISO/TEC 17025 ප්‍රතීතකරණ තත්වය SWEDEC හා SLAB ආයතන වෙතින් විවිධ පරාමිතීන් සඳහා පරීක්ෂණ කටයුතු මෙහෙයවීමේ කුසලතා නිරංතරව ආරක්ෂා කරගනිමින් කටයුතු කරන ලදි. ශබ්ද ප්‍රමාණ මැන බැලීම සඳහා SLAB ආයතනයේ ප්‍රතීතකරණය සහිතව ඉටුකරදීමට පවත්නා කුසලතාවන් ද ආරක්ෂා කරගනිමින් සේවා ඉටුකරන ලදි. ISO 9001 : 2008 ප්‍රමිතිකරණය සහිත තොරතුරු සේවා මධ්‍යස්ථාන හා පර්යේෂණ හා සංවර්ධන රසායනාගාර සිය කටයුතු නිරංතරව මෙහෙයවන ලදි.

කර්මාන්තශාලා මගින් ඇති කෙරෙන වායු, ජල, ඝන අපද්‍රව්‍ය හා ශබ්ද ප්‍රමාණ අවම කිරීම සඳහා යෝජිත පාරිසරික උපදේශක සේවාවන් 130 ක් වසර තුල ක්‍රියාත්මක කරන ලදි. මෙම සේවා අතර නිර්මාණ, දූෂක පාලක පද්ධතීන්ගේ කාර්යක්ෂමතා මැන බැලීම, වායු විසරණ ආකෘතීන්, විසිරුම් පද්ධති ප්‍රවර්ධනය, දහන පද්ධතීන්ගේ සක්‍යතා නිර්ණයනය ආදිය ඇතුලත් වේ. දිගු පරාසයක විහිදුනු කර්මාන්තශාලා අප සේවා ලබාගන්නා ලදි.

# විධායක වාර්තාව

රථ වාහන නඩත්තු මධ්‍යස්ථාන, ගරාජ, රබර් වල්කනයිසින් ඒකක, පොලිතීන් හා ප්ලාස්ටික් ඇසුරුම් නිෂ්පාදනයක්, ලී බඩු ඔප දමන ආයතනයක්, තීන්ත හා දැව ආලේපන නිෂ්පාදනාගාරයක්, ලෙඩ් ඔක්සයිඩ නිෂ්පාදනාගාරයක්, MDF තහඩු නිෂ්පාදනායතනයක්, හාල් මෝලක්, ටයර් නඩත්තු පොලක්, කෘමිනාශක කුඩු ඇසුරුම් මධ්‍යස්ථානයක්, ජෛවීය ඝන අපද්‍රව්‍ය භාවිත උදුනක් හා පොල්කටු වාර්කෝල් කෑම නිෂ්පාදනාගාරයක්, ලෝහ විලීන කර්මාන්තයක්, සැකසූ තාර කර්මාන්තායතනයක් හා කුරුඳු කොල තෙල් ආසවකයක්, සත්ව ගොවිපල අප ද්‍රව්‍ය සැකසුම් මධ්‍යස්ථානයක් ආදිය ඒ අතර වේ.

# සමාජ යහපැවැත්ම නඟා සිටුවීම - සෞඛ්‍ය පෝෂණතා පාරිසරික විෂමතා

පාරිභෝගික ජනතාවගේ සෞඛ්‍ය සුරක්ෂිතතාව හා සුභ සාධනය වෙනුවෙන් කාර්මික තාක්ෂණ ආයතනය සතු තම කාර්ය භාරය අදාල විශේෂඥතා දැනුම භාවිතයට ගනිමින් ජාතික වශයෙන් වැදගත් ගැටළුකාරී තත්වයන් මගහරවා ගැනීම සඳහා නිරංතරව යොදන ලදි.

පර්යේෂණ හා තාක්ෂණ අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි ආනයනික පිටිකිරි තුල DCD සංයෝගය අඩංගු වීමෙන් අපවිත්‍ර වීම පරීක්ෂා කිරීමේ අභියෝගය කාර්මික තාක්ෂණ ආයතනය විසින් භාරගන්නා ලදී.

හරිතාගාර වායු හා නයිට්‍රජන් ජල මාර්ග තුලට පිවිසීම අවම කිරීම සඳහා තණබිම් තුලට DCD රසායනිකය එක්කරනු ලබයි. DCD රසායනිකය මගින් සෞඛ්‍යට අහිතකර තත්වයක් පොත්පත් තුල සඳහන් නොවූවද අධික DCD මාත්‍රාවකින් මානව සෞඛ්‍ය තත්වයට හානි සිදුවිය හැකිය.

කිරි ආහාර තුල පැවතිය හැකි DCD ප්‍රමාණ විශ්ලේෂණය සඳහා ක්‍රමවේධයක් කාර්මික තාක්ෂණ ආයතනයේ ස්ථාපිත කල අතර ඉන් ලත් ප්‍රතිඵල අදාළ අධිකාරී ආයතන වෙත සපයන ලදී.
රතුපස්වල ගම්වාසීන් හා රබර් කිරි භාවිතා කොට අත්වැසුම් නිෂ්පාදන කර්මාන්තායතනයකින් නිකුත්වන අපජල පරිවහනය පිළිබඳව මතභේදාත්මක තත්වයක් උද්ගත විය. ගම්පහ දිස්ත්‍රික් ලේකම්වරයාගේ ඉල්ලීම මත කාර්මික තාක්ෂණ ආයතනය විසින් රතුපස්වල ප්‍රදේශයේ ලිං ජලයේ pH අගය විශ්ලේෂණ කොට සවිස්තරාත්මක අධ්‍යන වාර්තාවක් ඉතා කෙටි කාලයක් තුලදී පිළියෙළ කොට, ප්‍රතිඵල දිස්ත්‍රික් ලේකම්වරයා වෙත ඉදිරිපත් කරන ලදී.

# විධායක වාර්තාව

ශබ්ද ප්‍රමාන මැන බැලීම සඳහා රට තුල ඇති එකම ප්‍රතීතක පහසුකම් සහිත ආයතනය වන කාර්මික තාක්ෂණ ආයතනය වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් කටුනායක අධිවේගී මාර්ගයේ ශබ්ද ප්‍රමාණයෙන් දෙපස පදිංචි නිවැසියන් වෙත ඇතිකෙරෙන බලපෑම පිළිබඳව නිගමනය කාර්මික තාක්ෂණ ආයතනයෙන් විමසන ලදී. IMMI ප්‍රමාණය අවම කිරීම සඳහා ඉදිකළ යුතු ශබ්ද පරිවාරක ප්‍රමාණයන් නිර්මාණය කිරීම ආයතනය වෙතින් සිදුකල අතර මෙය ශ්‍රී ලංකාවේදී ප්‍රථම වතාවට ශබ්ද පරිවාරක ඉදිකළ අවස්ථාවද විය.

## කාර්මික තාක්ෂණ ආයතනයේ සිදුකෙරෙන සීඝ්‍ර පර්යේෂණ හා සංවර්ධන කටයුතු

### මාලඹේ ව්‍යාපෘතිය

පර්යේෂණ හා සංවර්ධන ධාරිතා ප්‍රවර්ධන කටයුතු
කාර්මික තාක්ෂණ ආයතනයේ සේවය කරන විද්‍යාඥයින් හා ඉංජිනේරුවන් ඔවුන්ගේ විෂය ක්ෂේත්‍රයන්ට අදාළ පශ්චාත් උපාධීන් ලබාගැනීම වෙනුවෙන් නිරංතරව උනන්දු කරනු ලැබීය. වසර තුලදී පර්යේෂකයින් තිදෙනෙක් ආචාර්ය උපාධිය ලබාගත් අතර තවත් හතරදෙනෙකු තම ආචාර්ය උපාධි අධ්‍යයන කරගෙන යයි. එක් පර්යේෂකයෙකු ආචාර්ය උපාධිය සඳහා ලියාපදිංචි විය. එක් පර්යේෂණ නිලධාරිනියක් දර්ශනපති උපාධිය සම්පූර්ණ කල අතර තවත් හත්දෙනෙකු දර්ශනපති පාඨමාලා වෙත ලියාපදිංචි වී තවත් හත්දෙනෙකු දර්ශනපති වැඩසටහන් නොකඩවා කරගෙන යයි.

## ප්‍රකාශන, පේටන්ට් බලපත්, තිළිණ හා ඇගයීම්

කාර්මික තාක්ෂණ ආයතනය ප්‍රථම වතාවට පර්යේෂණ සම්මේලනයක් මේ වසරේදී පැවැත්විය. මෙහිදී පර්යේෂණ පත්‍රිකා ප්‍රකාශන 39 ක් විවිධ ක්ෂේත්‍ර අලලා අප ආයතනයේ විද්‍යාඥයින් හා ඉංජිනේරුවන් විසින් ඉදිරිපත් කෙරින. විමර්ශනයට ලක්කොට ප්‍රකාශනය කරනු ලබන සඟරා තුල පලකල පර්යේෂණ ලිපි 21 ක් ඒ අතර විය. එය වසර තුල පලකරන ලද පර්යේෂණ ලිපි ගණනෙහි සැලකිය යුතු වර්ධනයකි. දේශීය පේටන්ට් බලපත් අයිතිය හිමිකර ගැනීම සඳහා ඉල්ලුම් පත්‍ර 2 ක් වසර තුල ඉදිරිපත් කරන ලදී.

# විධායක වාර්තාව

## මානව සම්පත්

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස කටයුතු කල තොරතුරු සේවා මධ්‍යස්ථානයේ සුරනි සමරසේකර මහත්මිය දෙසැම්බර් මාසයේදී සේවයෙන් විශ්‍රාම ලැබීය. වසර තුල පර්යේෂණ විද්‍යාඥයින් / ඉංජිනේරුවරුන් 32 ක් විශ්‍රාම / සේවයෙන් ඉල්ලා අස්විය.

## සේවක සබඳතා හා සුබසාධක කටයුතු

වසර ආරම්භ වූයේ චාරිත්‍රානුකූලව බෞද්ධ සංගමය හා සුභ සාධක හා ක්‍රීඩා සමාජය එකාබද්ධව නව වසර වෙනුවෙන් පවත්වන ලද උත්සවයෙනි.
සේවක පිරිස හා ඔවුන්ගේ පවුල් සාමාජිකයින් සහභාගීකරවා ගනිමින් දෙදිනක සංචාරයක් අනුරාධපුරය හා ත්‍රිකුණාමලය ප්‍රදේශ ආවරණය කර සුභසාධක හා ක්‍රීඩා සංගමය විසින් සංවිධානය කරන ලදී.

බෞද්ධ සංගමය විසින් බුදුමැදුරක් තනවා පාඨලී චම්පික රණවක ගරු අමාත්‍යතුමා ගෙන්වා විවෘත කරන ලදී.වාර්ෂිකව පැවැත්වෙන බණ, වෙසක් හා පොසොන් උත්සව අලලා සිදුකල අතර වෙසක් පහන් කූඩු තරඟය 6 වන වතාවට පවත්වන ලදී.නත්තල සමරමින් ක්‍රිස්තියානි සංගමය විසින් නත්තල් සාදය ගීතිකා ගායන කොට කාර්මික තාක්ෂණ ආයතනය සේවකයින්ගේ දරු දැරියන් වෙත තෑගී බෙදා දෙමින් සමරන ලදී.

ආධාර ලැබිය යුතු ආයතන සේවක දරු දැරියන් වෙත පොත්පත් බෙදාහැරීමත් සිංහල හා හින්දු නව වසර වෙනුවෙන් අරමුදල් තර කරගැනීම උදෙසා භාණ්ඩ අඩු මුදලට සැපයීමේ වෙළඳ කටයුතු ද දියත් කරන ලදී.

**මූල්‍ය ප්‍රවණතා :** පසුගිය වසරේ අයවැය මගින් රාජ්‍ය ප්‍රතිපාදන වෙතින් සැපයූ ප්‍රතිපූරක වියදම් අවප්‍රමාණ කල අතර ප්‍රාග්ධන ප්‍රධාන ඉහළ අගයක් ඇතිව සිදු කරන ලදී. ප්‍රතිපාදන වියදම රු.මිලියන 169 සිට රු.මිලියන 1766 ක් දක්වා වැඩි වූ අතර ප්‍රාග්ධන ප්‍රතිපාදන රු.මිලියන 97.2 සිට රු.මිලියන 146.7 දක්වා වැඩි විය.

ආයතනීය අදායම් ඉපයීම 2012 වසරේදී පැවතී රු.මිලියන 188.4 ක ප්‍රමාණය 2013 දී 31% ක් 246.8 දක්වා සැලකියයුතු ප්‍රමාණයකින් වැඩිවී ඇති අතර ප්‍රතිපාදන වියදම 21.2% ක ප්‍රමාණයකින් වර්ධනය වෙමින් රු.මිලියන 314.3, රු.මිලියන 380.8 දක්වා ඉහළ ගියේය. ආදායම හා ප්‍රතිපාදන වියදම් අනුපාතිකය 60% සිට 65% දක්වා ඉහළ යන රටාවක පැවතිණි. පරීක්ෂණ හා ක්‍රමාංකන සේවා වෙතින් ලද ආදායම 56.5% ක(රු.මිලියන 139.5) දායකත්වයක්උපයන ලද ආදායමට දායක වී ඇති අතර මෙම වසර තුල කොන්ත්‍රාත්තු හා උපදේශක සේවා තුලින් ලද ආදායම 2012 දී පැවති 18.2 ක ප්‍රමාණය 2013 වසරේදී රු.මිලියන 25.3 දක්වා ඉහළ ගොස් ඇත.

# විධායක වාර්තාව

තාක්ෂණ හුවමාරු සේවා තුලින් ලද ආදායම 43% ක වර්ධනයක් පෙන්නුම් කරමින් පසුගිය වසරේ පැවති රු.මිලියන 2.8 ක ප්‍රමාණය මිලියන 4 දක්වා වර්ධනය වී ඇත. එක් සේවකයකු විසින් උත්පාදිත ආදායම සැලකිය යුතු ලෙස වර්ධනය වී රු. 576,300 /= දක්වා වර්ධනයක් පෙන්නුම් කරයි.

වසර තුල උපයාගත යුතු ඉලක්කගත ආදායම් ප්‍රමාණය ලබාගත් හේතුවෙන් නොකඩවා 10 වන වසරටත් ප්‍රසාද දීමනාආයතන සේවකයන් වෙත ගෙවන ලදී.

ආයතන උපයාගත් ආදායමින් වැඩි ප්‍රතිශතයක් පරීක්ෂණ සේවා හා ක්‍රමාංකන සේවා වෙතින් ඉපයූ අතර තාක්ෂණ හුවමාරු හා පර්යේෂණ සවර්ධන තුලින් ලද ආදායම 5%ක් ප්‍රමාණයක රැඳී පැවතින. කර්මාන්ත තුල පර්යේෂණ හා සංවර්ධන වෙනුවෙන් ඇති ඉල්ලුමෙහි පවත්නා අවප්‍රමාණය ඉන් පිළිබිඹුවේ. කර්මාන්ත වෙත ත්‍රිත්ව බඳු සහන පර්යේෂණ සංවර්ධන කටයුතු සඳහා බාහිර සම්පත් උපයෝගී කර ගැනීමේදී සපයා තිබුනද ඒ තුලින් අපේක්ෂක අරමුණු ඉටුකර ගැනීමේදී එතරම් බලපෑමක් සිදුවී නැති බව ඉන් පැහැදිලිවේ. වසර 2016 වන විට ශ්‍රී ලංකාව කලාපීය දැනුම පිළිබඳව කේන්ද්‍රස්ථානය බවට පත්කර ගැනීමේ අභිලාශය ඉටුකර ගැනීමේදී කාර්මික තාක්ෂණ ආයතනය වැනි ආයතන ඒ සඳහා කෙරෙන සුවිශේෂී කාර්යභාරය නොමැතිව එය ඉටුකර ගැනීම උගහටයි.

# විධායක වාර්තාව

## ආදායම් - ව්‍යාපාරික කටයුතු (රු. මි)




## ආදායම් - ව්‍යාපාරික කටයුතු (රු. මි)




## ප්‍රතිපාදන වියදම් (රු. මිලියන)




## පුනරාවර්ථන වියදම් රටාව (රු. මිලියන)



# විධායක වාර්තාව

## මෙහෙයුම් ආදායම් (රු. මිලියන)




## ආදායම් සමඟ පුනරාවර්තන වියදම් (රු. මිලියන)




## ඒක සේවක වියදම (රු. මිලියන)




## ඒක සේවක ආදායම (රු. මිලියන)



# සුවිශේෂී නිපුණතා

## කටුනායක අධිවේගී මාර්ගයේ ඉදිකළ ශබ්ද පරිවාරක

නගර ගණනාවක් හා ගෘහස්ථ පදිංචිකරුවන් රාශියක් වෙසෙන ගොහුරු බිම් අතුරින් දිවෙන කටුනායක අධිවේගී මාර්ගය දෙපස විශාල ලෙස ශබ්දයෙන් දූෂණය විය හැකි පරිසරයකි. මාර්ග සංවර්ධන අධිකාරිය හා ඉදිකිරීම් සමාගම අතර ශබ්ද පරිවාරක ඉදිකිරීම කොතෙක් දුර ප්‍රමාණයකට සිදුකල යුතුද යන්න සම්බන්දයෙන් මතවාදයක් කටුනායක අධිවේගී මාර්ගය ඉදිකිරීමේදී ඇති විය. උපදේශක වශයෙන් කටයුතු කල කාර්මික තාක්ෂණ ආයතනය IMMI ශබ්ද ආකෘති මොඩල මෘදුකාංග භාවිත කොට තම මතය කිසිඳු පාර්ශවයකට ගැති නොවන අයුරින් ශබ්ද පරිවාරක යෙදිය යුතු ආකාරය පිළිබඳව යෝජනා ඉදිරිපත් කරන ලදී.

අධිවේගී මාර්ග ඉදිකිරීමේදී ශබ්ද පාලනය පිළිබඳව පිළිපැදිය යුතු නීති රෙගුලාසි ශ්‍රී ලංකාවේ කෙටුම්පත් කර නොමැත. මහා මාර්ග ඉදිකිරීමේදී ශබ්ද පාලනය පිළිබඳව වෙනත් රටවල් විසින් ගත් ක්‍රියා පිළිවෙත් අධ්‍යනය කොට ස්ථාපිත කර ඇති දත්තයන් මත පිහිටා කාර්මික තාක්ෂණ ආයතනය විශේෂඥයින්හට කටයුතු කිරීමට සිදු විය. මාර්ග සංවර්ධන අධිකාරිය මගින් සපයන ලද දක්ෂිණ අධිවේගී මාර්ගයේ වාහන ගමනාගමනයේදී ඇතිවන ශබ්ද තත්වයන් පිළිබඳ ලබා ඇති අත්දැකීම් පාදක කර මෙම අධිවේගී මාර්ගයේ පැවතිය හැකි වාහන ගමනාගමනය අනුමාන කර ශබ්ද ප්‍රමාණය තීරණය කරන ලදී. කාර්මික තාක්ෂණ ආයතනය වෙතින් සපයන ලද උපදෙස් මත ඉදිකරන ලද ශබ්ද පරිවාරක ස්ථාපිත මාර්ගය දැනට භාවිතයේ පවතී.

මෙම උපදේශක සේවා ව්‍යාපෘතිය කාර්මික තාක්ෂණ ආයතනයේ පුරාවෘත්තයක් මෙන්ම ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග ඉදිකිරීමේ කරුණු ගණනාවක් හේතුවෙන් වැදගත් වේ. ශබ්ද පරිවාරක ඉදිකිරීමේදී IMMI ශබ්ද නිර්ණ ආකෘතිය ප්‍රථම වරට යොදා ගැනීම සේම මහා මාර්ගයක ශබ්ද පරිවාරක ප්‍රථම වරට ලංකාවේ ඉදිකිරීම ද ඊට ඇතුලත් වේ.

## ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය (NBRO) සඳහා ස්වයං ක්‍රියාකාරී වර්ෂාපතන මාන ඉදිකිරීම හා සපයීම

කෙටිකාල පරාසයක් තුලදී ඇතිවන අධික වර්ෂාපතනය නාය යාමට ප්‍රධාන හේතුවකි. නාය යාම් අවධානමට ලක්වන ප්‍රදේශ තුල ඇතිවන වර්ෂාපතන ප්‍රමාණයන් නිරීක්ෂණය එම ආපදාව වළකා හනීම සඳහා ඉතා වැදගත් වේ. ආපදා තත්වයන් සහිත කලාප තුලින් ජනතාව ඉවත් කිරීමේ තීරණ ගැනීමේදී කෙටි කාල පරාසයක් තුල ඇතිවන වර්ෂාපතන දත්තයන්ගේ සංඛ්‍යා ලේඛන විමර්ෂණය කල යුතුය.නාය යාම් නිරීක්ෂණය වැළකීම හා කළමනාකරණය සඳහා ශ්‍රී ලංකාවේ නියාමක ආතයනය NBRO ආයතනයයි.

# සුවිශේෂී නිපුණතා

කෙටි කාල සීමාවක් තුල පතිත වන වර්ෂාපතනයන් නිර්ණය කිරීමේ ක්‍රමවේදයක් කාර්මික තාක්ෂණ ආයතනය විසින් ස්වයං ක්‍රියාත්මක වර්ෂාපතන මානය නිර්මාණය කරන තුරු ශ්‍රී ලංකාවේ නොතිබුණි. මෙම උපකරණය වෙතින් ජනිත කරනු ලබන දත්ත වෙබ් ජාලය භාවිතව සෘජුව පිවිසුම සීමා කොට අදාල බලධාරී නිලධාරීන් වෙත බෙදා හරිනු ලබයි.

කෙටි කාල සීමාවක් තුලදී ඇදහැලෙන වර්ෂාපතන ප්‍රමාණයන් නිරීක්ෂණය කොට නාය යාම් පිලිබඳ පූර්ව ඇගයීමක් කිරීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනය මගින් නිෂ්පාදිත ස්වයංක්‍රීය වර්ෂාපතන මානය ඉතා යෝග්‍ය බව තීරණය කල NBRO ආයතනය මහනුවර, මාතලේ, කෑගල්ල, කුරුණෑගල, නුවරඑළිය, හා බදුල්ල ප්‍රදේශ තුල වර්ෂාපතන 35ක් සවිකර දෙන ලෙස ඉල්ලීමක් කරන ලදී.තවද මෙම ස්වයං ක්‍රියාකාරී වර්ෂාපතන මානයන් භාවිතය හා නඩත්තු කටයුතු ඉදිරි වසර 3 සඳහා කටයුතුද කාර්මික තාක්ෂණ ආයතනයට පවරන ලදී.

**පාරම්පරික ශ්‍රී ලාංකීය සහල් විශේෂ තුල සෙම් රෝග වැළැක්වීම හා ශරීරයේ මේද ප්‍රමාණය පහත හෙළීමට ඇති හැකියා විමර්ශනය කිරීම.**

ග්‍රාමීය අත් බෙහෙත් ලෙස මෙන්ම පාරම්පරික වෛද්‍ය ක්‍රමවේදයෙහි ශ්‍රී ලංකාවේ පාරම්පරිකව පවතනා සහල් විශේෂයක් තුල රෝග නිවාරණ හා සෞඛ්‍ය හිතකාමී ගුණාංග ඇති බැව් විශ්වාස කෙරේ. ඉන් සමහරක් තුල සෙම් රෝග වැළකීම මෙන්ම මේදය අවප්‍රමාණයක ශරීරය තුල පවත්වා ගැනීමට අවශ්‍ය ගුණාංග සහිත බව සඳහන් කල යුතුය. එසේ වුවද විද්‍යාත්මකව ග්‍රන්ථානරූඪව ඇති දත්තයන් මේ සඳහා ඉදිරිපත් කිරීමට අපොහොසත් බවක් ඇතිබව පිළිගත යුතුය. කාර්මික තාක්ෂණ ආයතනය ආයතනය මෙම අවශ්‍යතාවය පිරිමසමින් පාරම්පරික සහල් ප්‍රභේද 4ක් විශ්ලේෂණයට භාජනය කරමින් සුදු හීනටි ගොඩ හීනටි මසුරන් හා දික්වී සහල් විශේෂ පර්යේෂණ සඳහා යොදා ගන්න ලදී. පර්යේෂණයට ලක් කල සහල් විශේෂ තුල සෙම් රෝග වැළක්වීමේ හැකියාව විවිධාකාර යාන්ත්‍රණ විසින් සිදු කරන බවත් යම් ප්‍රමාණයකට මේද ප්‍රමාණ අවම තත්වයක තබා ගැනීමේ හැකිය පවත්නා බව පැහිදිලි වී ඇත. මේ පිළිබඳව නිශ්චිතව නිගමනය කිරීම සඳහා සෙම් රෝග වැළැක්වීම මෙන්ම මේද අවප්‍රමාණය කර ගැනීමේ හැකිය නිර්ණය කිරීම සඳහා පරීක්ෂණ හා පර්යේෂණ හා සංවර්ධන කටයුතු තව දුරටත් ක්‍රියාත්මකව පවතී. මෙහි අවසන් ප්‍රතිඵලය ලෙස නැවත නැවතත් පැන නගින ආසාදිත තත්වයන් අවම තත්වයක පවත්වා ගැනීමට මෙය පිටුවහලක් වනු ඇත.

# සුවිශේෂී නිපුණතා

## තිරිඟු සහ සහල් මිශ්‍ර කොට නිෂ්පාදිත බේකරි නිෂ්පාදිතයන්ගේ අඩංගු සහල් ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා මවුලික ක්‍රමවේදයක් ප්‍රවර්ධනය කිරීම

සෞඛ්‍ය හා පෝෂණීය තත්වය පිළිබඳව වඩ වඩා දැනුමක් මහා ජනතාව තමන් ගන්නා ආහාර පිළිබඳව වඩ වඩා සැලකිලිමත් වෙමින් පවතී. මේ හේතුවෙන් සහල් පිටි යොදා නිෂ්පාදිත පාන් සඳහා ජනප්‍රියත්වයක් පවතී. එසේ වුවද සහල් පිටි මිශ්‍රිත පාන් මෘදු බවින් අඩු ස්වභාවයක් පෙන්නුම් කරන හෙයින් සමහර බේකරි නිෂ්පාදකයින් අඩංගු සහල් ප්‍රතිශතය අවමව තබා ගැනීමට පෙළඹීමක් ඇත.

පොලිමරේස් දාම ප්‍රතික්‍රියව (PCR) භාවිත DNA නිස්සාරණ ක්‍රමවේදය යොදා ගනිමින් අඩංගු ද්‍රව්‍ය විශ්ලේෂණය කරන ලදී. සෝඩියම් ඩුඩෙකයිල් සල්ෆේට් පොලි ඇක්‍රලමයිඩ් ජෙල්විද්‍යුත් විභේදනය (SDS-PAGE) භාවිත කොට සහල් තුල පවත්නා විශේෂිත ප්‍රෝටීන් ප්‍රමාණය නිවැරදිව හඳුනා ගැනීමක් ප්‍රමාණාත්මකව ගණනය කිරීම මගින් අඩංගු සහල් පිටි ප්‍රතිශතය නිවැරදිව ප්‍රකාශ කල හැකි විය.

## ජාතික වශයෙන් වැදගත් කරුණු සඳහා කාර්මික තාක්ෂණ ආයතන දායකත්වය
## ආනයනික පිටිකිරි සමඟ DCD මිශ්‍ර වීම

වෙළඳ නාම කීපයකින් ඇති ආනයනික පිටිකිරි DCD සංයෝගයෙන් අපවිත්‍ර වී ඇතිබැව් 2013 වසරේ මුල් භාගයේදී වාර්තා විය. හරිත වායුන් හා නයිට්‍රජන්, තෘණ භූමි මතින් ක්ෂීරණය වීම අවම කිරීම සඳහා භාවිත කරන DCD සංයෝගය ජාල ප්‍රභවයන්ට එකතු වීම හා එම තණ කොළ හා ජලය ආහාර ලෙස ගත් ගවයන්ගේ කිරි තුලට මෙම සංයෝගය එක්ව ඇතැයි තහවුරු කර ඇත.DCD සංයෝගය මානව සෞඛ්‍ය වෙත බලපෑම් ඇතිකරන බවට සාධක නැතත් කිරි සමඟ වෙනත් කිසිඳු ද්‍රව්‍යයක් මිශ්‍රව තිබීම අනුමත කල නොහැකිය. තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි කාර්මික තාක්ෂණ ආයතනය DCD සයෝගය කිරිපිටි තුල අඩංගු වී ඇති විට එය වෙනකොට හඳුනාගැනීමටත්, ප්‍රමාණාත්මකව ගණනය කිරීමටත් අවශ්‍ය ක්‍රමවේදයක් ප්‍රවර්ධනය කර විවිධකිරිපිටි වර්ග විශ්ලේෂණය නොකඩවා සිදුකරන ලදී. අගෝස්තු මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කිරිපිටි සාම්පල 900කට වැඩි ගණනක් විශ්ලේෂණය කල අතර එම කටයුතු රජයේ උපදෙස් පරිදී දිගින් දිගටම සිදුකරන ලදී.

# සුවිශේෂී නිපුණතා

## රතුපස්වල ප්‍රදේශයේ ළිං ජලයේ ප්‍රමිතීන් අධ්‍යයනය

ගම්පහ දිස්ත්‍රික් ලේකම්තුමාගේ ඉල්ලීමකට අනුව රතුපස් වල ප්‍රදේශයේ ළිං ජලයේ pH අගයේ අවප්‍රමාණය වීම හා අවට පිහිටි රබර් අත්වැසුම් කර්මාන්තයේත් නිකුතු අප ජලය අතර කිසියම් සම්බන්ධයක් තිබේදැයි කාර්මික තාක්ෂණ ආයතනය මගින් අධ්‍යනයක් සිදුකරන ලදී. කාර්මික තාක්ෂණ ආයතනයේ රසායන හා ක්ෂුද්‍ර ජීවී රසායනාගාරයේදී සවිස්තරාත්මකව විශ්ලේෂණයක් සිදුකරමින් තාක්ෂණික උපදෙස් සහිත වාර්තාවක් රජය වෙත ඉදිරිපත් කරමින් ගැටලුව නිරාකරණය කර ගැනීමට සහය විය.

## වල්ල්පට්ට නිවැරදිව හඳුනාගැනීම

ශ්‍රී ලංකාවට අවේනික වූ ලාංකික වල්ල්පට්ට් ශාකය ඉතා ඉහළ තත්වයේ සුවඳ විලවුන් නිෂ්පාදනය සඳහා ලෝක වෙළඳපලෙහි ඉතා අධික මිලක ඉල්ලුමක් සහිත ශාකයකි. මෙය ලංකාවට ආවේනික ශාකයක් වන හෙයින් එම දැව කොටස් වෙළදාම හෝ ප්‍රවාහනය සම්බන්දයෙන් දැඩි නීතිරීති පනවා ඇත. වල්ල්පට්ට් ශාක හෝ කඳන් කොටස් වෙනත් රට වලට හෝ රහසින් ආනයනය කිරීම වැළැක්වීම සඳහා මෙම ශාක නිවැරදිව හඳුනා ගැනීම සඳහා අවශ්‍ය දත්ත මෙන්ම ශාකය නිස්සාරණය කොට නිෂ්පාදිත රෙසින නිවැරදිව හඳුනා ගැනීම දැඩි අවශ්‍යතාවයක්ව පැවතිණි. GC/MS තාක්ෂනය භාරකොට වල්ල්පට්ට් හා එම රෙසින හඳුනා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයක් කාර්මික තාක්ෂණ ආයතනයේ ශාකසාර තාක්ෂණ අංශය මගින් ප්‍රවර්ධනය කර ඇත.ශාක භාවිත කර ලබා ගන්නා වාෂ්පශීලී තෙල් මෙන්ම රෙසින විශ්ලේෂණයට භාජනය කොට එහි පවත්නා ගති ලක්ෂණ නිවැරදිව නිර්ණය කිරීම සිදුකරන ලදී. දැනට මෙම ක්‍රමවේදය ශ්‍රී ලංකාවේ නියාමක ආයතන මගින් භාවිතයට යොදා ගනිමින් නිවැරදි ලෙස ශාක කොටස් හඳුනා ගැනීම සිදු කරයි.

## තාක්ෂණ හුවමාරු

## ස්වයංක්‍රීය වර්ෂාපතන මාන

කෙටි කාල පරාසයක් තුල පවතින අධික වර්ෂාව නාය යාම ඇති වීමට සාමාන්‍යයෙන් හේතුකාරක ප්‍රධාන සාධකයකි.ආපදා කළමනාකරණයේදී යථානුරූපීව වර්ෂාපතනය මැන දැන ගැනීම වලකුම් ක්‍රියාමාර්ග සඳහා තීරණ ගැනීමේදී වැදගත් සාධකයක්ව පවතී. කාර්මික තාක්ෂණ ආයතනය මගින් නිෂ්පාදිත ස්වයංක්‍රිය වර්ෂාපතන මානය අංකිත දුරකථන තාක්ෂණ ක්‍රමවේදය භාවිතයට ගනිමින් නිවැරදිව හා ක්ෂණිකව වර්ෂාපතන ප්‍රමාණ දත්ත හුවමාරු සඳහා භාවිත කෙරේ.

# සුවිශේෂී නිපුණතා

2007 වසරේදී ස්වයංක්‍රිය වර්ෂාපතන මාන නිෂ්පාදනය ආරම්භ කරන ලදී. එතැන් සිට නිරන්තර ප්‍රවර්ධන කටයුතු ක්ෂේත්‍ර අධ්‍යනයන් සමග සිදුකොට එහි විශ්වසනීයත්වය හා නිවැරදි බව තහවුරු කර උපකරණ තව දුරටත් සංවර්ධනය කෙරිණි.

අංග සම්පූර්ණ ස්වයංක්‍රිය වර්ෂාපතන මාන නිෂ්පාදන තාක්ෂණ සිවිකොන් ඉංජිනියරින් පුද්ගලික සමාගම වෙත පවරා දෙන ලද්දේ අයිතිය පදනම් සහිතව 2013 දීය. ක්‍රියාකාරීත්වයේ විශිෂ්ඨත්වය නොසැලී පවත්වා ගැනීම සඳහා තත්ත්ව පාලන කටයුතු හා ක්‍රමාංකන කටයුතු නිරන්තරව සිදු කරමින් පවතී.

## පළතුරු හා එළවලු ආශ්‍රිත කෘමි උවදුරු වළකාලීම සඳහා (Bt) බැසිලස්

ඩෙංගු මදුරුවන් පාලනය සඳහා බැසිලස් තුරෙන්ජිනේසිස් Bt බැක්ටීරියාව සමත් බව සාමාන්‍යයෙන් ජනතාව දැන සිටින කරුණකි. දේශීය බැසිලස් විශේෂයක් (බැසිලස් තුරෙන්ජිනේසිස් අතුරු විශේෂයක් වන කුර්ස්ටක් Btk) භාවිතයට ගනිමින් කෘමීන්ගේ පළතුරු හා එළවලු වෙත සිදුකෙරෙන හානිය වැලැක්වීම සඳහා පාලන ක්‍රමයක් ලෙස යොදාගත හැකි බව පැහැදිලි වී ඇත.

පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ප්‍රතිපාදන බයෝ පවර්ලංකා පුද්ගලික සමාගම විසින් සැපයීමෙන් අනතුරුව ප්‍රවර්ධනය කරන ලද තාක්ෂණ ක්‍රමවේදය හා *Bt* මව් බැක්ටීරියාව ප්‍රචාරණය කර ගැනීම සඳහා අවශ්‍ය මාධ්‍ය සමග වාණිජ නිෂ්පාදනය සඳහාඉහත සමාගම වෙත පවරා දෙන ලදී.

## කාර්මික තාක්ෂණ ආයතනය වෙතින් හුවමාරු කරන ලද වෙනත් තාක්ෂණයන්

- දේශීය සහල් විශේෂ යෙදූ ක්ෂණික ආහාර
- කරපිංචා බීම විශේෂයක්
- ප්‍රවර්ධනය කල කෝමාරිකා බීම වර්ග.
- නැවුම් පොල් තෙල් (වර්ජින්) නිෂ්පාදනය සඳහා නව තාක්ෂණ ක්‍රමවේදයක්
- අලිගැටපේර තෙල් නිස්සාරණය
- කෝන්සිරප් (බඩ ඉරිඟු සිරප්) නිෂ්පාදනය
- සම්භාහන කටයුතු සඳහා ඖෂධීය තෙල් වර්ග මිශ්‍රණ
- රැවුල් බෑමෙන් පසු (Aftershave) ගැල්වීම සඳහා ඖෂධීය දියරයක්
- මදුරු විකර්ෂණය සඳහා පාරම්පරික වට්ටෝරුවක නිෂ්පාදිත වාෂ්පශීලී දියරයක්

# සුවිශේෂී නිපුණතා

## හුවමාරුව සඳහා සූදානම් තාක්ෂණ

## මුරුංගා ඔලෙයිෆෙරා තේ හා වියපත් බව සඟවන ආලේපන

මුරුංගා පත්‍ර භාවිත කොට ඖෂධීය තේ හා වියපත් බව සඟවන ආලේපන ඖෂධ තාක්ෂණ අංශය මගින් ප්‍රවර්ධනය කරන ලදී.මුරුංගා පත්‍ර තුල ප්‍රතිලයිපේස, ප්‍රති කොලොස්ටරෝල් හා ප්‍රති ග්ලයිකෝෂණ හැකියාවක් සහිතය.නිෂ්පාදිත තේ හා ආලේපන තුල ඉහත සඳහන් ක්‍රියාකාරීත්වය සාර්ථකව පවතින හෙයින් වියපත් බව සැඟවීම සඳහා භාවිත කල හැක.මොරින්ගා තේ හා "මොරින්ගා ඇන්ටි ඒජින්" ආලේපන නිෂ්පාදනය හුවමාරු සඳහා සූදානම් කොට ඇත.

## කරපිංචා රසකාර නිස්සාරණ ක්‍රමවේදයක්

ස්භාවික කරපිංචා රසය උකහා ගැනීම සඳහා නිස්සාරණ ක්‍රමවේදයක් ප්‍රවර්ධනය කර ඇති අතර එය සලාද හා වෙනත් ඉවුම් පිහුම් සඳහාද භාවිත කල හැක. මෙහිදී අධික උෂ්ණත්වයක් භාවිතයට නොයෙදීම හේතුවෙන් ස්වභාවික රසයෙහි ගුණාංග නොනැසී පවතී.

## ස්වභාවික මිනිරන් පවිත්‍ර කිරීමේ ක්‍රමවේදයක්

පවිත්‍ර මිනිරන් සඳහා අධික වටිනාකමක් පැවතියද ශ්‍රී ලංකාවේ ස්වභාවික මිනිරන් ඉතා අඩු මිලකට අපනයනය කරයි.මෙතෙක් කල් ශ්‍රී ලංකාවට මිනිරන් පවිත්‍ර කිරීමේ තාක්ෂණ ක්‍රමවේදයක් නොතිබුනු අතර දැන් කාර්මික තාක්ෂණ ආයතනය එම ක්‍රමවේදය සාර්ථක ප්‍රතිඵලදායි අයුරින් ප්‍රවර්ධනය කොට 99.9% පවිත්‍රතාවය සහිත මිනිරන් නිෂ්පාදය කිරීමේ හැකියාව සතු කරගෙන ඇත. මෙම තාක්ෂණය තුලින් අගය වැඩි කල මිනිරන් නිෂ්පාදය කිරීමට හැකියාව ඇති අතර එමගින් විදේශ විනිමය සැහෙන පමණකින් රට තුලට ගෙන ඒමට හැක.

## නිෂ්පාදන එළි දැක්වීම

2013 වසරේදී කාර්මික තාක්ෂණ ආයතනය විසින් නිෂ්පාදන 2ක් බෝතල් තුල තැඹිලි වතුර හා ඔමේග 3 බිත්තර එළි දක්වන ලදී.

## බෝතල් තුල තැඹිලි

ට්‍රොපික් ෆුර්ට්පුද්ගලික සමාගම, කොළඹ 06, මගින්කල ඉල්ලීමකට අනුව තැඹිලි වතුර බෝතල් නිෂ්පාදන තාක්ෂණ ක්‍රමවේදය හා කර්මාන්ත ශාලාව නිර්මාණය හා ඉදි කිරීම් කටයුතු කාර්මික තාක්ෂණ ආයතනයීය විද්‍යාඥයින් විසින් සිදුකර දෙන ලදී. මෙම නිෂ්පාදන අපනයන වෙළඳපල ඉලක්ක කොට සිදු කෙරෙන්නකි.

# ගුණාත්මක යටිතල පහසුකම්

රටෙහි පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලින් ප්‍රමුඛ තම ආයතනය වන කාර්මික තාක්ෂණ ආයතනය ගුණාත්මක තාක්ෂණ සේවා සැපයීමේ කාර්යභාරයේදී පූර්ණ කැපවීමෙන් එම කටයුතු ඉටු කිරීමට බැඳී සිටී.

කාර්මික තාක්ෂණ ආයතනයේ තත්ත්ව ආරක්ෂණ දෙපාර්තමේන්තුව (QAD) ආයතනය හිමිකරගෙන ඇති උසස් ස්ථානය රැක ගැනීම තම ප්‍රමුඛ වගකීම ලෙස සලකන අතර 2004 සැප්තැම්බර් මාසයේ සිට ආයතනය සපයන සේවා හා නිෂ්පාදනයන්ගේ තත්වය නොනැසී පවත්වා ගැනීම සඳහා කටයුතු කරයි. මෙම ඒකකය ස්වීඩනයේ ප්‍රතීතක මණ්ඩලය (SWEDEC) හා ශ්‍රී ලංකා ප්‍රතීතක මණ්ඩලය (SLAB) සාමාර්ථතා හා ඇගයීම් ආයතනය සමග නිරන්තර සම්බන්ධතා පවත්වමින් කටයුතු කරයි. මෙම ආයතන ද්විත්වය සමග ආයතනය කාර්මික තාක්ෂණ ආයතනයේ රසායනාගාර සඳහා ප්‍රතීතක තත්වය ආරක්ෂා කර ගැනීම සඳහා මෙම සංවිධාන සමග එක්ව කටයුතු කිරීම වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

දැනට කාර්මික තාක්ෂණ ආයතනයයේ රසායනාගාර 4ක් එනම් රසායන ක්‍ෂුද්‍ර ජීවි මිනුම් හා ද්‍රව්‍ය රසායනාගාර ස්වීඩන් ප්‍රතීතක හා සාමාර්ථතා ඇගයීම් මණ්ඩලය (SWEDEC) මගින් ISO 17025- 2005 ගුණත්ව කළමනාකරණ පද්ධතියට එකඟ ප්‍රමිතියට වසර 2004 සිට ප්‍රමිතිගත කොට ඇත. රසායන විද්‍යා ක්‍ෂුද්‍ර ජීවි, ද්‍රව්‍ය හා විද්‍යුත් තාක්ෂණ පරීක්ෂණ රසායනාගාර ශ්‍රී ලංකා ප්‍රතීතක මණ්ඩලය (SLAB) වෙතින් 2006 සිට ප්‍රතීතකරණය කර ඇත.

තවද කාර්මික තාක්ෂණ ආයතනය එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය (UNIDO) මගින් අන්තර්ජාතිකව පිළිගත් කලාපීය පුහුණු මධ්‍යස්ථානයක් ලෙස පිළිගෙන ඇති අතර මේ වසර තුල පකිස්තානු විද්‍යාඥයින් 7දෙනෙකු UNIDO සංවිධානයේ ඉල්ලීම පරිදි පුහුණු කොට ඇත.

රසායනාගාර සැලසුම් කිරීම් හා ISO 17025, 15189, 22000, 9001 හා GLP උපදේශක සේවා QAD පදනම මත සපයන ලදී. තාක්ෂණ විගනයන් හා සාමාර්ථතා පරීක්ෂණ සේවා ආයතනය තුල ක්‍රියාත්මක කිරීමද ඒකකය මගින් සිදු කරන ලදී. සැලසුම් ගත පුහුණු වැඩසටහන්, අවිනිශ්චිතතාව හා පරීක්ෂණ ක්‍රම වලංගුතා හා තත්ව කළමනාකරණ පුහුණු වැඩසටහන් දේශීය මෙන්ම විදේශීය ආයතන සඳහාද වසර තුල සිදු කරන ලදී.

# ISO 17025 ගුණාත්ම පද්ධති සඳහා SLAB හා SWEDEC ප්‍රතීතකරණයන්

රටෙහි ඇති ප්‍රමුඛතම පර්යේෂණ හා සංවර්ධන ආයතන ලෙස කාර්මික තාක්ෂණ ආයතනය කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා ගුණාත්මක තාක්ෂණ සේවා රැසක් සැපයීමේ කාර්යභාරය වෙනුවෙන් පූර්ණ කැපවීමෙන් කටයුතු කරයි.

# ගුණාත්මක යටිතල පහසුකම්

## රසායනාගාර හා ක්ෂුද්‍ර ජීවි විද්‍යා රසායනාගාර සඳහා ප්‍රතීතකරණය

ස්වීඩන් ප්‍රතීතකරණ හා සාමාර්ථතා ඇගයීමේ මණ්ඩලය වෙතින් ISO/IEC/17025 : 2005 ප්‍රමිතියට අනුකූලව ලද පරීක්ෂාවන් සඳහා ලද ප්‍රතීතක තත්වය රසායන හා ක්ෂුද්‍ර ජීවි රසායනාගාර විසින් නොසැලී පවත්වාගෙන යයි. ප්‍රතීතකරණ තත්වය පුළුල් කරමින් සාමාර්ථතා ඇගයීමේ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB) විසින් පසුගිය වසර 6 තුල රසායනාගාර සඳහා සේවා සැපයීමට අවස්ථාව උදාකර දුනි. ජාතික මෙන්ම අන්තර්ජාතික ප්‍රතීතක තත්වය සහිතව සියයකට වැඩි ප්‍රමිතීන් ආවරණය කර ඇත.

## කාර්මික ක්‍රමාංකණ රසායනාගාරයේ ප්‍රතීතකරණ තත්වය

ශ්‍රී ලංකාවේ ඇති ක්‍රමාංකනය සඳහා ප්‍රතීතක එකම රසායනාගාරය කාර්මික තාක්ෂණ ආයතනයේ ක්‍රමාංකණ රසායනගාරයයි. එය SI ඒකක අනුගතව සියලුම භෞතික මිණුම් සිදු කරයි. කාර්මික තාක්ෂණ ආයතනයේ ක්‍රමාංකන රසායනාගාරය උෂ්ණත්වය පරිමාව, භාර, විද්‍යුත් ක්‍රමාංකනය හා මාන සඳහා ප්‍රතීතකරණය කර ඇත.

## ද්‍රව්‍ය රසායනාගාරයේ ප්‍රතීතක තත්වය

රබර් හා පිඟන් භාණ්ඩ පරීක්ෂණ සේවා පැවැත්වීමට ද්‍රව්‍ය තාක්ෂණ රසායනාගාරය ප්‍රතීතකත්වය ලබා ඇත.

## විද්‍යුත් තාක්ෂණ රසායනාගාරයේ ප්‍රතීතක තත්වය

ශබ්ද හා කම්පන ප්‍රමාණ මිණුම් සඳහා ශ්‍රී ලංකාවේදී ප්‍රථම වරට ප්‍රතීතක තත්වය හිමිකර ගත් රසායනාගාරය ලෙස කාර්මික තාක්ෂණ ආයතනයේ විද්‍යුත් තාක්ෂණ රසායනාගාරය නම් කල හැක.

## කාර්මික තාක්ෂණ ආයතනයීය පර්යේෂණ හා සංවර්ධන රසායනාගාර හා තොරතුරු සේවා මධ්‍යස්ථානයේ ISO 9001:2008 සහතික හිමිකම්

කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා අවශ්‍යතොරතුරු සැපයීමේ කර්තව්‍යය මෙන්ම පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා සේවා සැපයීමේදී කාර්මික තාක්ෂණ ආයතනය තම කාර්යභාරය පූර්ණ කැපවීමෙන් ඉටු කිරීමට බැඳී සිටි. එම කටයුතු සඳහා ඉදිරිපත් වීමේදී ISO 9001-2008 සහතිකලාභී තත්වය මැනවින් ආරක්ෂා කරගනිමින් ආහාර තාක්ෂණ, ඖෂධ තාක්ෂණ, පාරිසරික තාක්ෂණ, ද්‍රව්‍ය තාක්ෂණ රසායනාගාර හා තොරතුරු සේවා මධ්‍යස්ථානය (ISC) යන අංශ ISO 9001-2008 පද්ධතිය තුල දැනට කටයුතු මෙහෙයවමින් සිටි. මෙම සහතිකලාභී තත්වය පසුගිය 6 වසර තුල නොනැසී පවත්වාගෙන ඇත.

# ගුණාත්මක යටිතල පහසුකම්

## ලිපිගොනු සකස් කිරීම හා පුහුණු වැඩසටහන්

අංශභාර තත්ත්ව පාලන නියෝජිතවරුන් සඳහා ISO 9008- 2008 තත්ත්ව කළමනාකරණ පද්ධති පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරමින් මෙන්ම නව තත්ත්ව කළමනාකරණ නිලධාරීන් පත් කිරීමේදී ඇති වියහැකි දුර්වලතා මගහරවමින් නොසැලෙන ප්‍රවර්ධනයක් සහිතව කටයුතු මෙහෙයවමින් සිටි. මෙම පුහුණු වැඩසටහන් මෙහෙය වීමේදී අභ්‍යන්තර විගණන නිලධාරීන් විසින් ඉදිරිපත් කෙරෙන අනුකූලතා මගහරවා ගන්නා ආකාරය පිලිබඳ තත්ව කළමනාකරණ නිලධාරීන් දැනුවත් කිරීමද සිදුකෙරේ. තත්ව ආරක්ෂණ දෙපාර්තමේන්තුව වෙතින් ඉදිරිපත් කෙරෙන තත්ව ආකෘතීන් තව දුරටත් ප්‍රවර්ධනය කරමින් තත්ව කළමනාකරණ නිලධාරීන් තම අංශ සංවර්ධන ක්‍රියා ඉටු කරමින් දායකත්වය ලබාදේ.

## අභ්‍යන්තර විගණන

තත්ත්ව කළමනාකරණ පද්ධති යහපත් අයුරින් පවත්වාගෙන යාම සඳහා 2013 වසර තුලදී QAD අංශය මගින් අභ්‍යන්තර විගණන 6 ක් පවත්වන ලදී. ඒ අතර තත්ව කළමනාකරණ පද්ධති, කළමනාකරණ වගකීම්, සම්පත් කළමනාකරණය, සේවායථානුරූපව පවත්වාගෙන යාම විකුණුම් විශ්ලේෂණ හා ප්‍රවර්ධන හා තිරස් විගණන කටයුතු ඇතුලත්ය. අංශ කාර්ය මණ්ඩලය මගින් ඉදිරිපත් කරන ලද අනනුකූලතා නිවැරදි කොට අභ්‍යන්තර විගණන තුලදී මතු වූ අඩුපාඩු නිවැරදි කොට සාර්ථකව සමතයකට පත්කරන ලදී. ආයතනයිය තත්ව කළමනාකරණ කටයුතු ISO 9001- 2008 හා ISO 17025- 2005 පද්ධති හා එකඟව පවත්වාගෙන යාමේදී අංශ කීපයක නිලධාරීන්ගේ සහයෝගය සහිතව අභ්‍යන්තර විගණන, විගණක ප්‍රධානීන්, විගණක නිලධාරීන් හා නිරීක්ෂකයින්ගේ පූර්ණ සහභාගීත්වය සහිතව ඉටු කරන ලදී.

# අධිවේගී කර්මාන්ත තාක්ෂණ ප්‍රවර්ධනය

වෙළඳපල ඇති භාණ්ඩයන්ගේ තත්වය තරඟකාරී ලෙස ඉහළ නංවමින් අවශ්‍ය සංවර්ධන හා පර්යේෂණ සේවා ඉටු කිරීමෙන් කර්මාන්තකරුවන් සඳහා කාර්මික තාක්ෂණ ආයතනය නිරන්තරව කටයුතු කරන ලදී. කාර්මික තාක්ෂණ ආයතනයීය විද්‍යාඥයින් ආහාර, ඖෂධ, ද්‍රව්‍ය හා රසායන විද්‍යා ක්ෂේත්‍රමූලිකව උපදේශන සේවා,කොන්ත්‍රාත්තු පදනම් වැඩි ඉල්ලු සහිත පර්යේෂණ තුල වැඩි වශයෙන් ක්‍රියාත්මක කෙරිණ. වසර තුල ඉටුකරන ලද වැදගත් සේවාවන් පහත ඡේදයන් තුල සංක්ෂිප්ත ලෙස පැහැදිලිකොට ඇත.

## පළතුරු හා එළවලු යුෂ අගය වැඩි නිෂ්පාදන ලෙස ඉදිරිපත් කිරීම සඳහා පථක පෙරහන හා සැකසුම් ආකෘති

පාරඅන්ධ අඳශ්‍යා නොපැහැදිලි පෙනුම වෙළඳපල බොහෝ බීම වර්ග තුල දක්නට ඇති දුර්වලතාවයක් වන අතර එය ඉල්ලුම කෙරෙහි බලපෑම් ඇති කරයි. පථක පෙරහණ තාක්ෂණය භාවිත කොට අන්නාසි ,පැපොල්හා බීට් රූට් යුෂ පැහැදිලිව පෝෂණ ගුණය අවශ්‍ය ප්‍රමාණයට ඇතිව සාර්ථක අයුරින් නිෂ්පාදනය කල හැක. කෙසේ වෙතත් විශාල ප්‍රමාණයේ අණු බෙදුණු කුඩා කොටස් සහිත අණු ලෙස පෙරහණ තුලින් ගමන් කරවීමෙන් සිදු කිරීම් තුලින් ප්‍රතිඔක්සිකාරක හා ජෛව ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය කල හැකි බව පෙනී ගොස් ඇත. ජරීමට පෙර එන්සයිම මගින් ජාල විච්චේදනය සිදු කිරීම මගින් ජෛව ක්‍රියාකාරී සංයෝග වර්ධනය කිරීමට හැකි බව රසායනාගාර පරීක්ෂණ මගින් පෙනී ගොස් ඇත. න්‍යායාත්මකව අරමුණු ද පෙරහණ ක්‍රියාවලියේදී සැලකිල්ලට ගනිමින් නිත්‍ය ආකෘතික මොඩලයෙන්ද ස්ථාපිත කරන ලදී.

## හෙලිකොබැක්ටර් පයිලෝරි ආසාදනයට අතිරේක ප්‍රතිකාරයක් ලෙස සජීවන ආහාර වට්ටෝරුවක්

හෙලිකොබැක්ටර් පයිලෝරි ආසාදනයට එරෙහිව භාවිත කරන ප්‍රතිජීවක ඖෂධ වෙනුවට ක්‍රියාකාරී සහජීවක ආහාර වට්ටෝරුවක් ප්‍රතිකාර ලෙස පිළියෙළ කරන ලදී. ග්‍රන්ථ ආශ්‍රිත ලිපිගොනු අධ්‍යනය රෝපණ මාධ්‍ය නඩත්තු කටයුතු විවිධ ලක්ටික් අම්ල බැක්ටීරියා සතු හෙලිකොබැක්ටර් පයිලෝරි මර්දන හැකියා අධ්‍යනය කරන ලදී. ඉන්පසු විවිධ අමුද්‍රව්‍ය හා පාරම්පරික සහල් විශේෂ පැසවීමේදී එහි අවග්ල්යිසිමක අගයක් හා අධි තන්තු ප්‍රමාණයක් සහිත බව සොයා ගන්න ලදී. පසුව ක්ෂුද්‍රජීවීන් එනම් පෙසියොකොකස් කොකුරියා හා සැකරියෙන්මයිසිස් පැසවීම් ක්‍රියාවලියේදී උත්පාදනය වන බවත් එහි සහජීවක ගුණය පවත්නා බවත් හෙළිදරව් විය.

# අධිවේගී කර්මාන්ත තාක්ෂණ ප්‍රවර්ධනය

## ප්‍රතිඔක්සිකාරක ගුණයෙන් පෝෂිත සහල් නිවුඩ්ඩ සහිත ස්නැක්ස්

ප්‍රතිඔක්සිකාරකයින්ගෙන් පෝෂිත සහල් නිවුඩු ශ්‍රී ලංකාවේ භාවිතය සුළු වශයෙනි. ව්‍යාපෘතියේ අරමුණ සහල් නිවුඩු භාවිතා කොට ප්‍රතිඔක්සිකරණ හැකියා ප්‍රවර්ධනය කල බිස්කට් වැනි ස්නැක්ස් ආහාර නිෂ්පාදනය කිරීමයි. සහල් නිවුඩ්ඩ සහිත ආහාර නිෂ්පාදනයේදී පවත්නා ප්‍රධාන බාධකය වන්නේ ලයිපේස් එන්සයිම ක්‍රියාකාරිත්වය හේතුකොටගෙන දින 2 ක පමණ කාලයකදී ඇතිවන මුඩු බාවයයි. මෙම මුඩු බව වළක්වා ගනිමින් සහල් නිවුඩු සක්‍රිය ලෙස භාවිතා කිරීමේ ක්‍රමවේදයක් රසායනාගාරය තුල ප්‍රවර්ධනය කොට සුරැකිව දීර්ඝ කාලයක් ගබඩා කර තැබීමේ අධ්‍යන කටයුතු සිදුකරමින් පවතී.

## දැව භාවිත ඇසුරුම් ප්‍රවාහන තට්ටු මත ඇතිවන පුස් පාලනය කිරීම

ලොඩ්ස්ටාර් සමාගම ප්‍රමුඛ පෙළේ ටයර් නිෂ්පාදන හා අපනයන සමාගමකි. ටයර් අපනයන කිරීමේදී භාවිතයට ගනු ලබන දැව යොදා නිෂ්පාදිත ඇසුරුම් ප්‍රවාහන තට්ටු පුස්කමෙන් වළක්වා ගැනීමට අවශ්‍ය ප්‍රතිකාරක සහිතව නිෂ්පාදනය කලත් එය මගහරවා ගැනීමට අපොහොසත් වී ඇත. අපනයනයේදී මෙය සමාගමටමහත් ගැටළුවක්වඇති බැවින් සමාගම කාර්මික තාක්ෂණ ආයතනය වෙත ඉල්ලීමක් කල අතර කාර්මික තාක්ෂණ ආයතනය මගින් පුස් මගින් ඇතිවන අසාදන තත්වය මග හරවා ගැනීමට අවශ්‍ය තාක්ෂණික ක්‍රියාමාර්ගය සමාගම වෙත තාක්ෂණ පැවරුම් අයිතිය රහිතව ඉදිරිපත් කරන ලදී.

## දැඩි ටයර් (Solid tyre) ඉරි තැලීමෙන් පිපිරීම

දැඩි ටයර් නිෂ්පාදනයේදී කළු කුඩු යොදමින් සිදුකරන ක්‍රියාවලිය අතරතුර ටයරය පිපිරී දියරයක් ගලායාම ප්‍රධානපෙළේ දැඩි ටයර් නිෂ්පාදකයෙකු විසින් හඳුනාගන්නා ලදී. කාර්මික තාක්ෂණ ආයතනයේ ද්‍රව්‍ය රසායන විද්‍යාඥයින් විසින් මෙයට බලපාන හේතු කාරක අධ්‍යනය කොට ගැටළුවට පිළියම් යොදන ලදී.

## සිමෙන්ති සමග දැවීමට භාජනය වූ ඛණිජ මිශ්‍ර කිරීමේදී පවත්වාගතයුතු වැදගත් සාධක හඳුනාගැනීම -

බලශක්ති උත්පාදන යන්ත්‍ර තුල අපද්‍රව්‍යයක් ලෙස දැවී ගිය ඛණිජ හෝ අනියතික සිලිකාප්‍රතික්‍රියක අපද්‍රව්‍යක් ලෙස බැහැර කරයි. මෙම ද්‍රව්‍ය පොර්ට්ලන්ඩ් සිමෙන්ති සමග මිශ්‍ර කිරීමෙන් හයිද්‍රෝලිකසිමෙන්ති මිශ්‍රණ නිෂ්පාදනය කරයි.

## අධිවේගී කර්මාන්ත තාක්ෂණ ප්‍රවර්ධනය

නොරොච්චෝලෙහි තාප බලාගාරයේ උත්පාදනය වන මෙම විසිරුනු අළු, අමුද්‍රව්‍යයක් ලෙස භාවිතයට ගෙන සිමෙන්ති නිෂ්පාදනය කිරීමේ හැකියාව විමර්ශනයට ලක්කරන ලෙස සිමෙන්ති තොග වශයෙන්ආනයන කරන සමාගමක් කාර්මික තාක්ෂණ ආයතනයෙන් සහාය පැතීය. ද්‍රව්‍ය තාක්ෂණ රසායනාගාරය මෙය ව්‍යාපෘතියක් ලෙස අධ්‍යයනය කර දුමර අළු සිමෙන්ති සමග මිශ්‍ර කලයුතු ආකාරය සේවාලාභියා වෙත සපයන ලදී.

### චර්ම රෝග සඳහා නිර්දේශිත නිස්සාරක කෂායක පවත්නා ප්‍රතික්ෂුද්‍රජීවීමය හා ශාඛ රසායනික ගුණාංග විශ්ලේෂණය

සිද්ධ ඉන්දියාවේ සිට පැමිණි පෞරාණිකවෛද්‍ය ක්‍රමයකි. කෙසේවෙතත් මෙය ශ්‍රී ලංකාවේද වෙනත් පාරම්පරික වෛද්‍ය ක්‍රම සමග භාවිතයට ගැනේ.පාරන්කිපද්දෙයි කුදීනර් නමින් ඇති කෂාය චර්ම රෝග සඳහා නිර්දේශ කෙරෙන අතර වට්ටෝරුව තුල ශාඛ 12 කින් ලබාගන්නා ශඛමය කොටස් 13 කින් යුක්තවේ. මෙය වෙනකොට ගත් රෝගකාරකයන්ට එරෙහිව සායනික පරීක්ෂාවට ලක් කෙරින. මෙහිදී භාවිතයට ගත ශාඛ 12 කින් 5 ක් පමණක් රෝග කාරකයට එරෙහිව ක්‍රියාකාරී බව දක්නට හැකි විය. රසායනාගාර පරීක්ෂණ අවසන්කොට චර්ම රෝග සඳහා භාවිතයට යොදා ගතහැකි තෙල් වර්ගයක් හා ක්‍රීම් නිෂ්පාදන කටයුතු සිදු කරමින් පවතී.

### ස්වේත ග්‍රැනයිට් මත ඇතිවන මල පැල්ලම් ඉවත් කිරීම

ග්‍රැනයිට් නිෂ්පාදකයින් මුහුණ දෙන බරපතල ගැටළුවක් ලෙස ඒ මත ඇතිවන කහ පැහැති මල පැල්ලම් ගැටළුකාරී තත්වයක් උද්ගතකර ඇත. ඊට හේතුවන කරුණු ද්‍රව්‍ය රසායනාගාරයේදී හඳුනාගනිමින් පැල්ලම් ඉවත්කොට නැවත මතුනොවීමට යොදාගතහැකි ද්‍රාවණයක් නිෂ්පාදනය කර ඇත.

# තරගකාරිත්වයේ අනභිභාවනීයත්වය

## තාප ශක්ති විගණන

## තාක්ෂණික අනභිභවනීයත්වය සහිත පිගන් භාණ්ඩ මධ්‍යස්ථානය (CENTEC)

ශ්‍රී ලාංකීය පිගන් භාණ්ඩ කර්මාන්ත ක්ෂේත්‍රයේ වැඩි දියුණුව හා තරගකාරී ස්වභාවය ප්‍රවර්ධනය සඳහා කාර්මික තාක්ෂණ ආයතනය අතහිත දෙමින් සිටී. ප්‍රධාන පෙලේ පිගන් භාණ්ඩ නිෂ්පදනායතනයක තාප ශක්ති විගණනය කිරීම සඳහා ආයතනය උපදේශක සේවා සපයයි. උග්‍රවෙමින් පවත්නා බලශක්ති අර්බුදය හේතුවෙන් තාප බල භාවිත කර්මාන්ත ක්ෂේත්‍රයේ වර්ධනයට බලපෑම් සිදු කරමින් ඇත. එබැවින් මෙම ක්ෂේත්‍රයේ ප්‍රගමනය උදෙසා කාර්ය සාධනය සිදුකළ යුතුව ඇත. පිගන් භාණ්ඩ නිෂ්පාදනායතනයන්හි උඳුන් පිළිබඳව නිරීක්ෂණය කිරීමෙන් පසු ලංකා වෝල්ටයිල්ස් සමාගම තාප ශක්ති විගණනය සඳහා තෝරා ගන්නා ලදී. බලශක්ති සුරැකුම් විධි ගණනාවක් එනම් උඳුන් භාවිතයේදී ආර්ථිකමය වශයෙන් හානිදායක මෙන්ම කාබන් පා සටහන් අවම කරමින් පිගන් භාණ්ඩ නිෂ්පාදනයේදී තාප ශක්තිය පවත්වා ගතයුතු ආකාරය පෙන්වා දුන් අතර එම කටයුතු දැනට භාවිතයට යොදාගනිමින් කටයුතු මෙහෙයවමින් සිටී.

## සෞඛ්‍ය සේවා සැපයීමේදී ජනිත වන කසල කළමනාකරණ පද්ධතීන්ගේ ශක්‍යතා අධ්‍යනය

පිළිකා රෝගීන්ගේ රෝග නිධාන සොයා බලමින් ඔවුනට ප්‍රතිකාර කිරීම සඳහා මහරගම ජාතික පිළික ආයතනය (NCI) කැපවෙමින් කටයුතු කරයි. රසාවි වෛද්‍ය සංකීර්ණය නමින් නවීන පිළිකා ප්‍රතිකාර අංශයක් දැනට රෝහල් භූමි භාගයේ ඉදිවෙමින් පවතී. පාරිසරික හිතකාමී අයුරින් සෞඛ්‍ය සේවා පවත්වා ගෙන යමින් ජනිත වියහැකි අපද්‍රව්‍ය මනාව කළමනාකරණය කිරීමද සෞඛ්‍ය සේවා උසස් අයුරින් සිදුකරන අතරම සහ සමාන්තරව සිදු කිරීම රෝහල් කළමනාකරණය කැපවෙමින් කටයුතු කරයි. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ජනිත වන අපද්‍රව්‍ය කළමනාකරණය උදෙසා ව්‍යාපෘතියක් දියත් කර ඇත. දැනට පවත්නා කසළ කළමනාකරණ ක්‍රම විධි අධ්‍යනයට ලක් කරමින් පවත්නා අඩුපාඩු සහ අනනුකූලතා මගහරවමින් කසළ කළමනාකරණය අනාගතයේදී යහපත් ලෙස සිදු කිරීම සඳහා සුදුසු උපදේශක සේවා සපයන ලෙස කාර්මික තාක්ෂණ ආයතනයෙන් ඉල්ලා ඇත.

ලෝක සෞඛ්‍යය සංවිධානයේ (WHO) උපදෙස් මෙන්ම රටෙහි ස්ථාපිත නිර්දේශයන්ට අනුකූලව දැනට පවත්නා ක්‍රමවිධි අධ්‍යනය කරමින් කාර්මික තාක්ෂණ ආයතනය විසින් පිළිපැදිය යුතු උපදෙස් ගොනු කොට ඇත.

# තරගකාරිත්වයේ අනභිභාවනීයත්වය

## අධිවේගී ලුහුබැඳුම් යාත්‍රාවන්ගේ කම්පන ප්‍රමාණ මිණුම්

ඉන්දියානු නාවික හමුදාව විසින් සෝලස් මැරයින් ලංකා පුද්ගලික සමාගම මගින් නිෂ්පාදනය කරන ලද අධිවේගී අවි සහිත බෝට්ටු 08ක් මිලට ගත් අතර එන්ජිමේ ක්‍රියාකාරීත්වය ඇගයීම සඳහා භාවිත කරන ලද එක් සාධකයක් ලෙස කම්පන ප්‍රමාණ දක්වන ලදී. කාර්මික තාක්ෂණ ආයතනය මගින් ISO 10816 – 6:1995 ප්‍රමිතියට අනුකූලව ඉන්දියානු මුහුදු යාත්‍රා අගැයුම් රෙජිස්ට්‍රාර්වරයාගේ අභ්‍යන්තර වෘතිකයන්ගේද සහය ඇතිව මිණුම් ගන්නා ලදී. කම්පන ප්‍රමාණ මිණුම් කම්පනයන්ගේ ප්‍රබලතා මත ශ්‍රේණිගත කරන ලදී.

## BBQ පොල්කටු අඟුරු කුඩු භාවිත කොට නිපදවන ලද බාබේ කිව් දහන කැට තත්ත්ව පාලන පරීක්ෂා

සක්‍රිය කාබන් නිෂ්පාදනයේදී අතුරු ඵලයක් ලෙස පොල්කටු අඟුරු සිහින් කුඩු ලෙස ජනිත වන අතර මෙම කුඩු භාවිත කොට දහනයසඳහා කැට විශේෂයක් නිපදවයි. අවසාන නිෂ්පාදනයේ තත්ත්ව පාලනය හා අපනයන කිරීමේදී පවත්වාගත යුතු ප්‍රමිති සඳහා තත්ත්ව තත්ත්ව පරීක්ෂණ වාර්තා සැකසීමවැදගත් පියවරක් ලෙස නිෂ්පාදන ක්‍රියාවලියේදී සැලකේ. ශ්‍රී ලාංකික BBQ කැට නිෂ්පාදකයෙකු වෙත ප්‍රමිති ආරක්ෂා වන පරිදි ගුණාත්මක BBQ කැට නිෂ්පාදනය සඳහා සේවා සැපයීය. කාර්මික තාක්ෂණ ආයතනය මගින් සිදු කරන තත්ත්ව ආරක්ෂණ පරීක්ෂන ඩෙන්මාර්ක් ජාතික අපනයනකරු විසින් වර්ණනා කරමින් දැවීමේදී පවත්වාගතයුතු පරාමිතීන්වන දැවෙන කාලය, කැලරි අගය, උෂ්ණත්වය වැනි මිණුම් නිර්ණය කිරීම අගයකොට ඇත.

## මිණුම්ක්‍රමාංකන කෙරෙන ප්‍රතීතකරණය මගින් ගුණාත්මක භාවය පවත්වා ගැනීම

## සෞඛ්‍ය වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා මිණුම් ක්‍රමාන්කන සේවා

සීමාසහිතනවලෝක පුද්ගලික රෝහල, ආසිරි පුද්ගලික රෝහල හා ලංකාහොස්පිටල් සමූහ ව්‍යාපාරය වැනි ප්‍රධාන පෙලේ වෛද්‍ය පරීක්ෂණ රසායනාගාර, කාර්මික තාක්ෂණ ආයතනයේ මිණුම් ක්‍රමාංකන රසායනාගාරයේ සේවා ලබාගනිමින් සිදුකෙරෙන වෛද්‍ය පරීක්ෂණයන්ගේනිවැරදිතාව ආරක්ෂා කර තමන් වෙත පැමිණෙන රෝගීන් සඳහා ගුණාත්මක වෛද්‍ය සේවාවක් සැපයීමේ තම අරමුණ මැනවින් ඉටු කරගන්නා ලදී.

# තරගකාරිත්වයේ අනභිභාවනීයත්වය

## BOI සමාගම් සදහා ප්‍රතීතක ක්‍රමාන්කන සේවා

නොරටෙල් ලංකා පුද්ගලික සමාගම, නොරටෙල් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම, හිල්න්ටෙක්ට්‍රාන් ස්ඩියුසර්ස් සමාගම, යුනිවෙලා පුද්ගලික සමාගම, බොඩිලයින් පුද්ගලික සමාගම ආදී ආයෝජන මණ්ඩලයට අයත් ISO9000 සහතිකලාභී ආයතන කාර්මික තාක්ෂණ ආයතනයේ මිණුම් ක්‍රමාන්කන සේවාවන් ලබා ගනී. අන්තර්ජාතික වෙළඳපොළ වෙත තම නිමි භාණ්ඩ, ප්‍රතීතක ක්‍රමාංකන රසායනාගාරයකින් සැපයෙන සේවා සහිත උපකරණ භාවිතයෙන් නිෂ්පාදනය කිරීම මගින් තම ගුණාත්මක තත්වය ආරක්ෂා වන අයුරින් කටයුතු කිරීම් කාර්මික තාක්ෂණ ආයතනය සමගින් නොකඩවා සේවා ලබාගනී.

## වෙනත් රටවල් සදහා සැපයූ මිණුම් ක්‍රමාංකන කටයුතු

මාලදිවයින්සෞඛ්‍ය වෛද්‍ය රසායනාගාරය හා පකිස්ථානයේ කොරශී අන්තර්ජාතික පර්යේෂණ ආයතනය තම පරීක්ෂණ කටයුතු සදහා භාවිතා කෙරෙන උපකරණ ක්‍රමාංකනය සදහා කාර්මික තාක්ෂණ ආයතනයේ කාර්මික මිණුම් රසායනාගාරයේ (IML) සේවා,ISO 17025 ප්‍රතීතක තත්වය එම රසායනාගාර වෙත ලබා ගැනීම සදහා කටයුතු කරන ලදී. උදුන්, උෂ්ණත්ව පාලක කුටීර, ජීවානුහරණ කුටීර, රසායන තුලා, ජාල තාපක හා ස්කන්ධ භාර යුගලයන් ක්‍රමාංකනය කරන ලදී. මෙම සේවාලාභීන් දෙදෙනා උදෙසා IML අංශය 5 වසරකට වැඩි කාලයක් සදහා සේවා සපයා ඇත.

## ආවේනික ඖෂධ පැළෑටි නිවැරදිව හඳුනාගැනීම

ආවේනික ඖෂධ පැළෑටි සතු ඖෂධීය ගුණ අධ්‍යනය ශාඛයේ භෞතික ලක්ෂණ රසායනික ගුණාංග, අන්වීක්ෂ විශ්ලේෂණ හා ජාන විද්‍යාත්මකව පරීකෂා කරන ලදී. එම ශාඛ හීන්බෝවිටියා (*Osbectiaoctandra),* පුහුල්*(Veronica zeylinica),* හරන් කහ *(Curcuma albiflora*), බාදුරා*(Nepenthes distillatoria),* වල් ඉද්ද*(Waliddaantidyzenterica),* දාරුහරිද්‍රා බද්ද*(Barberiszeylinica),* කැකුණ *(Canariumzeylinicum*), කොකුම්*(Kokoonazeylinicum),* ගිරිතිල්ල *(Argyriapopalifolia)* හා මාරත්මල් *Rhododendrumarboreum)*

විවිධ විද්‍යාත්මක ක්‍රමවේධ භාවිත කොට ඖෂධ පැළෑටි හඳුනා ගැනීම ශාක කොටස් කුඩුකරන ලද හෝ නිස්සාරක වශයෙන් වෙනත් ද්‍රව්‍ය සමඟ මිශ්‍ර කිරීම පාලනය කිරීම සඳහා බෙහෙවින් වැදගත් වේ.ඉහත ශාක විශේෂ 10 සඳහා කාර්මික තාක්ෂණ ආයතනය දැනට නිවැරදි හඳුනාගැනීම් සිදුකරයි.

# පාරිසරික දූෂණ නිරීක්ෂණ හා වැළකුම් ක්‍රියාමාර්ග

## කසළ වශයෙන් ඉවත් කෙරෙන ඊයම් හේතුකොට ගෙන ඇතිවන පාරිසරික දූෂකතත්වය තක්සේරු කිරීම.

රථවාහනවිදුලි සංදේශ සේවා හා අදාළ වෙනත් සේවාවන්ගේ වර්ධනය සමඟ ඒ සඳහා භාවිත කෙරෙන ඊයම් යෙදූ විදුලි කෝෂ නිෂ්පාදනයද වර්ධනය වීම නොවලක්විය හැකි නමුදු එමගින් ජනිතවන ඊයම් අපද්‍රව්‍ය හේතුකොට ගෙන මානව සෞඛ්‍ය මෙන්ම පාරිසරික වශයෙන් බලවත් හානියක් සිදුකරයි. එසේම බේසල් සම්මුතියට අනුව ඉවතලන ඊයම් අපද්‍රව්‍ය වෙනත් රටවලට ගෙන යාම පිලිබඳ බාධක පනවා ඇත. එබැවින් ඊයම් විදුලි කෝෂ නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රය ආර්ථික සංවර්ධන කටයුතු සඳහා ඉදිරියට ගෙනයාම සමඟ කසලමය ඊයම් චක්‍රීකරණය මනාව සිදු කිරීම සඳහා කළමනාකරණ කටයුතු මෙහෙයවීම වැදගත් වේ.

බටඅත කර්මාන්ත පුරයේ ආයෝජන මණ්ඩල පහසුකම් ඇතිව චීනයේ ලියෝච් අන්තර්ජාතික සමාගම විසින් ඊයම් අම්ල විදුලිකෝෂ නිෂ්පාදනය සඳහා ලියෝච් ලංකා පුද්ගලික සමාගම ස්ථාපිත කර ඇත. මධ්‍යම පරිසර අධිකාරිය මගින් පියවර කීපයකින් ව්‍යාපෘතිය සඳහා අනුමැතිය දී ඇත. පාරිසරික දූෂණ තත්වය අධ්‍යනයට ලක්කොට වැලකුම් ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සඳහා නවීන උපකරණ භාවිතයට ගනිමින් වාර්තාවක් සපයන ලෙස කාර්මික තාක්ෂණ ආයතනය වෙත ඉල්ලීමක් කරන ලදී. අප වාර්තාවට අනුව CEA,BOI හා කර්මාන්ත අමාත්‍යංශය එක්ව පසු විපරම් නිරීක්ෂණ කටයුතු මෙහෙයවන ලදී. දූෂණ පරීක්ෂණ කටයුතු යෝජිත අයුරින් ඉදිරියට කරගෙන යාමටද කාර්මික තාක්ෂණ ආයතනය වෙත පිරිනම ඇත.

## පිගන් භාණ්ඩ කර්මාන්තයේදී ඇතිවන අපද්‍රව්‍ය භාවිතා කොට තහඩු ඔප දැමීමට නිෂ්පාදනයක්

පිගන් ගඩොල නිෂ්පාදනයේදී අපතේ යන කුඩු භාවිතයට ගනිමින් තහඩු ඔප දැමීම සඳහා නිෂ්පාදනයක් ප්‍රවර්ධනය කර ඇති අතර පිගන් භාණ්ඩ තාක්ෂණ නිපුණතා මධ්‍යස්ථානය හරහා තක්ෂනයහුවමාරුව සඳහා සැලසුම් කොට ඇත. එමගින් පිගන් භාණ්ඩ නිෂ්පාදනයේදී අපද්‍රව්‍යක් ලෙස නිකුත්වනකුඩු නැවත භාවිතයට ගැනීමට අවස්ථාව උදාකර ඇත.

## දක්ෂිණ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පාදක දත්ත රැස් කිරීම

ස්කිල් ඉන්ටනැෂනල් පුද්ගලික සමගම මගින් දකුණු පළාතේ සිදු කෙරෙන සංවර්ධන ව්‍යාපෘතීන් 2 ක් සඳහා පැවතිය හැකි ශබ්ද හා කම්පන, මිණුම් හා අවට වායුගෝලීය තත්වයන් නිර්ණය කොට පාරිසරික සක්‍යාත ඇගයීම් වාර්තාව සැකසීම කාර්මික තාක්ෂණ ආයතනය වෙත පවරන ලදී.

# පාරිසරික දූෂණ නිරීක්ෂණ හා වැළකුම් ක්‍රියාමාර්ග

මෙම ව්‍යාපෘතීන් ද්විත්වය මිරිජ්ජවිල ඉදිකෙරෙන EPZ කලාපය, IPZ සූරියවැව හා හම්බන්තොට වරයා හා මත්තල ගුවන්තොට ය කෙරෙන අධිවේගී මාර්ග ව්‍යාපෘතියෙහි පවත්නා ශබ්ද හා කම්පන ප්‍රමාණ මන බැලීම මෙන්ම ව්‍යාපෘති අවසානයේ අවට ප්‍රදේශය තුල පැවතියහැකි එම අගයන්ද නිර්ණය කරන ලෙස කාර්මික තාක්ෂණ ආයතනය විද්‍යාඥයින්ගෙන් ඉල්ලා ඇත. කාර්මික තාක්ෂණ ආයතනය වෙතින් ව්‍යාපෘතීන් ද්විත්වයම සඳහා ශබ්ද සිතියම් නිර්මාණය කොට අදාල අධිකාරී ආයතන වෙත ඉදිරිපත් කොට ඇත.

## මාතර බෙලිඅත්ත දුම්රිය මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා පාදක දත්ත එක්රැස් කිරීම්

ප්‍රවාහන අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි ශබ්ද කම්පන, අවට වාතය හා ජලයේ ගුණාත්මක තත්වයන් පිළිබඳව පාරිසරික පාදක දත්ත එක්රැස් කිරීම කාර්මික තාක්ෂණ ආයතනය මගින් ආරම්භ කරන ලදී. අදාල වැඩසටහන ක්‍රියාත්මකවීමෙදී පරිසරය, ජනතාව හා පෞරාණික විහාරස්ථාන වන වෙහෙරහේන හා වැව්රුකන්නල වැනි දුම්රිය මාර්ගයේ සිට දුරස්ථව පිහිට ඇති ස්ථාන කෙරෙහිද සිදු කෙරෙන බලපෑම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකිවනු ඇත. මෙම ව්‍යාපෘතිය සිදු කෙරෙනුයේ චීන ජාතික කොන්ත්‍රාත් සමාගමක් වන මෙට්‍රොලොජිකල් කෝපරේෂන් උපදේශකවරුන් හා මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් සමගය.

# මානව සුභසාධන සමාජ ආර්ථික ප්‍රවර්ධනය සඳහා තාක්ෂණය

## ප්‍රොබයෝටික ක්‍රියාකාරීත්වය සහිත පැසවීම් කල මාළු

පාරම්පරිකව නිෂ්පාදනය කෙරෙන ජාඩි පිළිබඳව 2012 වසරේදී සිදුකල රසායනාගාර පරීකෂාවන්ගෙන් හෙළිදරව් වූයේ ජාඩි නිෂ්පාදනය පැසවීම මගින් සිදුකෙරෙන කාර්යක් නොව ඔස්මොටික නිර්ජලීකරණය භාවිතා ක්‍රමවේදයක් බවයි. තවදුරටත් එය සෞඛ්‍යආරක්ෂිත පිළිවෙත් ඇතිව සිදු නොකෙරෙන බවත් පෙනී ගොස් ඇත.සෞඛ්‍ය ආරක්ෂිතව ජාඩි නිෂ්පාදන ක්‍රමවේදය ප්‍රවර්ධනය කිරීමෙන් අනතුරුව ප්‍රොබයෝටික ක්‍රියාකාරීත්වය සහිතව ජාඩි නිෂ්පාදනය පිළිබඳව පර්යේෂණ ආරම්භ කරන ලදී. පැසවීම සඳහා අවශ්‍ය කෂුද්‍රජීවී වගා මාධ්‍ය සපයා ගැනීමෙන් අනතුරුව පැසවූ මාළු නිෂ්පාදනය සිදුකෙරෙමින් පවතින අතර සෞඛ්‍ය ආරක්ෂිතව ප්‍රොබයෝටික ක්‍රියාකාරීත්වය සහිතව ජාඩි නිෂ්පාදන තාක්ෂණය හඳුන්වාදීමට අපේක්ෂා කෙරේ.

## එළු මස් සුනඛ මස් සමග වංචාසහගත ලෙස යෙදීම ජෛව තාක්ෂණය මගින් අනාවරණ කිරීම

ඉහළ මිලක් ඇති මස් වර්ගයක් වෙනත් මස් වර්ග සමග මිශ්‍ර කොට අලෙවි කිරීම ලෝකයේ සෑම රටකම දක්නට ලැබේ. දියුණු වෙමින් පවත්නා රටවල්හි රසන්ඥයින් වංචාකාරී ලෙස කෙරෙන මෙම කටයුත්ත ස්ථිරව තීරණය කිරීමේ අපහසුතාවයකට පත්ව සිටී. මෙම ආදේශක මස් වර්ග අතර සෞඛ්‍ය ආරක්ෂිත නොවන සමාජ යථාර්ථයන්ට එරෙහි සුනඛ, බිලාල, මී හෝ යම් අවස්ථාවන්හිදී අශ්ව මස්ද යොදාගනිමින් සිදු කරයි.

කාර්මික තාක්ෂණ ආයතනයේ, PCR තාක්ෂණය යොදා ගනිමින් මෙම බල කිරීම අනාවරණය කර ගැනීම සඳහා පරීක්ෂණ ක්‍රමවේදයක් ප්‍රවර්ධනය කර ඇත. මෙම ක්‍රමයේදී DNA පාදක විශ්ලේෂණය යොදා ඉතා නිවැරදි අයුරින් විවිධ සත්වයන්ගේ මස් වර්ග හා මස් නිෂ්පාදන හඳුනා ගැනීමට හැකියාව උදාකරගෙන ඇත. DNA සතු අධික තාප ස්ථායි තත්වය හේතුවෙන් පාරිසරික තත්වයන් හඳුනාගැනීමේදී කිසිදු බාධාවක් ඇති නොකරයි.

## රථවාහන අධික නලා ශබ්ද පිළිබඳව දැනුවත් කිරීම

මධ්‍යම පරිසර අධිකාරිය කාර්මික තාක්ෂණ ආයතනයේ විශේෂඥයින්ගේ සහාය ඇතිව නලා ශබ්ද පිළිබඳව සැකසූ නීති රෙගුලාසි දැනට ක්‍රියාත්මකව පවතී. මේ පිළිබඳව දැනුවත් කිරීම සඳහා තෝරාගත් වාහන මගින් ඇති කෙරෙන නලා ශබ්ද මැන අදාල රියදුරන් දැනුවත් කිරීම සඳහා පොලීසිය, CEA හා කාර්මික තාක්ෂණ ආයතන එකාබද්ධව වැඩ පිළිවෙලක් දියත් කරන ලදී. මෙහි ප්‍රථම වැඩසටහන මාලඹේ චන්ද්‍රිකා බණ්ඩාරනායකකුමාරතුංග මාවතේදී ද කොළඹ නගරයේ තවත් ස්ථාන කීපයකදීද සිදුකරන ලදී.

# සම්මන්ත්‍රණ, සමුළු, පුහුණු වැඩසටහන් හා වැඩමුළු

## ඖෂධ ශාස්ත්‍රීය හා රසායනික තාක්ෂණය පිළිබඳ ලෝක සම්මේලනය

ස්වභාව ධර්මය හා සෞඛ්‍ය ආරක්ෂණ සංගමයේ (INC, USA) පළමු වසර සැමරීම වෙනුවෙන් 2013 දෙසැම්බර් 16 – 18 දින දක්වා ඖෂධ ශාස්ත්‍රීය හා රසායනික තාක්ෂණ ලෝක සමුළුව ශ්‍රී ලංකාවේ කොළඹදී පැවැත්විණ. මෙම උළෙල සංවිධානය කරන ලද්දේ තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය, කාර්මික තාක්ෂණ ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලයහා කැලණිය විශ්වවිද්‍යාලය එක්වස්වභාව ධර්මය හා සෞඛ්‍ය ආරක්ෂණය පිළිබඳ ලෝක සංගමය INC, USA විසිනි.

ස්වභාව ධර්මය හා සෞඛ්‍ය ආරක්ෂණය පිළිබඳ ලෝක සංගමය ස්වභාව ධර්මය හා එහි සෞඛ්‍ය ආරක්ෂණය සම්බන්ධයෙන් පවත්නා සහසම්බන්ධතාවය පිළිබඳ අධ්‍යනය කිරීමට සැලසුනු විද්‍යාඥයින් කණ්ඩායමකින් සැදුම්ලත්ය. සංගමයේ අරමුණ ස්වභාව ධර්මය හා සෞඛ්‍ය ආරක්ෂණය පිළිබඳ අධ්‍යාපන පර්යේෂණ මෙන්ම ජනතාව ඒ පිළිබඳ දැනුවත් කිරීමයි.

විද්‍යාඥයින් 100 කට අධික ගණනක් ඉන්දියාව, ප්‍රංශය, මැලේසියාව හා කෙන්යාව ඇතුළු දේශීයව සහභාගිවන්නන් 40 ක් ඒ සඳහා සහභාගී වුහ. සමුළුව තේමා පාඨ 4 ක් ආවරණය වන පරිදි සංවිධානය කර තිබූ අතර එනම්,

- ඖෂධ ශාස්ත්‍ර විද්‍යාව හා තාක්ෂණය
- තත්ත්ව පාලනය, ප්‍රමිතිකරණය හා ආරක්ෂාව
- ස්වභාවික ද්‍රව්‍ය හා කෘතිම සංකලනය
- ඖෂධ ශාස්ත්‍රීය ආර්ථිකය, ජෛව තාක්ෂණය හා නිනිති තාක්ෂණය

එම තේමා පාඨ යටතේ පූර්ණ දේශණ 14 ක්, වාචික ඉදිරිපත් කිරීම් 80 ක් හා පෝස්ටර් ඉදිරිපත් කිරීම් 40 ක් ඇතුලත් විය.
ලෝකය පුරා විසිරී සිටින දියුණුවෙමින් ඉදිරියට යන විද්‍යාඥයින් වෙත ඖෂධ තාක්ෂණ විද්‍යාව හා රසායනික තාක්ෂණය පිළිබඳ නව දැනුම් සම්භාරයක් මෙන්ම පවත්නා වර්ධනීය තත්වයන් මනාව අවබෝධ කර ගැනීමට මහගු වේදිකාවක් විය.

## වාර්ෂික පර්යේෂණ සමුළුව 2013

"විද්‍යාත්මක කාර්මික පර්යේෂණ තුලින් නව පර්යේෂණ හා සංවර්ධනයක් වෙත" යන තේමාව සටතේ කාර්මික තාක්ෂණ ආයතනයේ පළමු පර්යේෂණ සම්මන්ත්‍රණය 2013 ඔක්තෝම්බර් 23-24 දෙදින තුල කොළඹ දී පැවැත්වින. සමාරම්භක උළෙල BMICH හිදී ප්‍රධාන අමුත්තා ලෙස තාක්ෂණ හා පර්යේෂණ ගරු අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතා සහභාගී වූ අතර ආරාධිත අමුත්තා ලෙස පකිස්ථානයේ ජීව විද්‍යා හා රසායන විද්‍යාව පිළිබඳ අන්තර්ජාතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ, කාබනික රසායනය පිළිබඳ මහාචාර්ය එම්. ඉක්බාල් චවුද්රි මහතා සහභාගී විය.

# සම්මන්ත්‍රණ, සමුළු, පුහුණු වැඩසටහන් හා වැඩමුළු

පසුගිය 10 වසර තුල විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ නොමැකෙන සුළු සේවයක් සිදුකල ආයතනීය විද්‍යාඥයින් මෙන්ම දැනට සේවය කරන නිලධාරීන් වෙත ද මෙහිදී තිළිණ පිරිනමන ලදී.

තේමා 9 ක් මුලිකව පර්යේෂණ වාර්තා 39 ක් කාර්මික තාක්ෂණ ආයතනයේදී සමාන්තරව පැවැත්වූ තාක්ෂණ සැසි වාරයේදී ඉදිරිපත් කෙරින.

## ආයතන/සමාගම්/සංවිධාන පුහුණු

නාමයෙන් අර්ථ දැක්වෙන පරිදි කාර්මික තාක්ෂණ ආයතනයේ එක් මූලික අභිප්‍රායක් වනුයේ දේශීය කර්මාන්ත, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අරභයා තාක්ෂණ ක්‍රමවිධි ප්‍රවර්ධනය කිරීමයි. නව තාක්ෂණයන් ප්‍රවර්ධනය කොට කර්මාන්ත වෙත පැවරීම මෙන්ම කර්මාන්තයන්හි සේවයේ යෙදවෙන සේවකයින් පුහුණුකොට කර්මාන්ත වෙතවෙත සහාය දැක්වීමත් එමගින් දේශීය ආර්ථිකයට සැලකිය යුතු අයුරින් දායක වීමත් ආයතනය විසින් සිදු කරයි.

## මත්ස්‍ය පාදක නිෂ්පාදන

- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සඳහා මත්ස්‍ය සැකසුම් නිෂ්පාදනයන්
- ආහාර හා කෘෂිකර්ම සංවිධානය සඳහා මත්ස්‍ය සැකසුම් නිෂ්පාදනයන්
- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සඳහා බෝතල් කල හාල්මැස්සන් ලූනු මිශ්‍ර කට්ටා කරවල නිෂ්පාදනය
- ධීවර හා සමුද්‍ර සම්පත් අමාත්‍යාංශය සඳහා මත්ස්‍ය පාඩම නිෂ්පාදනයන්
- කරවල හා උම්බලකඩ නිෂ්පාදනයක්

## සහල් පාදක නිෂ්පාදන

- සහල් පාදකව සිදුකල නිෂ්පාදනයන් - අගය වැඩිකල සහල් නිෂ්පාදන වාණිජ හා කර්මාන්ත සභා මණ්ඩල උදෙසා

## ජලය බීම වර්ග හා වෙනත් පළතුරු පාදක නිෂ්පාදන

- ජාතික ජල සම්පාදන හා ප්‍රවාහන මණ්ඩලය සඳහා ජලයේ කෘෂි රසායන ශේෂ ප්‍රමාණ විශ්ලේෂණය
- පාරම්පරික කර්මාන්ත හා කුඩා ව්‍යවසායක සංවර්ධන අමාත්‍යාංශය සඳහා කිතුල් බීමක් හා කිතුල් ජෙලි නිෂ්පාදනය - කෑගල්ල හා කුරුණෑගල පළාත්වල
- පාරම්පරික කර්මාන්ත හා කුඩා ව්‍යවසායක සංවර්ධන අමාත්‍යාංශය සඳහා කිතුල් බීම

## සම්මන්ත්‍රණ, සමුළු, පුහුණු වැඩසටහන් හා වැඩමුළු

- ජෑම් වර්ග නිෂ්පාදනය
- රඹුටන් අපනයන වෙළඳ පල සඳහා සැකසීම
- අමුද්‍රව්‍යයක්ලෙසපළතුරු බීම හා පළතුරු පල්ප ක්ෂණිකවබීම වර්ග ලෙස
- ආහාර නිර්ජලීයකරණය
- අයිස්ක්‍රීම් සඳහා විවිධ රසකාරක සැකසීම
- ඉදිආප්ප පිටි සැකසීම
- යෝගට් නිෂ්පාදනය

### රසායනික හා ක්ෂුද්‍රජීවීමය විශ්ලේෂණ

- ශ්‍රී ලංකා තේ මණ්ඩලය සඳහා ප්‍රමිතිගත ක්ෂුද්‍රජීවී වගා මාධ්‍ය නඩත්තුව පිළිබඳව පුහුණුව
- ක්ෂුද්‍රජීවී විශ්ලේෂණයේදී තත්ව පාලනය - ISO 17025, යාපනයේ තල් පර්යේෂණ ආයතනය වෙනුවෙන්
- මේද අම්ල, මධ්‍යසාර හා කෘමිනාශක ශේෂ ප්‍රමාණයන් විශ්ලේෂණය, තල්ආශ්‍රිත නිෂ්පාදන සඳහා වායු වර්ණාවලික ක්‍රමවේද භාවිතය - යාපනය විශ්වවිද්‍යාලය
- සුවද විලවුන් සඳහා රසායනික හා කශුද්‍රජීවීමය විශ්ලේෂණ - ඉයුරෝ කොස්මෙටික් පුද්ගලික සමාගම වෙත
- ඖෂධ නිෂ්පාදනයන්ගේ පැවතිය හැකි කෘමිනාශක ප්‍රමාණයන් වායු වර්ණාවලී ක්‍රමවේදය මගින් විශ්ලේෂණය - ශ්‍රී ලංකා ආයුර්වේද දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා රේගුව හා පාරම්පරික ඖෂධ ආයතන සඳහා ජෛවීය පරීකෂා ක්‍රම

### උපකරණ භාවිතය

- උපකරණ භාවිතය පිළිබඳ පුහුණු - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- උපකරණ භාවිතය හා නඩත්තු - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- රසායනාගාර විශ්ලේෂණ ක්‍රම
- ප්‍රතිඔකසිකරන ක්‍රමවේද
- High Performance Liquid Chromatography
- ආයුර්වේද ඖෂධ හා සුවද විලවුන් අගය වැඩිකෙරෙන ක්‍රමවිධි

### ඖෂධ තාක්ෂණ

- ආයුර්වේද ඖෂධීය පැළෑටි ප්‍රමිතිකරණය
- ආලේපන, දියර, ෂැම්පු වර්ග හා ජෙල් නිෂ්පාදනය

# සම්මන්ත්‍රණ, සමුළු, පුහුණු වැඩසටහන් හා වැඩමුළු

## ද්‍රව්‍ය තාක්ෂණ

- පිගන් ශෝදන දියර නිෂ්පාදනය, මෝටර් රථ ශෝදන දියර, දියරමය වා පවිත්‍රක, ශෝදන දියර, පිගන් ගඩොල් පවිත්‍රතා දියර, රෙදිපිළි පවිත්‍රතා දියර හා මෘදුකාරක දියර නිෂ්පාදනය
- පැහැදිලි ප්ලාස්ටික් භාවිතා කොට විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය
- සිලිකොන් අච්චු නිෂ්පාදනය
- ප්ලාස්ටර් ඔෆ් පැරිස් යොදා අච්චු සැදීම

## උපාධිලාභී හා පශ්චාත් උපාධිධාරීන් සඳහා පර්යේෂණ පුහුණු

කාර්මික තාක්ෂණ ආයතනයේ පර්යේෂණාගාර යටිතල පහසුකම් හා විශේෂඥ විද්‍යාඥයින් යොදමින් පර්යේෂණ පුහුණු කටයුතු සිදු කරයි.සෑම වසරකම උපාධිලාභී සිසුන් මෙන්ම පශ්චාත් උපාධි අධ්‍යන කටයුතු සඳහා අවශ්‍ය පාඨමාලා අනුයුක්ත පර්යේෂණ කටයුතු කාර්මික තාක්ෂණ ආයතනයේදී සිදු කරයි. කාර්මික තාක්ෂණ ආයතනයේ පර්යේෂණ විද්‍යාඥයින්ගේ සුපරීක්ෂාව ඇතිව 2013 වසර තුලදී උපාධිලාභීන් 70 ක් මෙන්ම පශ්චාත් උපාධිලාභීන් 03 දෙනෙකුට නව පර්යේෂණ ව්‍යපෘති කාර්මික තාක්ෂණ ආයතනයේදී සිදුකරන ලදී.

# ධාරිතා වර්ධන හා ඵලදායිතා ප්‍රවර්ධනය

## ආචාර්ය උපාධි - PhD

1. තේජා හේරත් කැලණිය විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධිය සම්පූර්ණ කරන ලදී. ප්‍රබන්ධ තේමාව- 'දේශීයව වගා කෙරෙන සහල් වර්ග සමහරක යකඩ ජෛවීය ලෙස උරාගැනීමට ඇති හැකියා වර්ධනය'

2. කාන්චනා අබේසේකර කොළඹ විශ්ව විද්‍යාලයේදී තම ආචාර්ය උපාධිය සම්පූර්ණ කරන ලදී. ප්‍රබන්ධ තේමාව - 'ශ්‍රී ලාංකික පාරම්පරික සහල් වර්ග කීපයක භෞතික රසායනික හා ජෛව ක්‍රියකාරක ගති ලක්ෂණ'.

3. පද්මසිරි රණසිංහ තම ආචාර්ය උපාධිය කොළඹ විශ්වවිද්‍යාලයේදී සම්පූර්ණ කළේය. ප්‍රබන්ධ තේමාව - 'කිතුල් මීරා තුල ඇති ජෛව ක්‍රියාකාරකම් හා ආර්ථික වශයෙන් වැදගත් වන පැසවූ රා මතින් වෙන්කොටගත් යීස්ට්'.

4. සුදර්ශන සෝමසිරි තම ආචාර්ය උපාධිය කොළඹ විශ්වවිද්‍යාලයේදී අධ්‍යනය කරමින් සිටී. ප්‍රබන්ධ තේමාව - 'කිතුල් මීරා හා වෙනත් නිෂ්පාදනයන්ගේ පවත්නා රසායනික ගති ලක්ෂණ හා නිශ්චිත ලෙස හදුනා ගැනීම'.

5. සී.එච්. මනෝරත්න කොළඹ විශ්ව විද්‍යාලයේදී තම ආචාර්ය උපාධි අධ්‍යනය කටයුතු සිදු කරමින් පවතී. ප්‍රබන්ධ තේමාව - 'ලිතියම්අයන කෝෂ සඳහා භාවිතයට සුදුසු මිනිරන් හා මිනිරන් සංකලන විශ්ලේෂණය හා ගති ලක්ෂණ අධ්‍යනය'.

6. රුවන් වීරසිංහ තම ආචාර්ය උපාධිය කොළඹ විශ්ව විද්‍යාලයේ සිදු කරයි. ප්‍රබන්ධ තේමාව - 'ස්වයං ක්‍රිය අම්ල වැසි නිරීක්ෂණ මධ්‍යස්ථානය'.

7. ඩබ්.පී.කේ.එම්. අබේසේකර ආචාර්ය උපාධිය කොළඹ විශ්ව විද්‍යාලයේදී සිදු කරමින් සිටී. - ප්‍රබන්ධ තේමාව - 'ශ්‍රී ලාංකික කුරුඳු (*Cinnamomumzeylanicum*Blume) තුල පැවතිය හැකි සෞඛ්‍යමය ප්‍රතිලාභ තෝරාගත් ජෛව ක්‍රියාකාරිත්වයන් තුලින් අධ්‍යනය කිරීම'.

8. සමන් වීරරත්න කොළඹ විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධිය සඳහා ලියාපදිංචි විය. ප්‍රබන්ධ තේමාව - 'තාප රසායනික නියතයන් හා දර්ශක පද්ධති මාපක ක්‍රමවේදයන් භාර වර්ණාවලී (Mass Spectrometry) විශ්ලේෂණය සඳහා.

# ධාරිතා වර්ධන හා ඵලදායිතා ප්‍රවර්ධනය

## විද්‍යාපති/ශාස්ත්‍රපති අධ්‍යනය

1. කේ. එච්. පී. අබේසේකර ශාස්ත්‍රපති උපාධිය කොළඹ විශ්වවිද්‍යාලයේදී සම්පූර්ණ කරන ලදී.

2. එල්. සී. ඩී. නයනජිත් ශාස්ත්‍රපති උපාධිය කොළඹ විශ්ව විද්‍යාලයේදී සම්පූර්ණ කරන ලදී. ප්‍රබන්ධ තේමාව - 'ප්‍රකාශ වොල්ටික කෝෂ සඳහා මිනිරන් හා මිනිරන් සංකලන කෘත්‍රිමව නිෂ්පාදනය හා ගති ලක්ෂණ අධ්‍යනය.

3. ඩී. එස්. සමරවික්‍රම ශාස්ත්‍රපති උපාධි අධ්‍යන කටයුතු කොළඹ විශ්ව විද්‍යාලයේදී සිදුකරමින් සිටී. ප්‍රබන්ධ තේමාව - 'අඹහෝගයේ පසු අස්වනු හානි වැළැක්වීම සඳහා ස්වභාවික තන්තුමය සුපිරි ඇසුරුම් නිෂ්පාදනය'.

4. එම්. එස්. එම්. අරූස් විද්‍යාපති උපාධි අධ්‍යන කටයුතු ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ සිදුකරමින් සිටී. ප්‍රබන්ධ තේමාව - 'ප්‍රතිඵල දායක ලෙස පරිසනක භාවිතයේදී බලශක්ති භාවිතය'.

5. ඊ. එම්. එස්. ඉසංකා විශ්ලේෂණ රසායන විද්‍යාව පිළිබද ශාස්ත්‍රවේදී උපාධිය කොළඹ විශ්ව විද්‍යාලයේදී සිදු කරමින් සිටී.

6. හසන්ති දිසානායක තිරසාර සැලසුම් ප්‍රවර්ධනය පිළිබද ශාස්ත්‍රවේදී උපාධිය මොරටුව විශ්ව විද්‍යාලයේදී සිදු කරමින් සිටී.

7. කලිකා කුමාරසිංහ පාරිසරික ඉංජිනේරු විද්‍යාව හා කළමනාකරණය පිළිබද ශාස්ත්‍රවේදී උපාධිය මොරටුව විශ්ව විද්‍යාලයේදී සිදු කරමින් සිටී.

8. අයන්තිකා ප්‍රනාන්දු ශාස්ත්‍රපති උපාධිය සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි විය. ප්‍රබන්ධ තේමාව - ශ්‍රී ලංකාවේ අඹ භෝගයේ පසු අස්වනු ගුණාත්මකතාවය සුරැකීම සඳහා හෙක්සනල් පෙව ඉටි ගැල්වීම පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක්

9. නිසල ගුණසේකර ශාස්ත්‍රපති උපාධිය සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි විය. ප්‍රබන්ධ තේමාව- කල්ගත වූ බව සැඟවීම සඳහා ස්වාභාවික සංයෝගයක් පිළිබඳව අධ්‍යයනය, භෝගයන්හි තත්ව ආරක්ෂණය සමග පසු අස්වනු රෝග මැඩපැවැත්වීම සඳහා ක්ෂය වීම වලක්වන පාලක ක්‍රමයක් කඩාසර ලෙස නිකුත් කෙරෙන තාක්ෂණ ක්‍රමයක් විමර්ෂණය කිරිම.

10. ආර්.ඩී.එස්.එස්.රණතුංග, ඇමරිකාවේ යේල් විශ්ව විද්‍යාලයේ හා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි විය. ප්‍රබන්ධ තේමාව - පාරිසරික රසායන විද්‍යාව

# ධාරිතා වර්ධන හා ඵලදායිතා ප්‍රවර්ධනය

11. එස්. එස්. කේ. මැදගේ විද්‍යාපති උපාධිය සඳහා කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි විය.

12. කේ. පී. පී. ගුණවර්ධන විද්‍යාපති උපාධිය සඳහා කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි විය.

13. ආර්.පී.නිලූෂා පාරිසරික කලමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි විය.

14. ඒ. ඒ. එම්. ටී. අදිකාරි ශාස්ත්‍රපති උපාධිය සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි විය. ප්‍රබන්ධ තේමාව - ශ්‍රී ලාංකික තත්වයන් තුල ලෝහ මලකන ආකාරය අනුමාන කිරීම.

## පශ්චාත් උපාධි ඩිප්ලෝමා

1. දිනේෂ්කා ප්‍රියංගනී පශ්චාත් උපාධි ඩිප්ලෝමාව නිෂ්පාදන කලමනාකරණය - කොළඹ විශ්ව විද්‍යාලය.

2. එස් ශිකියනගේ තම පශ්චාත් උපාධි ඩිප්ලේමාව පුස්තකාල හා තොරතුරු විද්‍යාව - කොළඹ විශ්ව විද්‍යාලය.

3. රෝෂනී ප්‍රනාන්දු, තම පශ්චාත් උපාධි ඩිප්ලෝමාව පුස්තකාල හා තොරතුරු විද්‍යාව - කොළඹ විශ්ව විද්‍යාලය.

## කෙටිකාලීන පුහුණු/රැස්වීම්/සම්මන්ත්‍රණ

## විදේශීය පුහුණු

1. තිලක් ගුණසේකර, ජපානයේ කිටකියුෂුහි පැවති J I C A මූලා ප්‍රතිපාදන ඇතිව “පාරිසරික දූෂණ පාලන කළමණාකරණය” අන්තර් ජාතික පුහුණු වැඩසටහනට සහභාගී විය (ජනවාරි 16-26 අප්‍රියෙල් 2013)

2. ඩී. සී. එච්. තිරිමාන්න, APLAC- PTB 3 වන පුහුණු වැඩමුලුව - සාමාර්ථතා පරීක්ෂාව පිළිබඳ වැඩිදුර පුහුණු පාඨමාලාව - Physikalish Technisch මගින් ඉන්දුනීසියාවේ ජාකර්තා (2013 පෙබරවාරි 4 -7)

# ධාරිතා වර්ධන හා ඵලදායිතා ප්‍රවර්ධනය

3. ඩබ්. එම්. එස්. විජේසිංහ හා පී.ටී.ද.සිල්වා - තුලා මිණුම් ගන්නා ස්ථානයේදීම ක්‍රමාංකණය කිරීම, පකිස්ථානයේ අන්තර්ජාතික පර්යේෂණ ආයතනය (2013 ජනවාරි 20 -23)

4. ඒ. එම්. කේ. ආර්. ජයතිලක - ක්‍රමෝපායන තරඟකාරී හා සහයෝගිතා ප්‍රවනතා ඇතිව බුද්ධිමය දේපලින් සන්නද්ධ වීම. ඉන්දියාවේදී (2013 පෙබරවාරි 14 – 16)

5. ජී. ඒ. එස්. ප්‍රේමකුමාර - සාර්ක් ලේකම් කාර්යාලය විසින් සංවිධානය කල සාර්ක් කලාපීය විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරුන්ගේ තෙවන රැස්වීම හා සමාන්තරව පැවැත්වූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැස්වීම. බංග්ලාදේශය, ඩකා (2013 මාර්තු 6 – 7)

6. ජී. ඒ. එස්. ප්‍රේමකුමාර - සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ප්‍රජා දැනුවත් කිරීම් පිලිබඳ සංචාරය, ශ්‍රී ලංකා ජර්මානු සංයුක්ත සංවර්ධන මණ්ඩලය, දකුණු කොරියාව (2013 මාර්තු 31 සිට අප්‍රේල් 6).

7. එම්. ආර්. ඩී. එම්. තිලකසිරි - KRISS සඳහා සහභාගී විය, ක්‍රමාංකනය පිලිබඳ UNIDO පුහුණු වැඩසටහන, සංවිධානය කරන ලද්දේ UNIDO හා KRISS සංවිධානය වෙතින් කොරියාවේදී (2013 අප්‍රේල් 15-25).

8. ඊ. එන්. විජේවීර - ජපාන රජය වෙතින් පිරිනමන ලද මොන්බුකගස්තුෂා ශිෂ්‍යත්වය, ජපානය (2013 අප්‍රේල් - 2015 මාර්තු දක්වා).

9. ඉල්මී හේවාපුලිගේ - චීනයේ ශැංග්හයි හි ආහාර විකිරණශීලීව ගුණාත්මක හා තත්වයෙන් ඉහලවම (සෞඛ්‍ය ආරක්ෂිත) පවත්වා ගැනීම සඳහා යහපත් පුරුදු වැඩමුළුව, චීනය (2013 මැයි 6 – 10)

10. නිසල ගුණසේකර - සංචාරක විද්‍යාඥයින් සඳහා පැවති වැඩසටහන, ගුලේප් විශ්ව විද්‍යාලය, කැනඩාව (2013 ජූනි 29 - සැප්තැම්බර් 29 දක්වා)

11. එන්. පී. ලියනවඩුගේ - උසස් තාක්ෂණය සඳහා ද්‍රව්‍ය - 7 වන අන්තර්ජාතික සම්මන්ත්‍රනය, සිංගප්පූරුව (2013 ජූනි 30 - ජූලි 5 දක්වා)

12. ඩබ්. ආර්. කේ. ෆොන්සේකා - COMSAT හා ICCES සංවිධානය මගින් පවත්වන ලද 'උග්‍ර කාලගුණ තත්වයන්' තේමාව යටතේ පවත්වන ලද අන්තර්ජාතික වැඩමුළුව, චීනයේ බීජිංග් (2013 ජූලි 12 – 14 දක්වා)

## ධාරිතා වර්ධන හා ඵලදායිතා ප්‍රවර්ධනය

13. ටී. එන්. පී. කේ. පීරිස් හා ටී. ජී. එන්. බී. කරුණානි - 'භාවිතයට ගණුලබන ස්ථානයේදීම උපකරණ ක්‍රමාංකනය' මාලදිවයින් ආහාර හා ඖෂධ අධිකාරිය, මාලදිවයින (2013 ජූලි 13 – 16)

14. ඩී. එස්. සමරවික්‍රම - 'පලතුරු ඉදවීම වැලැක්වීම සඳහා මිශ්‍රිත ද්‍රව්‍යයක් ප්‍රවර්ධනය' කැනඩාවේ ගුලේප් විශ්ව විද්‍යාලය වෙතින් සංවිධානය කල පර්යේෂණ ප්‍රදර්ශක වැඩසටහන (2013 ජූලි - අගෝස්තු 10 දක්වා)

15. අයන්තිකා ප්‍රනාන්දු - කැනඩා ගුලේප් විශ්ව විද්‍යාලය මගින් සංවිධානය කල සංචාරක විද්‍යාඥයින්ගේ වැඩසටහන (2013 ජූලි 13 - ඔක්තෝම්බර් 14)

16. සමන්ත මැදගේ - දියුණුවන රටවල් සඳහා ආහාර සැකසුම හා උපකරණ චීනයේ CNRIFFI (2013 අගෝස්තු 15 - සැප්තැම්බර් 3)

17. ඉල්මී හේවාජූලිගේ - ජාන ප්‍රකාශිත විශ්ලේෂණය, කැනඩාවේ ගුලේප් විශ්ව විද්‍යාලයේ පැවැත් වූ පුහුණුව සඳහා සහභාගී විය (2013 අගෝස්තු 18 – 29 දක්වා)

18. ජී. ඒ. එස්. ප්‍රේමකුමාර - 'ඖෂධ ශාස්ත්‍රය හා ජීවන විද්‍යා තාක්ෂණ සමුළුව' එක්සත් ජනපදයේ, මැසචුසෙට්ස් (2013 අගෝස්තු 25 – 29)

19. ඊ. එම්. එස්. ඉසන්කා - ව්‍යාපාර පර්යේෂණ ක්‍රම හා දත්ත විශ්ලේෂණය ITEC වැඩසටහන, ව්‍යවසායක සංවර්ධන ආයතනය, හයිද්‍රාබාද්, ඉංදියාවේ පැවති පුහුණු වැඩසටහනට සහභාගී විය (2013 ඔක්තෝම්බර් 26 - සැප්තැම්බර්)

20. ඉල්මී හේවාජූලිගේ - ද්‍රාම ක්‍රියාවලියේදී ගුණාත්ම කළමණාකරණය අන්තර්ජාතික සම්මන්ත්‍රනය සඳහා සහභාගී විය, ක්‍රැන්ෆීල්ඩ්, එක්සත් රාජධානිය (2013 සැප්තැම්බර් 2 – 5)

21. ජේ. කේ. ආර්. ආර්. සමරසේකර - ආසියානු චේවැල් හා උණ වැඩමුළුව, අන්තර්ජාතික උණ හා චේවැල් ජාලය - නව දිල්ලිය, ඉංදියාව (2013 සැප්තැම්බර් 2 – 5)

22. අයි. ආර්. එම්. කෝට්ටේගොඩ - 'නිණිති තාක්ෂණ සංකල්පය ව්‍යාපාර සංවර්ධනයට' අන්තර්ජාතික වැඩමුළුව, NAMS&T මධ්‍යස්ථානය, ඉංදුනීසියාව (2013 ඔක්තෝම්බර් 2 – 5)

23. එන්. අමුණුගොඩ - අන්තර්ජාතික උණ හා චේවැල් ජාලය මගින් සංවිධානය කල 'උණ, අගය වැඩි කිරීමේ ද්‍රාව සංවර්ධනය', චීනය (2013 ඔක්තෝම්බර් 9 – 23)

## ධාරිතා වර්ධන හා ඵලදායිතා ප්‍රවර්ධනය

24. රම්‍යා පිටිපනආරච්චි - 'සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම වේදයක් ලෙස විකිරණශීලී භාවිතය යහපත් පෙල පුරුදු ලෙස භාවිතය', IAEA/RCA විධායක කළමණාකරණ රැස්වීම, මැලේසියාවේ, ක්වාලාලාම්පූර් (2013 ඔක්තෝම්බර් 28 – 31)

25. උපේඛා රාජවර්ධන - පූර්ණ ගුණාත්ම කළමණාකරණය හා ISO 9001 : 2008/4001-2004/BS7799 හා සිග්මා (TQM), ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් සඳහා, යුසුෆ්ගුඩා, හයිද්‍රාබාද්, ඉංදියාව (2013 නොවැම්බර් 20 – 27)

26. ජේ. කේ. ආර්. ආර්. සමරසේකර - ධාන්‍ය හා පලතුරු පාදක නිෂ්පාදන තුලින් මානව ආහාර හා පෝෂණීය සුරක්ෂිතතාව, ඉන්දු ලංකා ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘතිය

27. වසුන්දරා දිවිසේකර - සම ප්‍රධාන පරීක්ෂක ලෙස ක්ෂුද්‍රජීවීමය ප්‍රමිතිකරණ කෙටුම්පත සැකසීම - අන්තර්ජාතික ධාන්‍ය පර්යේෂණ ආයතනය අර්ධ ශුෂ්ක සර්ම කලාපීය සමුළුව (ICRISAT) පටන්චේරු, ඉංදියාව (2013 නොවැම්බර් 22 - නොවැම්බර් 6)

28. උදයානි බිංදුහේවා හා ඉල්මී හේවාජුලිගේ - තායිලන්ත ආහාර හා බීම වර්ග ක්ෂේත්‍රය හා ආහාර සුරක්ෂිතතා සමුළුව හා අධ්‍යයන චාරිකාව, තායිලන්තය (2013 නොවැම්බර් 25 - දෙසැම්බර් 4)

29. පූර්ණිමා ජයසිංහ - ආසියා පැසිපික් අංකන පුස්තකාල අන්තර්ජාතික සමුළුව, බැංගලෝර්, ඉංදියාව (2013 දෙසැම්බර් 9 – 11 දක්වා)

### දේශීය පුහුණු වැඩසටහන්

විවිධ දේශීය ආයතනයන්හි පවත්වන ලද පුහුණු වැඩසටහන් සඳහා ආයතන සේවකයින් 150 කට අධික සංඛ්‍යාවක් සහභාගී වූහ. වැඩමුළු, සම්මන්ත්‍රණ හා වෙනත් පුහුණු වැඩසටහන් ගණනින් 50 කට අධිකය.

# නව ප්‍රවණතා

## ධාන්‍ය හා පලතුරු පාදක සහජීවක ගුණ හා පෙරජීවක ගුණ සහිත පෝෂණීය ආහාර මගින් සෞඛ්‍ය නංවාලිය හැකි නිෂ්පාදන

ආහාර මාර්ගයේ ස්වාභාවිකව ශරීරයට හිතකර ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය නංවාලීමට අවශ්‍ය සහජීවක සංයෝගයන් ප්‍රවර්ධනය සඳහා පෙරජීවක ආහාර සංගටක මහෝපකාරී වේ. සහජීවක සංයෝග පිළිබඳව ඇති දැනුම පුළුල් වෙමින් පැවතියද පෙරජීවක පිළිබඳව ඇති උනන්දුව අව ප්‍රමාණව පවතී. ආමාශගතව ජීවත්වන ක්ෂුද්‍රජීවී සමූහයන්ගේ සංයුතිය හා වෙනස්වීම් උචිත අයුරින් පවත්වාගැනීම සඳහා පෙරජීවක සංයෝග වැදගත් වේ. මෙම අධ්‍යයනයේ අරමුණ වනුයේ මෙනේරි හා කෙසෙල් විශේෂ 4 ක් භාවිතාකොට ක්‍රියාකාරී ආහාර වාණිජ වශයෙන් නිෂ්පාදනය කිරීමට ඇති හැකියාව විමර්ෂණය කිරීමයි.

## තෙබු ශාකය භාවිතයට ගෙන ක්ෂණික බීම වර්ගයක් හා ඖෂධීය තේ නිෂ්පාදනය හා එහි ජෛවව ක්‍රියාකාරීත්වය විමර්ෂණය කිරීම

ආහාර පුරුදු අතර සුවිශේෂී ප්‍රවනතාවයක් ලෙස වැඩි වැඩියෙන් ඖෂධීය මෙන්ම ක්‍රියාකාරී ආහාර රුචිකත්වයක් ඇති නිෂ්පාදන ලෙස භාවිතයට ගැනීමේ රටාවක් වර්තමානයේදී දක්නට ඇත. වෙළඳපොල අධ්‍යයනය කිරීමේදී තෙබු (*Costus specious* S. Thebu වල් ඉඟුරු) වෙළඳපොළෙහි දක්නට නොලැබුවද එහි වැදගත් ඖෂධීය ගුණාංග සහිතය. එහෙයින් තෙබු ශාකය භාවිතාකොට වාණිජ වශයෙන් නිෂ්පාදනය කළහැකි ක්ෂණික බීම විශේෂයක් හා ඖෂධීය තේ පානයක් නිෂ්පාදනය කොට එහි ජෛව ක්‍රියාකාරීත්වය විමර්ෂණයට භාජනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.

## පිස්සු බලු රෝගයට එන්නතක් DNA අනුසාරයෙන් නිෂ්පාදනය

දැනට භාවිතයේ පවතින පිස්සු බලු රෝගයට භාවිතා කරනු ලබන එන්නත් සුනඛයන් සඳහා භාවිතා කරනු ලබන එන්නත් වන අතර එය ගබඩා කිරීම සඳහා තිබිය යුතු ශීත කාමර හෝ එවන් සංකීර්ණ නිෂ්පාදන ක්‍රියාවලියක් නොමැතිව ඉතා ස්ථායී මෙන්ම මහා පරිමාණයෙන් පහසුවෙන් DNA එන්නත් නිෂ්පාදනය කල හැක. ශ්‍රී ලංකාව වාර්ෂිකව ආසන්න වශයෙන් රු. මිලියන 50 ක පමණ මුදලක් පිස්සු බලු රෝගය වැළැක්වීම හෝ පාලනය සඳහා වියදම් කරයි.

එබැවින් DNA පිස්සු බලු වෛරසය මැඩපැවැත්වීමේ ක්‍රියාවලිය ආරම්භකොට ප්‍රථම අත්හදාබැලීමේ කටයුතු සිදුකරන ලදී.

# නව ප්‍රවණතා

## ගව පාලනයේදී ජනිතවන අප ජලය නිර්මාණිත තෙත් බිම් තාක්ෂණ භාවිතය සඳහා ප්‍රතිකර්ම කිරීම

ගව පාලනය මේ වනවිට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් අතර ග්‍රාමීය මට්ටමින් ජනප්‍රිය වී ඇත. කෙසේ වුවද එමඟින් ජනිත වන අපජලය නිසියාකාර ප්‍රතිකර්ම නොකරන අවස්ථාවන්හිදී පාරිසරික ගැටළු මතු කිරීමට හේතු සාධක වී ඇති අතර එසේ ප්‍රතිකර්ම කිරීම සඳහා යෙදවිය යුතු උසස් තාක්ෂණය සඳහා අධික ප්‍රාග්ධන වියදම් සහිත වීම හේතුවෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හට දැරිය නොහැකි තත්වයක පවතී. එබැවින් එම ක්ෂේත්‍රයේ ව්‍යවසායකයින් සඳහා ගව පාලනයේදී පිරිවැය අවම තාක්ෂණ ක්‍රමවේධයක් ඉදිරිපත් කල යුතුව ඇත.

ගව පාලන අපජලය බැහැර කිරීමේ සාර්ථක ක්‍රමවේධයක් නිර්මාණිත තෙත් බිම් සංකල්පය භාවිතයෙන් හඳුන්වාදීමේ වැඩපිළිවෙලක් කාර්මික තාක්ෂණ ආයතනයේ පර්යේෂණ විද්‍යාඥයින් හා පාරිසරික තාක්ෂණ අංශයේ ඉංජිනේරුවන්ගේ අධ්‍යයනයට ලක්කොට ඇත. අපජලයේ ඇති අධි ප්‍රමාණ නයිට්‍රජන් හා පොස්පරස් ඉවත් කිරීමට භාවිතා කල හැකි ජෛව විශේෂයක් හඳුනාගැනීමේ ආරම්භක පියවරක් ලෙස නියමු අධ්‍යයනයන් දියත් කොට ඇත. ක්‍රියාත්මක වෙමින් පවත්නා මෙම ව්‍යාපෘතිය තුලින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ලෙස ගව පාලනයේ යෙදී සිටින්නන් වෙත ග්‍රාමීය වශයෙන් පවත්නා ඉඩකඩම් භාවිතයට යොදාගත හැකි දැරිය හැකි වියදමකින් ක්‍රියාත්මක ගව පාලන අපජල ප්‍රතිකර්ම ක්‍රමවේධයක් භාවිතයට ගතහැකි වනු ඇත.

## කෘෂි රසායන නිෂ්පාදන ඇසිරීමේ කර්මාන්තායතන සඳහා අපජල ප්‍රතිකර්ම ක්‍රමවේධයක් ලෙස ප්‍රකාශ උත්ප්‍රේරක ප්‍රතිකාරකය නිෂ්පාදනය කිරීම

කෘෂි රසායන මිශ්‍රණයන්ගේ ක්‍රියාකාරී සංඝටකයන් විනාශ කිරීමේදී ජල විච්ඡේදනය පමණක් ප්‍රමාණවත් නොවේ. ඔක්සිකරණය මඟින් මෙම සංඝටක විනාශ කිරීම සාර්ථකව ක්‍රියාත්මක කල හැකි වුවද ජෛව විද්‍යාත්මක ඔක්සිකරණ ක්‍රියාවලියේදී ඇතිවන රසායනික ඔක්සිකාරක සංඝටක ශේෂ වශයෙන් පරිසරයට එකතුවීම හේතුවෙන් එය පාරිසරික දූෂණය ඇතිවීමට තවත් හේතුවක් ලෙස පවතී. එහෙයින් සාර්ථක ලෙස ස්වභාවික හිරුඑළිය මගින් ප්‍රකාශ උත්ප්‍රේරණ ඔක්සිකරණය මගින් කෘෂි රසායන නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ අපසඳන ජල ප්‍රතිකර්මය සඳහා මෙය භාවිතයට ගත හැක. මේ සඳහා ප්‍රතිකාරකයක් ප්‍රවර්ධනය කර ඇති අතර එය සාධාරණ මිලකට භාවිතයට යොදාගැනීමට හැකිවනු ඇත.

# නව ප්‍රවණතා

## වාතයේ විසුරුම් ලෙස පවත්නා ලවණ ප්‍රමාණ මැනීම

පාලම් ඉදිකිරීමේදී භාවිතයට ගනු ලබන අමුද්‍රව්‍ය තෝරාගැනීමේදී වායුගෝලීය ලවණ ප්‍රමාණයද වෙනත් සාධක ගනණාවක් අතර වැදගත් සාධකයකි. අධිවේගී මාර්ග ඉදිකිරීමේදී විවිද ස්ථාන 19 ක පවත්නා වායුගෝලීය ලවණ ප්‍රමාණය දැනගැනීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය කාර්මික තාක්ෂණ ආයතනයේ සහාය පැතීය. කාර්මික තාක්ෂණ ආයතනය මෙම ව්‍යාපෘතිය අදියර 2 කින් දියත් කරන ලදී. පළමු අදියරේ සෑම මාස 2 කට වරක් මිනුම් ලබාගන්නා ලදී. නියැදි ලබාගත් ස්ථාන අතුරින් මලකඩ කෑමට සාධක නොමැති/අවම සාධක සහිත ප්‍රදේශ පළමු වසරේදී නිරීක්ෂණයට භාජනය කරන ලදී. පවත්නා ලවණ ප්‍රමාණයන්ගේ මට්ටම් අනුව 2 වන අදියර ක්‍රියාවට නැගීමට නියමිතය.

මෙම අධ්‍යානය මගින් පාලම් මලකෑම අවම ලෙස පවත්වා ගැනීම සඳහා ගතයුතු වැලකුම් ක්‍රියාමාර්ග භාවිතයට ගතයුතු ලෝහ වර්ග පිළිබඳව තීරණය කිරීමටද හැකියාව ලැබෙනු ඇත.

## ලෝහමය ද්‍රව්‍යයන් මලකෑමට ලක්වන ආකාරය

ලෝහ මලකෑම පාරිසරික තත්වයන් මත රඳා පවතින අතර එමඟින් පිරිවැය කෙරෙහි ඇතිකෙරෙන බලපෑම ආර්ථික ගැටළුවකි. ඉදිකිරීමට පෙර පවත්නා පාරිසරික තත්වයන් අධ්‍යයනය කොට මලකෑමට බලපාන සාධක හඳුනාගැනීම වැදගත්ය.

ශාස්තපති උපාධියක් දක්වා කෙරෙන පර්යේෂණ අධ්‍යයනයක් තුලින් ලෝහ මලකෑම පිළිබඳව මෙන්ම ඒ සඳහා බලපාන පාරිසරික තත්වයන් හඳුනාගැනීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනය සැලසුම් කර ඇත. මෙම අධ්‍යයනය මගින් මලකෑම හා පාරිසරික තත්වයන් අතර ඇති සම්බන්ධතාව ගණිතමය සූත්‍රයක් ලෙස ස්ථාපිත කෙරෙනු ඇත.

## ස්වයං පවිත්‍රක කොන්ක්‍රීට් මතුපිට

කොන්ක්‍රීට් තට්ටුවක ජීවන කාලය තුල එය දුරු පැහැ ගැන්වීමට හේතුවන කාබනික හා අකාබනික මෙන්ම පුස් වර්ග හේතුවෙන් කෙරෙන බලපෑම බරපතලය. කොන්ක්‍රීට් මතුපිටි පෙනුම ආරක්ෂා කරගැනීම සඳහා නිරංතරව කෙරෙන පවිත්‍ර කිරීම අපහසු කාර්යක් වුවද එය සිදුකල යුත්තකි. මෙයට විසඳුම වනුයේ ස්වයං පවිත්‍රක කොන්ක්‍රීට් නිෂ්පාදනයයි. ප්‍රකාශ උත්ප්‍රේරක හා උසස් ජලවිච්ඡේදක තත්වයන් පුස් හා රසායනිකව සිදුවන දුරු පැහැගැසීමට ප්‍රතිරෝධකයක් ලෙස කටයුතු කරයි.

# නව ප්‍රවණතා

ස්වයං පවිත්‍රක කොන්ක්‍රීට් පිළිබඳව කාර්මික තාක්ෂණ ආයතනයෙහි සිදුකල පර්යේෂණ තුලදී ඔක්සයිඩ හා සිලිකා අතර පවත්වා ගතයුතු නිවැරදි අනුපාතය හඳුනාගනිමින් ප්‍රකාශ උත්ප්‍රේරණ ක්‍රියාව උපරිමව පවත්වා ගැනීමට හා එය ටයිටේනියම් ඔක්සයිඩ හා සිලිකා සමඟ කොන්ක්‍රීට් මතට ගැල්වීම පිළිබඳව අධ්‍යයන කටයුතු සිදුකරමින් ඇත.

## AC වෝල්ටීයතාව සඳහා ප්‍රාථමික ප්‍රමිතියක් - ක්‍රමාංකන හා මිණුම්

විවිධාකාර පාරිසරික තත්ත්ව හේතුවෙන් මිණුම් පිළිබඳව ඇති නිරවද්‍යතාව කාලය සමඟ පරිහානියට පත් වේ. මෙම කරුණ ඉතා සරල මිණුම් උපකරණයක් මත රසදිය උෂ්ණත්වමානයේ සිට ඉතා සංවේදී මිණුම් උපකරණ තෙක් බලපායි. එහෙයින් මිණුම්කරණ විද්‍යාව හෝ ක්‍රමාංකනය ජීවිතයේ සියලු කටයුතු රෝගියෙකුගේ ශරීරයේ උෂ්ණත්ව මිණුම් ගන්න අවස්ථාවේ සිට අන්තර්ජාතික වෙළදාම දක්වා විහිදී පවතී. මිනුම්කරණයේ ඇති වැදගත්කම මනාව අවබෝධ කල කාර්මික තාක්ෂණ ආයතනය කාර්මික මිණුම් පිළිබඳව කටයුතු කිරීම සඳහා වෙනත් අංශයක් ස්ථාපිත කරන ලදී.

ප්‍රත්‍යාවර්තක (AC) වෝල්ටීයතාවය මැණීම සඳහා ප්‍රාථමික ප්‍රමිතියක් කාර්මික තාක්ෂණ ආයතනයේ කාර්මික මිණුම් රසායනාගාරය අංකිත සංඥා සැකසුම් (DSP) පාදක තාක්ෂණ ක්‍රමවේධයක් ප්‍රවර්ධනය කර ඇත. DSP පාදක අනුසාර ප්‍රාථමික මිණුම් ක්‍රමය ජර්මනිය, ඇමෙරිකා හා කොරියා වැනි ජාතික මිණුම්කරණ ආයතන පිහිටුවා ඇති රටවල පමණක් දක්නට හැක. එම තත්වයේ ඇති ආයතනයකින් උද්දීපනය වී ප්‍රවර්ධනය වූ තාක්ෂණය පෙරහුරු කරගනිමින් කාර්මික මිණුම් රසායනාගාරයේ විද්‍යාඥයින් විසින් උසස් තාක්ෂණික උපකරණ අන්තර්ග්‍රහණ පරිගණක සමඟ ඒකාබද්ධ කොට මෙම මිණුම් උපකරණය හඳුන්වා දී ඇත.

ඉහත සේවා ද්විත්වයම වෝල්ටීයතාව නිවැරදි මැන ගැනීම සඳහා අපේක්ෂාවෙන් සිටින කර්මාන්තකරුවන් වෙත ලබාගත හැකි අතර එමඟින් පරිගණක අන්තර්ග්‍රාහක ඉහල තාක්ෂණය සහිත උපකරණ සඳහා භාවිතා කල හැක.

## ආහාර භෝග කෘමීන් පාලනය සඳහා Bt

පලතුරු හා එළවලු භෝග හානි පමුණුවන ඉහඳ පණුවන් පාලනයට යොදාගත හැකි ශ්‍රී ලාංකික Bt විශේෂ 3 ක් හඳුනාගෙන ඇත. පරීක්ෂාව සඳහා ස්ට්‍රෝබෙරි ශාකය තෝරාගත් බැවින් වී හා පලතුරු සඳහාද භාවිතා කල හැකි මෙන්ම විශාල පරාසයක් තුල ක්‍රියාකාරී ක්ෂුද්‍රජීවීමය කෘමිනාශකයක් ලෙස යොදාගතහැකි තවත් විශේෂයක් ප්‍රවර්ධනය කිරීමට හැකිවී ඇත.

# නව ප්‍රවණතා

## ට්‍රයිකොසන්තින් කුකුමරීනා යොදාගනිමින් ආමාශගත රෝග සඳහා ස්වභාවික සංයෝගයක්

ආමාශගත රෝග සඳහා කෂායක් ලෙස ශාක විශේෂ 3 ක් යොදා කෙරෙන ඖෂධ මිශ්‍රණයක අඩංගු එක් ශාකයක් වනුයේ ට්‍රයිකොසන්තින් කුකුමරීනා ශාකය තුල ආමාශගත රෝග මැඩපැවැත්වීමේ හැකියාව පරීක්ෂාවට ලක්කෙරිණ. මෙම ශාකයේ පවත්නා අධික ආමාශගත රෝග වැළැක්වීමේ හැකියාව තනි ශාකයක් වශයෙන් වුවද සාර්ථකව පවතින බව පෙනීයාමෙන් අනතුරුව එම ශාකය පමණක් යෙදු ක්ෂණික බීමක් හා සමාන තවත් නිෂ්පාදන ගණනාවක්ද එළිදැක්වෙමින් පවතී.

## නව පරීක්ෂණ ක්‍රම ප්‍රවර්ධනය

- රැලි සහිත ඇදෙනසුළු මෘදු නල සඳහා ප්‍රවණතා පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂණය.
- සීනු ආකාර ප්ලාස්ටික් උපාංග පතලිවීම පරීක්ෂා කිරීම සඳහා ප්‍රත්‍යාවර්තන ප්‍රමාණය මැණීම.
- භෞමික ආරක්ෂාව සඳහා භාවිතා කෙරෙන දැල් තුල පවත්නා යාන්ත්‍රික හා භෞමික ගුණාංග පරීක්ෂාව.
- වැඩිදියුණු කර නිෂ්පාදිත තුනී ලෑලි පැනල කාලගුණ විෂමතාවනට ඔරොත්තු දීමේ හැකියා පරීක්ෂණය.
- ශ්‍රී ලංකා දුම්රිය පිරිවිතර අනුව දුම්රිය පරිවාරක ද්‍රව්‍ය ස්ථායීතා පරීක්ෂාව.
- නව දේශීය නිෂ්පාදනයක් වන දැව ඇලවීමට භාවිතා කරන මැලියම් විශේෂයක් පරීක්ෂාව, සවිවීමේ ශක්තිය පරීක්ෂාව හා වෙළඳපොල පවත්නා මැලියම් වර්ග සමඟ සංසන්දනය කිරීම.
- ලෝහ නල උපාංග පීඩන තත්වයකට ඔරොත්තුදෙන ප්‍රමාණය පරීක්ෂා කිරීම.
- විදුලිබල සම්ප්‍රේෂණය සඳහා භාවිත දැව ආධාරකයන්හි යෝග්‍යතාව පරීක්ෂාව.
- තාරමය තීරු ලෙස යොදාගන්නා ද්‍රව්‍යයන්ගේ සවි හා ශක්ති ප්‍රමාණ, ඇඩි උෂ්ණත්වයට ස්ථායීබව, අව උෂ්ණත්වයන්හි නමෙනසුලුබව, දියවීමට ඇති බාධක ප්‍රමාණ, කැඩී බිඳී යාමට එරෙහිව ඇති බලපෑම, ජලය උරාගන්නා හා හරහා ගමන් කරන ප්‍රමාණ නිර්ණය කිරීම.

# සංයුක්ත දැනුවත් කිරීම්

## ප්‍රදර්ශන

කාර්මික තාක්ෂණ ආයතනය සාර්ථක ලෙස ප්‍රදර්ශන ගනණාවක් සඳහා සහභාගී වී වාණිජ නිෂ්පාදන මෙන්ම ආයතනය විසින් නිෂ්පාදිත වෙනත් නව නිෂ්පාදන ප්‍රදර්ශනය කරන ලදී.

- කාන්තා දින සමගාමී ප්‍රදර්ශනය (6-7 මාර්තු 2013, මොනරාගල)
- දැයට කිරුල (23-30 මාර්තු 2013, අම්පාර)
- කිතුලක වරුණ (5-7 අප්‍රේල්, සුදර්ශී ශාලාව, කොළඹ)
- ආයුර්වේද එක්ස්පෝ (12-13 ජුලි, බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ)
- අධ්‍යාපන ප්‍රදර්ශනය (සැප්තැම්බර් 2013, අනුලා විද්‍යාලය, නුගේගොඩ)
- අධ්‍යාපන ප්‍රදර්ශනය (22 නොවැම්බර් 2013, සීතාවක මධ්‍ය විද්‍යාලය, අවිස්සාවේල්ල)
- හෙල්ත් ෆියෙස්ටා (නොවැම්බර් 2013, කැලණිය විශ්ව විද්‍යාලය)
- සහසක් නිමැවුම් (30 නොවැම්බර් 2013, බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ)
- තාක්ෂණ වෙළඳ දැක්ම (14-15 දෙසැම්බර්, බන්දාරනායක සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ)

## විද්‍යා හා තාක්ෂණ ප්‍රකාශනයන්හි පල වූ ලිපි

- සුවය සඟරාව (ජුනි වෙළුම) කාර්මික තාක්ෂණ ආයතනීය ආහාර තාක්ෂණ අංශයෙන් ප්‍රකාශිත.
- ශ්‍රී ලංකා ආහාර සුරයඹල ක්ෂිතතාව පිලිබඳ රෙගුලාසි ආහාර අලෙවිකරණය හා තාක්ෂණය සඟරාව (ශ්‍රී ලංකාවේ පල වූ)
- ශ්‍රී ලංකාවේ සියඹලා ඇට ආහාර තාක්ෂණ යෙදවුම් සඳහා යොවුන් විද්‍යාඥයින්ගේ පදනම් පුවත් සඟරාව.
- ශ්‍රී ලංකාවේ අපද්‍රව්‍ය කළමණාකරණයේදී කාර්මික තාක්ෂණ ආයතනය සිදුකල කාර්යභාරය Geo Watch සඟරාවේ පලකරන ලදී.

# සංයුක්ත දැනුවත් කිරීම්

## කාර්මික තාක්ෂණ ආයතනයේ ක්‍රියාකාරකම් හා වෙනත් අවස්ථාවන් සඳහා මාධ්‍ය තුලින් ලද විකාශයන්.

1. කාර්මික තාක්ෂණ ආයතනය නව අධ්‍යක්ෂවරයෙකු පත් කරයි (ඩේලි මිරර් 11/01/2013)
2. ආවේණික සහල් සාම්පල පර්යේෂණ තුලින් නව බලාපොරොත්තුවක් භාවිතය මගින් බෝ නොවන රෝග ව්‍යාප්තිය පාලනය කිරීම (ඩේලි මිරර් 11/01/2013)
3. කාර්මික තාක්ෂණ ආයතනයේ නව අධ්‍යක්ෂ ලෙස පත්වෙයි (දිවයින 22/01/2013)
4. අඩ අන්වීක්ෂ පරීක්ෂාවට ලක් වේ - ගුණාත්මය හා කල්තබාගැනීම වැඩිදියුණු කිරීමට සාකච්ඡා පවත්වයි.
5. SWITCH ASIA – EU ඉදිරිපත් කල ඉලක්ක සපුරාගනී ( ඩේලි නිව්ස් 30/01/2013)
6. කිතුල් ගස් 10 කින් මසකට රුපියල් ලක්ෂයක් (දිනමිණ 07/02/2013)
7. කිතුල් මීරා හා පැණි සඳහා පවිත්‍රතාව පරීක්ෂා කිරීමට පරීක්ෂණ ක්‍රමයක් (ඩේලි නිවුස් 05/02/2013)
8. යුරෝපියානු මූල්‍යා ආධාර යෙදවූ ව්‍යාපෘති මල් ඵල (ඉරිදා ඔබ්සර්වර් 03/03/2013)
9. හොරෙන් ගෙන්වූ එතනෝල් ස්ප්‍රීතු වල වටිනාකම රුපියල් තුන් කෝටියකට වැඩියි (ලංකාදීප 04/04/2013)
10. සුරාබදු නිලධාරීන්ගේ අත්අඩංගුවට පත් කන්ටේනර් දෙකේ එතනෝල් තිබූ බව පරීක්ෂණයකින් තහවුරු වෙයි (දිනමිණ 04/04/2013)
11. ප්‍රවේගකාරී ආර්ථික සංවර්ධනයක් සඳහා ශ්‍රී ලංකාව නව ආරක තාක්ෂණය වැලඳ ගනී (22/04/2013)
12. ආනයනික කිරිපිටි හා කිරි ආහාර වල විකිරණ පරීක්ෂාව අකණ්ඩව සිදුකරනවා (දිවයින 14/05/2013)
13. ආනයනික කිරි පරීක්ෂාවට AEA - දිනපතා ෆයිනාන්ෂල් ටයිම්ස් 14/05/2013)
14. ආනයනික ආහාර තුල විකිරණශීලී තත්වයක් නොමැත (අයිලන්ඩ් 15/05/2013)
15. ආනයනික සීනි පරීක්ෂාව වහාම - ද සන්ඩේ ටයිම්ස් 2/6/2013
16. ඉදිරි පරම්පරාව සඳහා තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් - ITI වැඩමුලුව, ඩේලි මිරර් 10/6/2013
17. කාර්මික තාක්ෂණ ආයතනයේ ආහාර තාක්ෂණ අංශය
18. කැගල්ල වෛද්‍යවරයෙක් මදුරුවන් පලවා හැරීම සඳහා ශාකසාර ඖෂධයක් හදයි - දිවයින 3/7/2013

# සංයුක්ත දැනුවත් කිරීම්

19. වියලි කලාපීය ගොවීන්ගේ වකුගඩු ආසාදනය අධ්‍යයන කරන්නේ කවුද? අදිකාරි ආයතන පොහොර හා කෘමිනාශක හේතු නොවන බව පවසයි. සන්ඩේ ටයිම්ස් 17/7/2013
20. පර්යේෂණ ආර්ථිකය කරා දිව යෑම - ඉන්ටැලිකොන්ෆැබ් - අයිලන්ඩ් 18/7/2013
21. ගාල්ලේ ප්‍රතිචක්‍රීකරණ කම්හලෙන් විෂ රසායන නිකුත් වනවා දැ යි පරීක්ෂණ - විදුසර 24/7/2013
22. කිරිපිටි වර්ග 4 ක DCD සොයා ගැනේ : වාර්තාවක් - ඉරිදා ලංකාදීප 28/7/2013
23. රටින් ගෙනා කිරිපිටිවල විෂ රසායනික - ඉරිදා ලංකාදීප 28/7/2013
24. ආනයනික සීනි හා කිරිපිටිවල බැර ලෝහ සොයා ගෙන නැත. - ඩේලි මිරර් 27/7/2013
25. ආනයනික කිරිපිටි වර්ග 3 ක අහිතකර DCD : කාර්මික තාක්ෂණ ආයතනයේ පරීක්ෂණ තුලින් හෙලිවේ - අද 30/7/2013
26. ආනයනික කිරිපිටි පරීක්ෂාව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට - දිනමිණ 2/8/2013
27. වැලිවේරිය ජලය පරීක්ෂා අද හෙලි කරයි.- සන්ඩේ ඔබ්සවර් 4/8/2013
28. ඩයිසයනයිඩ් කලවම් වී තිබීම : ආනයනික කිරිපිටි තහනම් කෙරේ. GMOA රජයට පවසයි - අයිලන්ඩ් 2/8/2013
29. තොටිල්ල පැද්දීම, තෙවන ලෝකය වියලීමට කිරි දෙවීම - ඩේලි මිරර් 5/8/2013
30. කිරි බලපෑම - ඩේලි මිරර් 5/8/2013
31. DCD ප්‍රශ්නය හමුවේ දේශීය කිරි සඳහා ඇති ඉල්ලුම ඉහල යෑම - අයිලන්ඩ් 3/8/2013
32. ගෝලීය බොටියුසම් පැනය නවසිලන්ත කිරි යෝදයා ඉදිරිපත් කරයි. - සන්ඩේ ටයිම්ස් 4/8/2013
33. ෆොන්ටෙරා තම නිෂ්පාදන සුරකියි. - අයිලන්ඩ් 3/8/2013
34. කිරි ඩයිසයනයිඩ මගින් දූෂණය වේ. සෞඛ්‍ය අමාත්‍යාංශ ඉහල නිලධාරීන් අල්ලස් ගනී. GMOA - සන්ඩේ අයිලන්ඩ් 4/8/2013
35. කිරිවල DCD - පියවරක් ගැනීමට පෙර තවත් පරීක්ෂණ අවශ්‍යයි - සන්ඩේ ටයිම්ස් 4/8/2013
36. ආනයනික කිරිපිටි ආහාර පරිභෝජනයට ආරක්ෂිතයි. සෞඛ්‍ය අමාත්‍යාංශය. විෂ රසායනික පවත්නා හෙයින් අහිතකරයි. ITI සොයා ගනී. සැකසහිත DCD මිශ්‍රවීම පිළිබඳව ප්‍රධාන රාජ්‍ය ආයතන 2 ක් එකිනෙකට විරුද්ධව මත දෙකක. - සන්ඩේ අයිලන්ඩ් 4/8/2013

# සංයුක්ත දැනුවත් කිරීම්

37. වැලිවේරිය ජලය ITI විශේෂඥයින් පරීක්ෂා කරයි. - ඩේලි මිරර් 4/8/2013
38. ගෝලීය යෝධ පරිමාණ ADM , CTC හෝල්ඩිංග්ස් සමග එක්වේ. කොමනෙක්ස් ජෛවපාදක අධිකාර්යක්ෂම අවශෝෂක පොලිමර් නිෂ්පාදනයට - දිනපතා FT 26/8/2013
39. තත්ව සහතිකපත් වැඩමුලුවක් ITI පවත්වයි. - ඩේලි මිරර් 21/8/2013
40. කෝමාරිකා බීම වෙළඳපොළට - ලංකාදීප 25/8/2013
41. පිටකොටුවෙන් දූෂණය වූ බෝතල්වල ජලය සොයා ගැනේ. - ඩේලි මිරර් 6/9/2013
42. සත්ව ආහාර තත්වය හා ආරක්ෂාව - සිලෝන් ටුඩේ 2/9/2013
43. මෝස්තර ඇඳුම්, මෝස්තර පාවහන්, මීලඟට කුමක් ද? ඇයි මෝස්තර ...... - සන්ඩේ ටයිම්ස් 6/10/2013
44. කොලස්ටරෝල් නැති අලුත් බිත්තරේ - සිලුමිණ 20/10/2013
45. කාර්මික තාක්ෂණ පර්යේෂණ ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහායි - ඇමති පාඨලී චම්පික රණවක - දිනමිණ 25/10/2013
46. රසායනික අනතුරු වලක්වා ගැනීම - විදුසර 6/11/2013
47. ITI තම රසායනාගාර පහසුකම් ප්‍රවර්ධනය කරයි - ඩේලි මිරර් 20/11/2013
48. GMOA - තදබල ක්‍රියාමාර්ගයකට පිවිසෙයි. කල් තබා ගැනීමේ ද්‍රව්‍ය යෙදූ ආනයනික පලතුරු ශ්‍රී ලාංකිකයින් සැම අයුරකින්ම කරයි. සන්ඩේ අයිලන්ඩ් 2/12/2013
49. කරවල හා උම්බලකඩ ආනයනය අඩුවී තිබෙනවා - දිනමිණ 11/12/2013
50. පාරම්පරික සහල් වර්ගවල පිලිකා, දියවැඩියාව ආදී රෝග නිවාරනික සංඝටක ඇති බව පර්යේෂණයකින් සොයා ගනී. - රිවිර 18/12/2013

# කර්මාන්ත සඳහා තොරතුරු

## කර්මාන්ත හා පර්යේෂණ සඳහා සහාය

ආයතනයේ සේවක මණ්ඩලය වෙත මෙන්ම රටෙහි වෙනත් විද්‍යාඥයින් හා කර්මාන්තකරුවන් සඳහා සේවා සැපයීමේ කටයුත්ත තොරතුරු සේවා මධ්‍යස්ථානය (ISC) නිරන්තරව ඉටු කලේය. අගය වැඩි තොරතුරු සේවා, පරිශීලන පහසුකම් හා අන්තර්ජාල පාදක දත්ත සඳහා පිවිසීමට සියලු සේවා අභිලාෂීන්ට අවස්ථාව සපයන ලදී. තවද මධ්‍යස්ථානය විසින් කර්මාන්ත හා වෘත්තීය ආයතන වෙත පර්යේෂණ තොරතුරු හා සේවා කළමනාකරණය පිලිබඳ පුහුණු වැඩසටහන් ද පවත්වන ලදී. ප්‍රමුඛ සේවාවන් සපයන ලද්දේ සාමාජිකත්වය ලද සේවාලාභීන් වෙත පමණි.

පසුගිය වසරේත් ජෛව තාක්ෂණය හා නිනිති තාක්ෂණය වැනි නව තාක්ෂණයන් ආවරණය වන පරිදි විද්‍යා හා තාක්ෂණ තොරතුරු වඩ වඩා එක්රැස් කරමින් මධ්‍යස්ථානයේ ග්‍රන්ථ හා පරිශීලන මෙවලම් යාවත්කාලීනව පවත්වා ගෙන යන ලදී. කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය අතිරේක විෂය ධාරාවන් ව්‍යාපාරික වශයෙන් වැදගත් වන සංඛ්‍යානය, නිර්දේශ හා රෙගුලාසි, නිෂ්පාදන හා වෙළඳ රටාවන් ආදිය ද ප්‍රවර්ධනය කරන ලදී. කාර්මික තාක්ෂණ ආයතනයේ ප්‍රකාශන ඩිජිටල් තාක්ෂණිකව ජාතික ඩිජිටලයීය වැඩසටහන ජාතික විද්‍යා පදනමේ සහාය ඇතිව සිදු කරන ලදී. පිටපත් කරන ලද ලියකියවිලි D – space මෘදුකාංගයෙන් පරිගණකගත කොට ඩිජිටල් තැන්පත් පාදක දත්ත හා යාකොට කාර්මික තාක්ෂණ ආයතනයීය වෙබ් අඩවිය වෙතට ද සම්බන්ධ කරන ලදී.

## සේවාලාභීන්ගේ තොරතුරු

තොරතුරු සේවා මධ්‍යස්ථාන සාමාජිකයින් හට ණය සහන පදනම යටතේ සේවා සැපයීම නිරන්තරව සිදු කල අතර පරිශීලන පහසුකම් සියලුදෙනා වෙත විවෘතව භාවිතා කිරීමට ඉඩ ප්‍රස්ථා සපයන ලදී. විමසුමට ලක් කෙරෙන කාලපරිච්ඡේදය තුල පුස්තකාලය භාවිතා කල සංඛ්‍යාව ඉහල ගොස් ඇති අතර එය 1096 ක් විය. ඉන් 50% කට වැඩි ප්‍රමාණයක් උපාධි අපේක්ෂක හා පශ්චාත් උපාධි අපේක්ෂකයන් විය. නව සාමාජිකත්වය ලබා ගත් අය අතර 9 දෙනෙකු තැන්පත් 3 දෙනෙකු පුද්ගල හා 1 අයෙකු සංයුක්ත රන් සාමාජිකත්වය ද ලබා වසර තුල මුලු ගණනින් 13 දෙනෙකු සාමාජිකත්වය ලබා ගෙන ඇත. ප්‍රමිති ලේඛණ හා ග්‍රන්ථ වැඩි වශයෙන් භාවිතයට ගත් පොත්පත් වූ අතර ඉන් 550ක් අභ්‍යන්තර කාර්ය මණ්ඩලය විසින් ද 250 ක් පොදු මහජනතාව විසින් ද භාවිතයට ගෙන ඇත. අන්තර් පුස්තකාල ණය පදනම යටතේ ද සාමාජිකත්වය හිමි අයට සේවා සපයන ලදී.

# කර්මාන්ත සඳහා තොරතුරු

## විශේෂිත විමසුම් සේවා

100 කට වැඩි තාක්ෂණ විමසීම් වසර තුල දී ඉටු කරන ලදී. එම විමසීම් අතුරින් වැඩි ප්‍රමාණයක් ආහාර හා කෘෂිකාර්මික (46) විෂයානුබද්ධ දෙවනුව ද්‍රව්‍ය (17) හා පාරිසරික හා සෞඛ්‍යය (10) කි. 7 බැගින් රසායන විද්‍යා හා ඖෂධ හා ඖෂධ පැලෑටි පිළිබඳව සිදු කරන ලදී. වෙනත් ක්ෂේත්‍ර වනුයේ බලශක්ති, ඖෂධ ගුණාත්මක හා වාණිජ කටයුතු පිළිබඳවයි.

## මුද්‍රිත මාධ්‍ය මගින් තොරතුරු ප්‍රචාරණය

කාර්තුවකට වරක් ප්‍රකාශයට පත් කෙරෙන "ITI බුලටීන්" ප්‍රකාශනය මගින් කාර්මික තාක්ෂණ ආයතනය සිදුකල පර්යේෂණ එළි දැක් වූ අතර "SciTech in Brief" හා "Management Thought" ප්‍රකාශන මගින් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ නවතම සොයා ගැනීම් හා කළමනාකරණය පිළිබඳ තොරතුරු නිරන්තරව ප්‍රකාශයට පත් කල අතර ආයතන වෙබ් අඩවිය මගින් හා අන්තර්ජාලය හා බැඳි ITI – iNet වෙතින් ආයතනය තුල මෙම තොරතුරු සංනිවේදනය කරන ලදී.

විද්‍යා හා තාක්ෂණ හා බැඳි දේශීය පුවත්පත් තුල පලකල ලිපි ලේඛණ i-Net මගින් දිනපතා "The Press" මගින් විකාශනය කල අතර වැදගත් ලිපි සතිපතා පලකල NEWS DIGEST මගින් ද පල කරන ලදී. නව ප්‍රවනතා පිළිබඳව "Current awareness bulletin" මගින් සන්නිවේදනය කරමින් පර්යේෂණ කාර්ය මණ්ඩලයේ අවශ්‍ය ක්ෂේත්‍ර අලලා නිරන්තරව දැනුවත් කරන ලදී. ලද තොරතුරු සංනිවේදනය කිරීමේ දී ස්වයංක්‍රීය පරිගණක දාම හරහා (AOL ) හෝ මුද්‍රිත මාධ්‍ය යොදා පිටපත් ගැනීමේ අවශ්‍යතාව අනුව සපයන ලදී.

## දැනුම බෙදා ගැනීමේ සම්මන්ත්‍රන හා වැඩමුළු

විවිධ ව්‍යවසායකයින් හා සංනිවේදක වෘත්තිකයින් වෙත දැනුම බෙදා හැරීමේ අරමුණින් ISC මගින් සම්මන්ත්‍රණ නිරන්තරව පවත්වන ලදී. වසර තුල දී සම්මන්ත්‍රණ 4 ක්, දෙදින වැඩමුලුවක් - "ඔබේ වෘත්තීය අරමුණු ඉටු කර ගැනීමට අවස්ථාවක්" "මීලඟ පරම්පරාවට සන්නිවේදන වෘත්තිකයන්", "ශ්‍රී ලංකාවේ සුවඳ විලවුන් කර්මාන්තය", "ඔබ දැනගත යුත්තේ කුමක් ද?" "ඝන අපද්‍රව්‍ය කළමනාකරණය" හා "ගුණාත්ම සහතිකකරණය" යන තේමා යටතේ පවත්වන ලදී. 200 කට අධික සන්නිවේදන සේවා, ව්‍යාපාර හා කර්මාන්ත ක්ෂේත්‍ර හා සම්බන්ධ අය මේ සඳහා සහභාගි වූහ. මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිකම් හා සේවා පිළිබඳව වාර්ෂිකව කෙරෙන හඳුන්වා දීමේ හා පුහුණු කිරීමේ කටයුතු ශ්‍රී ලංකා පුස්තකාල සංගම් සිසුන් මෙන්ම ශ්‍රී ලංකා රසායන විද්‍යා සංගමයේ උපාධි අපේක්ෂක සිසුන් සඳහා පවත්වන ලදී.

# කර්මාන්ත සඳහා තොරතුරු

## පර්යේෂණ ව්‍යාපෘති

භාණ්ඩාගාරයේ මුල්‍ය ප්‍රතිපාදන ඇතිව තොරතුරු සේවා මධ්‍යස්ථානය පර්යේෂණ ව්‍යාපෘතීන් 2 ක් ආරම්භ කරන ලදී. ඉන් එක් ව්‍යාපෘතියක් වනුයේ ධාන්‍ය භාවිතා කොට කෙරෙන නිෂ්පාදන කර්මාන්තයන්හි සාර්ථකත්වය සඳහා වැදගත් වන සාධක සමග යොමුවක් යන තේමාව යටතේ අවශ්‍ය පර්යේෂණ හා තොරතුරු හඳුනා ගැනීමත් හා වසර 3 ක් තුල ක්‍රියාත්මක ව්‍යාපෘතියක් වන ඖෂධ නිෂ්පාදනය තෙක් ශ්‍රී ලාංකික ස්වාභාවික ද්‍රව්‍ය යොමු කිරීම සඳහා අවශ්‍ය පාදක දත්ත ප්‍රවර්ධනය සඳහා දත්ත සොයා යෑම හා අවශ්‍ය පරීක්ෂණ කටයුතු සඳහා තොරතුරු එක්රැස් කිරීමයි.

## සම්පත් කළමනාකරණය

විද්‍යාත්මක ප්‍රකාශන සමග පර්යේෂණ පිළිබඳ වාර්තා, ඡායාරූප, පෝස්ටර්ස්, වැඩමුලු, විස්තර පත්‍රිකා ආදිය ISC වෙත ඒකාරාශී කර ගනිමින් කාර්මික තාක්ෂණ ආයතනය සතු විද්‍යාත්මක ලේඛණ එකතුව වැඩිදියුණු කර ගන්නා ලදී. ශ්‍රී ලංකාවේ ඖෂධීය පැලෑටි පිළිබඳ LUCID දත්ත පාදක දත්ත ගබඩාව වෙත ඒකරාශී කිරීමේ කටයුතු නිරංතරව සිදු කර ගෙන යන ලදී.

APTMENET, ආසියා පැසිපික් පාරම්පරික ඖෂධ ජාලය සමග දිගින් දිගටම සම්බන්ධ වෙමින් මධ්‍යස්ථානය කටයුතු කරන ලදී. ශාඛා 500 ක් හා වෙනත් සම්පත් 100 ක් පිළිබඳ තොරතුරු සමග අලෙවිකරණය, ව්‍යවසායක තොරතුරු, විශේෂඥතා, අධ්‍යාපන, මුද්‍රිත ප්‍රවෘත්ති හා පර්යේෂණ තොරතුරු නිරංතරව ඒකරාශී කොට එකතු කරන ලදී.

## තොරතුරු මධ්‍යස්ථානය සඳහා ප්‍රමිති පද්ධතියක්

2012 – 2013 වසර සඳහා ක්‍රියාත්මක කSLSI ප්‍රමිති සාමාර්ථතා විගණනයෙන් මෙන්ම ISO 9001 : 2008 සහතිකලාභී තත්වය අවම අනනුකූලතා සහිතව සාර්ථක ලෙස මධ්‍යස්ථානය සුරැකිව පවත්වා ගන්නා ලදී.

# කර්මාන්ත සඳහා තොරතුරු

## ජාල ගතවීම හා සංයුක්තගතව කටයුතු කිරීම

වෙනත් තොරතුරු ජාල සමඟ සහසම්බන්ධ වෙමින් AGRINET, HELLIS හා SLSTINET වැනි කෘෂිකාර්මික, සෞඛ්‍ය විද්‍යා හා තාක්ෂණ තොරතුරු අඩංගු ජාල සමඟ මධ්‍යස්ථානය නිරංතරව සම්බන්ධතා පවත්වමින් කටයුතු කල අතර ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ සභාව (CARP), කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය, ජාතික විද්‍යා පදනම (NSF) මේ අතර විය.

සේවාවන් පුළුල් කරමින් පවත්වා ගෙන යනු ලැබූ පුහුණු වැඩසටහන්, ප්‍රකාශන හා තොරතුරු හුවමාරු කටයුතු, සංයුක්ත සම්බන්ධතා ආදිය මෙම ජාල හා අනුබද්ධව පවත්වාගෙන යන ලදි.

සෞඛ්‍ය විද්‍යාත්මක තොරතුරු සහිත HELLIS ජාලය වෙතින් HINARI පාදක දත්ත වෙත ගාස්තු නොගෙවා ප්‍රවිශ්ය වීමේ අවස්ථාව මෙන්ම AGRINET ජාලය කෘෂිකාර්මික තොරතුරු සහිත AGORA පාදක දත්ත වෙත පිවිසුමට අවස්ථාව සපයන අතර මෙම ජාල ද්විත්වයට WHO හා FAO සංවිධාන වෙත දායකත්වය ලබාගනිමින් නොමිලයේ ක්‍රියාත්මක තොරතුරු ජාලයන් ය.

| <u>සේවක ප්‍රතිලාභ (සටහන - 8 අ)</u> | 2013<br>රු. |
|---|---|
| වැටුප් හා වේතන | 159,780,432 |
| අනියම් සේවක වැටුප් | 2,424,908 |
| වෙනත් දීමනා | 776,790 |
| පර්යේෂණ සහ සංවර්ධන දීමනා | 1,566,750 |
| සේවක අර්ථසාධක අරමුදල | 21,916,371 |
| සේවක භාරකාර අරමුදල | 4,382,682 |
| පාරිතෝෂික දීමනා | 19,300,277 |
| අතිකාල දීමනා | 2,702,475 |
| ගරු සේවා දීමනා - පාලක මණ්ඩල සාමාජික | 413,446 |
| වෛද්‍ය ගාස්තු ප්‍රතිපූර්ණය | 1,938,539 |
| දිරි දීමනා | 9,354,897 |
| චක්‍රලේඛ අංක 380 අනුව දිරි දීමනා | 31,998,330 |
| සමූහ සේවක මණ්ඩල වෛද්‍ය රක්ෂණය | 264,036 |
| | **256,819,933** |

| <u>ගමන් වියදම් (සටහන - 8 ආ)</u> | |
|---|---|
| ගමන් වියදම් - දේශිය | 1,433,875 |
| ගමන් වියදම් - විදේශිය | 2,068,220 |
| ගමන් වියදම් - සමූහ ප්‍රවාහන | 679,570 |
| | **4,181,665** |

## කාර්මික තාක්ෂණ ආයතනය (අනුප්‍රාප්තික ලං.වි. හා කා.ප.ආ)
## 2013.12.31 වන දිනෙන් අවසන්වූ කාල පරිච්ඡේදය සඳහා ආදායම් ප්‍රකාශය පිළිබද සටහන්

| | 2013<br>රු. (මි) |
|---|---|
| <u>සැපයුම් හා පරිභෝජන (සටහන - 8 ඈ)</u> | |
| සැපයුම් - රසායන ද්‍රව්‍ය | 6,731,762 |
| සැපයුම් - රසායනාගාර උපකරණ | 3,453,940 |
| සැපයුම් - විද්‍යුත් මෙවලම් | 48,965 |
| සැපයුම් - ලිපිද්‍රව්‍ය | 2,362,751 |
| සැපයුම් - වෙනත් | 3,170,279 |
| සැපයුම් - වෙනත්/අර්ධ ස්ථාවර | 199,996 |
| උවදුරු මැඩලීමේ මෙවලම් | 249,835 |
| නිළ ඇදුම් - මුරකරු, රියදුරු ආදි | 982,609 |
| ක්‍රීඩා ඇතුළු සුභසාධන | 313,800 |
| වායු | 33,361 |
| මෝටර් රථ/ඉන්ධන | 5,545,029 |
| | **23,092,327** |
| <u>නඩත්තු (සටහන - 8 ඈ)</u> | |
| නඩත්තු - ගොඩනැගිලි සහ පරිශ්‍රය | 5,575,932 |
| නඩත්තු - යන්ත්‍ර සූත්‍ර | 5,282,240 |
| නඩත්තු - ලීබඩු උපකරණ | 1,898,869 |
| නඩත්තු - පුස්තකාල පොත් | 89,316 |
| නඩත්තු - රසායනාගාර උපකරණ | 346,263 |
| නඩත්තු - පරිඝණක | 2,684,187 |
| නඩත්තු - ආපනශාලාව | 20,955 |
| නඩත්තු - විදුලිජනක යන්ත්‍රය | 169,954 |
| නඩත්තු - රථවාහන/පොදු | 4,299,080 |
| නඩත්තු - ජංගම රසායනාගාරය | 2,000 |
| | **20,368,798** |
| <u>ගිවිසුම්ගත සේවා (සටහන - 8 ඉ)</u> | |
| විදුලිය | 29,395,039 |
| දුරකථන සහ අන්තර්ජාලය | 4,283,647 |
| තැපැල් ගාස්තු | 470,456 |
| වරිපනම් සහ බදු | 1,682,604 |
| ආරක්ෂක සේවා | 4,105,352 |
| ජල බදු | 1,340,320 |
| | **41,277,417** |

# කාර්මික තාක්ෂණ ආයතනය (අනුප්‍රාප්තික ලං.වි. හා කා.ප.ආ)
## 2013.12.31 වන දිනෙන් අවසන්වූ කාල පරිච්ඡේදය සඳහා ආදායම් ප්‍රකාශය පිළිබද සටහන්

| | 2013 |
|---|---|
| **<u>ව්‍යාපෘති සහ මානව සම්පත් සංවර්ධන (සටහන - 8 ඊ)</u>** | **රු. (මි)** |
| මහා භාණ්ඩාගාර ප්‍රදානිත ව්‍යාපෘති වැය | 2,963,861 |
| පර්යේෂණ සහ සංවර්ධන (ප්‍රතීතන) | 4,861,743 |
| මානව සම්පත් සංවර්ධන - පුහුණුකිරීම් | 1,410,489 |
| පුස්තකාල විද්‍යා, සඟරාව - වාර්ෂික - දායක මුදල් | 4,807,181 |
| | **14,043,274** |
| | |
| **<u>ක්ෂය සහ ක්‍රමක්ෂය වැය (සටහන - 8 උ)</u>** | |
| ක්ෂය - ගොඩනැගිලි | 10,825,911 |
| ක්ෂය - යන්ත්‍ර සූත්‍ර | 33,502,835 |
| ක්ෂය - ලීබඩු සහ උපකරණ | 2,158,114 |
| ක්ෂය - පරිඝණක | 3,446,501 |
| ක්ෂය - රථවාහන | 5,524,992 |
| ක්ෂය - මෘදුකාංග | 771,826 |
| ක්ෂය - පුස්තකාල පොත් | 2,500,317 |
| | **58,730,496** |
| | |
| **<u>පුනරුත්ථාපන වියදම් (සටහන - 8 ඵ)</u>** | |
| ගොඩනැගිලි සහ ආකෘති පුනරුත්ථාපනය | 10,457,572 |
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ පුනරුත්ථාපනය | 2,640,700 |
| වෙනත් ප්‍රග්ධන වත්කම් පුනරුත්ථාපන සහ වැඩිදියුණු කිරීම | 2,000,933 |
| | **15,099,205** |

## කාර්මික තාක්ෂණ ආයතනය (අනුප්‍රාප්තික ලං.වි. හා කා.ප.ආ)
## 2013.12.31 වන දිනෙන් අවසන්වූ කාල පරිච්ඡේදය සඳහා වත්කම් ප්‍රකාශය පිළිබද සටහන්

| වෙනත් මෙහෙයුම් වියදම් (සටහන 8 ඌ) | 2013<br>රු. (මි) |
|---|---|
| සේවක මණ්ඩල පුහුණු කිරීම් | 921,878 |
| නියැදි ගාස්තු | 2,025,261 |
| දායක මුදල් - දේශිය/විදේශිය/වෙනත් | 265,160 |
| රසායනාගාර සාමාජික ගාස්තු (දේශිය) | 1,723,371 |
| ගරු සේවා දීමනා | 224,187 |
| නව බඳවා ගැනිම් - වෛද්‍ය පරීක්ෂණ ගාස්තු | 72,050 |
| සංග්‍රහ දීමනා | 251,402 |
| රක්ෂණ ගාස්තු | 659,495 |
| මුද්‍රණ ගාස්තු | 276,644 |
| පුවත්පත් සහ සාමාජික ගාස්තු | 59,336 |
| විගණන ගාස්තු | 720,000 |
| බැංකු ගාස්තු | 111,540 |
| ණයපත් කොමිස් | 27,331 |
| දැන්වීම් පළකිරීම් | 1,286,865 |
| සඟරා - වාර්ෂික වාර්තා | 471,182 |
| ප්‍රවර්ධන සහ ප්‍රචාරක වියදම් | 785,750 |
| ජාතිය ගොඩනැගිමේ බදු | 4,330,024 |
| සමීක්ෂණ ගාස්තු - සමීක්ෂණ මණ්ඩල | 147,450 |
| අනියම් වියදම් | 120,870 |
| පේටන්ට් සහ උපදේශණ ගාස්තු | 162,484 |
| පිරිවැයකරණ පැවරුම සඳහා වැය | 184,391 |
| වියදම් - ප්‍රමිති සේවා | 5,059,404 |
| වියදම් - උපදේශක සේවා | 1,103,077 |
| වියදම් - තාක්ෂණ හුවමාරුව | 79,615 |
| වියදම් - ගිවිසුම්ගත සේවා | 3,068,836 |
| වියදම් - වරණාත්මක සේවා | 1,184,425 |
| වියදම් - පුහුණු කිරීමේ කටයුතු | 1,549,290 |
| නිශ්කාෂණ ගාස්තු | 86,049 |
| කාර්මික තාක්ෂණ අයතන. වාර්ෂික පර්යේෂණ වැඩමුළුව- පර්යේෂණ සහ සංවර්ධන | 196,245 |
| ප්‍රදර්ශන | 293,943 |
| තාක්ෂණ වෙළඳපොළ - බි.එම්.අයි.සි.එච් | 318,698 |
| අනුමත නොකල එකතු කල අගය මත බදු | 6,765,411 |
| මුද්දර බදු | 60,850 |
| අර්ථසාධක අරමුදල සඳහා ලිපිද්‍රව්‍ය | 41,872 |
| පරිත්‍යාග | 23,000 |
| විවිධ වියදම් | 28,257 |
| සෙන්ටෙක් ප්‍රදර්ශන - ප්‍රතිශත දායකත්වය | 365,084 |
| | **35,050,729** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එල්එස්/02/ඊ/අයිටීඅයි/1/13/26 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2014 දෙසැම්බර් 5 දින

සභාපති,
කාර්මික තාක්ෂණ ආයතනය

**කාර්මික තාක්ෂණ ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

කාර්මික තාක්ෂණ ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1974 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩිදියුණු කිරීමේ පනතේ VII කොටසේ 40 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2014 සැප්තැම්බර් 12 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම.

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම.

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

## 2.1 තත්ත්වාගණනය කළ මතය.

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට කාර්මික තාක්ෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

---

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත ප්‍රකාරව පාරිතෝෂික වෙන් කිරීම් ගණනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා පාරිතෝෂික දීමනා වෙන් කිරීම් රු.274,025 ක් අඩුවෙන් සිදුකර තිබුණි. ඒ මත සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) භෞතික සත්‍යාපන වාර්තාව අනුව 2013 දෙසැම්බර් 31 දිනට පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තොගය රු.9,340,426 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තොගය රු.9,612,559 ක් වී තිබුණි. ඒ මත සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා අවසන් තොගය රු.272,133 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

---

දේපල, පිරියත හා උපකරණ ගිණුමෙහි දක්වා ඇති පිරිවැය වටිනාකම සහ සමාලෝචිත වර්ෂයට අදාල භෞතික සත්‍යාපන වාර්තා අනුව පිරිවැය වටිනාකම පහත පරිදි වෙනස් වී තිබුණි.

| අයිතමය | මූල්‍ය ප්‍රකාශන අනුව පිරිවැය වටිනාකම | භෞතික සත්‍යාපන වාර්තාව අනුව පිරිවැය වටිනාකම | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| යන්ත්‍ර සූත්‍ර හා රසායනාගාර උපකරණ | 668,100,727 | 694,658,745 | 26,558,018 |
| ලී බඩු හා කාර්යාල උපකරණ | 44,733,359 | 39,103,373 | (5,629,986) |
| පරිගණක යන්ත්‍ර | 45,913,890 | 42,617,309 | (3,296,581) |
| පුස්තකාල පොත් සහ සඟරා | 13,038,343 | 13,893,059 | 854,716 |
| එකතුව | 771,786,319 | 790,272,486 | 18,486,167 |

### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ කිහිපයක සිට ගිණුම් තුල ඇතුලත්වූ අගරු චෙක්පත් හා වෙනත් ණයගැති ශේෂ එකතුව රු. 617,796 ක් සමාලෝචිත වර්ෂය තුලදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරියට ගෙන එමින් පැවති එකතුව රු.83,339 ක් වූ ටෙන්ඩර් තැන්පතු හා එකතුව රු.160,746 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු සමාලෝචිත වර්ෂය තුලදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේ මැයි 30 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ නියෝග අංක 16 ප්‍රකාරව විදේශ ශිෂ්‍යත්ව ගිවිසුම්වල කොන්දේසි කඩකළ නිලධාරීන් 18 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 7,810,032 ක් විගණිත දිනය වූ 2014 ජුනි 25 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඈ) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය යටතේ සේවයෙන් ඉවත්ව ගිය හා සේවයේ රැඳී සිටින නිලධාරීන් සඳහා ගෙවිය යුතු වැටුප් වශයෙන් 2009 වර්ෂයේ සිට රු. 7,030,873 ක වෙන් කිරීමක් කර තිබුණු අතර, එයින් 2013 දෙසැම්බර් 31 දින වනවිටද රු.6,980,352 ක් ගෙවා නොතිබුණි.

### 2.2.4 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

---

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීතිරීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(1) වගන්තියේ 6.5.3 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(2) (ඇ) | අතුරු අග්‍රිමයන් දෙන ලද කාර්යය අවසන් වූ වහාම පියවිය යුතු වුවත්, ආයතනය විසින් මාස 01 සිට මාස 07 දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් යුතුව අතුරු අග්‍රිම පියවා තිබුණි. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.5 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් සමීක්ෂණය සඳහා නිලධාරීන් 4 දෙනෙකුගෙන් සමන්විත සමීක්ෂණ මණ්ඩලයක් පත් කර තිබුණු අතර රු. 13,581,898 ක් වටිනා පරිගණක මෘදුකාංග හා උපාංග සහ රු.4,512,594 ක් වටිනා අනෙකුත් වත්කම් සත්‍යාපනය කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2011 අප්‍රේල් 21 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2011/1 දරන මුදල් හා ක්‍රම සම්පාදන චක්‍රලේඛය. | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමකින් තොරව රු. 38,469,075 ක් වටිනා කැනඩා ව්‍යාපෘතියක් සහ රු. 9,471,996 ක් වටිනා ඉන්දු ශ්‍රී ලංකා ව්‍යාපෘතියක් පිළිවෙලින් 2012 අප්‍රේල් මාසයේදී සහ 2013 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කර තිබුණි. |
| (ඉ) | 2000 ජනවාරි 19 දිනැති අංක 380 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | |
| | (i) 01 වගන්තිය | උපදේශන සේවා සඳහා පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| | (ii) 7.1 වගන්තිය | උපදේශන සේවා ආදායමින් සෘජු පිරිවැය අඩු කළ පසු සියයට 10 සිට සියයට 25 දක්වා ප්‍රතිශතයක මුදලක් ආයතනය මඟින් රඳවාගෙන භාණ්ඩාගාරයේ විශේෂ අරමුදලක් වෙත මාස 03කට වරක් ප්‍රේෂණය කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | 2004 පෙබරවාරි 11 දිනැති අංක ඩීඑම්එස්/ඊආර්එස්ටී/21-4/ වෙළුම ii දරන කළමනාකරණ සේවා අධ්‍යක්ෂකගේ ලිපිය. | එක් නිලධාරියෙකුට මාස දෙකක වැටුප හෝ රු.20,000 යන දෙකෙන් අඩු අගය දිරි දීමනාවක් ලෙස ලබාදීමට අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව 2012 වර්ෂය සඳහා නිලධාරීන් 307 දෙනෙකුට ලබාදිය හැකි උපරිම දිරි දීමනාව රු. 6,140,000 ක් වුවද සමාලෝචිත වර්ෂය තුළදී රු. 1,802,397 ක් වැඩිපුර ගෙවා තිබුණි. එමෙන්ම 2013 වර්ෂය සඳහා එක් අයෙකුට රු. 27,500 බැගින් නිලධාරීන් 395 කට දිරි දීමනා සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර අනුමත ප්‍රමාණයට වඩා රු. 2,962,500 ක් වැඩියෙන් ප්‍රතිපාදන වෙන් කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.39,177,699 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා රු.22,628,443 ක අතිරික්තයක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.16,549,256 ක වැඩි වීමක් පෙන්නුම් කෙරුණි. මේ සඳහා ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ක්ෂයවීම මත භාණ්ඩාගාර ප්‍රදාන කපා හැරීම සියයට 49 කින් ද පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් මත භාණ්ඩාගාර ප්‍රදාන කපා හැරීම සියයට 46 කින් ද ආදායම් සියයට 30 කින් හා වෙනත් ආදායම් සියයට 35 කින් වැඩිවීම හේතු වී ඇති බව නිරීක්ෂණය විය.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව මණ්ඩලයේ කාරක ප්‍රාග්ධනය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සියයට 38ක පිරිහීමක් නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

ආයතනය විසින් මෙහෙයවනු ලබන පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රමාද වූ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘති 07 ක් නිම කිරීමට නියමිත වූ දිනයට වඩා මාස 03 සිට මාස 23 දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් යුතුව නිම කර තිබුණි.

(ii) අංක: ටීජී12/00/04 දරන " Continue the Fabrication of Tape Calibration Facility in IML" ව්‍යාපෘතිය රු. 1,000,000 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන මත 2006 වර්ෂයේදී ආරම්භ කර 2010 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂිතව තිබුණි. එහෙත්, ව්‍යාපෘතිය මෙහෙයවනු ලැබූ නිලධාරියා 2010 ජනවාරි 17 දින සිට 2012 ජනවාරි 16 දින දක්වා වසර 2 ක කාලයක් අධ්‍යයන නිවාඩු ලබා ගැනීම හේතුවෙන් එම ව්‍යාපෘතිය වසර 03 ක ප්‍රමාද කාලයකින් යුතුව 2013 දෙසැම්බර් මාසයේදී නිම කර තිබුණි. අධ්‍යයන නිවාඩු ලබා ගත් නිලධාරියා වෙනුවට වෙනත් නිලධාරියෙකු යොදවා ව්‍යාපෘතිය අප්‍රමාදව සාර්ථක කර ගැනීමට ආයතනය විසින් කටයුතු කර නොතිබූ අතර අධ්‍යයන නිවාඩු කාලය වසර 2 ක් වුවත් ව්‍යාපෘතිය වසර 3 ක ප්‍රමාද කාලයකින් යුතුව සම්පූර්ණ කර තිබුණි.

(ආ) අතහැර දැමූ ව්‍යාපෘති

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අංක: ටීජී/08/24 දරන " Replacement of Sulphur promoting sqmigat" ව්‍යාපෘතිය පර්යේෂණ නිලධාරීන් තිදෙනෙකුගේ සහභාගිත්වයෙන් රු.2,000,000 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන මත 2011 මැයි මාසයේදී ආරම්භ කර 2014 මැයි මාසයේදී නිම කිරීමට අපේක්ෂිතව තිබුණු අතර මෙම ව්‍යාපෘතිය සඳහා 2013 දෙසැම්බර් 31 දිනට රු.93,482 ක පිරිවැයක් දරා තිබුණි. මෙයින් එක් පර්යේෂණ නිලධාරියෙකු 2011 දෙසැම්බර් 09 දින විශ්‍රාම ගැනීමට නියමිත බව නොසලකා හරිමින් ව්‍යාපෘතිය සැලසුම් කිරීම හේතුවෙන් එම ව්‍යාපෘතිය අතහැර දමා තිබූ අතර වෙනත් පර්යේෂණ නිලධාරියෙකු හෝ යොදවා ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) අංක: එෆ්පී 83 දරන " Enhancing Environmental Performance in Key Sri Lankan Export Sectors – EEPEx" ව්‍යාපෘතිය යුරෝපා සංගමයේ යුරෝ 683,528 ක මූල්‍යාධාර යටතේ 2009 මාර්තු මාසයේදී ආරම්භ කර 2012 අගෝස්තු මාසයේදී නිම කිරීමට අපේක්ෂිතව තිබුණි. එහෙත්, ආයතනික ඉහළ කළමනාකරණයේ පැවති දුර්වලතා හේතුවෙන් එම සංගමය විසින් මූල්‍යාධාර ලබා දීම නවත්වා තිබුණු අතර අලාභ පියවා ගැනීම සඳහා 2014 අගෝස්තු 25 දිනට කල්පිරෙන යුරෝ 81,097.48 ක් වටිනා හරපතක් ආයතනය වෙත නිකුත් කර තිබුණි.

## 4.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ සනීපාරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් වූ කොන්ත්‍රාත් ගිවිසුම හා රු.36,644 ක් වටිනා කාර්ය සාධන බැඳුම්කරය දීර්ඝ කිරීමෙන් තොරව, සමාලෝචිත වර්ෂයේ මාස 05 ක කාලයක් සඳහා රු. 581,608 ක මුදලක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි.

(ආ) ආයතනයේ සනීපාරක්ෂක සේවා සැපයීම සඳහා නියමිත ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය මඟින් තෝරාගත් ආයතනය වෙනුවට මසකට රු.32,352කින් මිල වැඩි වෙනත් ආයතනයක් 2013 නොවැම්බර් 11 දින පත්කර තිබුණි.

## 4.3 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු. 1,815,377 ක් වූ බැංකු ගිණුම් ශේෂ 03 ක් වසර 05 කට අධික කාලයක් තිස්සේ ක්‍රියාත්මක නොවූ අතර එම ගිණුම්වල ඇති මුදල් සමාලෝචිත වර්ෂය තුළදී ද අදාල කටයුත්තට හෝ වෙනත් ඵලදායි කටයුත්තක් සඳහා උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අංක: එෆ්පී 96 දරන " Value Addition to Fruits and Vegetables by Clarifying, Concentrating" ව්‍යාපෘතිය ජාතික විද්‍යා පදනමේ රු. 1,920,000 ක මූලාධාර යටතේ 2011 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කර 2013 සැප්තැම්බර් මාසයේදී නිම කර තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ රු. 654,886 ක් වටිනා යන්ත්‍රයක් මුළු ඇස්තමේන්තු පිරිවැය රු.126,910 කින්ද ඉක්මවමින් සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණු අතර එම යන්ත්‍රය අවශ්‍යතාවයට නොගැලපීම හේතුවෙන් විගණිත දිනය වූ 2014 ජුනි 25 දින වන විටත් නිෂ්ක්‍රීයව පැවතුණි.

## 4.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

"Waste Water Treatment Plant" නම්වූ යන්ත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත රු. 10,752,000 ක මුදලකට උප කොන්ත්‍රාත්තුවක් ලබාදී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මෙම උප කොන්ත්‍රාත්තුව ලබාදීම සම්බන්ධයෙන් සේවා ගිවිසුමකට එළඹ නොතිබුණු අතර කාර්යසාධන බැඳුම්කරයක්ද ලබා ගෙන නොතිබුණි.

(ආ) උප කොන්ත්‍රාත්තුව ලබා දුන් ආයතනය විසින් ලබා දී තිබුණු රු. 3,648,000 ක් වටිනා අත්තිකාරම් බැඳුම්කරය 2012 සැප්තැම්බර් 20 දින කල් ඉකුත් වී තිබුණු අතර එය දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සේවාදායකයාගේ ඉල්ලීමට අනුව 2012 අප්‍රේල් 23 දින සිට මාස 4 ක් ඇතුලත යන්ත්‍රාගාරයේ ඉදිකිරීම් නිම කළ යුතු වුවත්, 2013 මාර්තු මාසයේදී වැඩ නිම කර භාර දී තිබුණු නමුත් යන්ත්‍රාගාරය ක්‍රියා කරවීමේ අත්පොත හා අනෙකුත් වාර්තා විගණිත දිනය වූ 2014 මාර්තු 17 තෙක්ම ලබා දී නොතිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

---

2013 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු පහත දැක්වේ.

| ශ්‍රේණිය | අනුමත | තත්‍ය | කොන්ත්‍රාත් | අතිරික්ත | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 52 | 34 | - | - | 18 |
| තෘතියික | 148 | 140 | 12 | 4 | - |
| ද්විතියික | 106 | 101 | 20 | 15 | - |
| ප්‍රාථමික | 86 | 60 | 13 | - | 13 |
| | 392 | 335 | 45 | 19 | 31 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුමත කාර්ය මණ්ඩලය වැඩිකර ගැනීමකින් තොරව තෘතියික මට්ටමේ තනතුරක් වූ පර්යේෂණ විද්‍යාඥයින් අනුමත සංඛ්‍යාව ඉක්මවා 09 දෙනෙකු වෙත ස්ථිර පත්වීම් ලබා දී තිබුණු අතර, එම තනතුරටම නිලධාරීන් 11 දෙනෙකු කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගෙන තිබුණි.

(ආ) ආයතනය වෙත අත්‍යවශ්‍ය ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වන ප්‍රධාන ගණකාධිකාරී, ප්‍රධාන අලෙවි කළමනාකරණ නිලධාරී සහ පර්යේෂණ සහකාර තනතුරු පුරප්පාඩු 5 ක් පිරවීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලය තුල ස්ථිර නිලධාරීන් බඳවා ගැනීම සඳහා පුරප්පාඩු පැවතියද ස්ථිර පත්වීම් ලබා නොදී කොන්ත්‍රාත් පදනමට නිලධාරීන් බඳවාගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| තත්ත්වය | පුරප්පාඩු සංඛ්‍යාව | කොන්ත්‍රාත් පදනමට බඳවා ගත් සංඛ්‍යාව |
|---|---|---|
| රියදුරු | 04 | 03 |
| පුහුණු | 07 | 02 |
| අර්ධ පුහුණු | 14 | 05 |

(ඈ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 හා 9.10 වගන්ති උල්ලංඝනය කරමින් ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් භාණ්ඩාගාර ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව නිලධාරීන් 06 දෙනෙකුගේ තනතුරු නාමයන් 2012 ජුලි 01 දින සිට වෙනස් කර තිබුණු අතර සියයට 50 ක දුරකථන ගාස්තු දීමනාවක් සහ ප්‍රවාහන දීමනා අනුමත කර තිබුණි. ඒ මත 2012 ජුලි 01 දින සිට විගණිත දිනය වූ 2013 නොවැම්බර් 30 දින දක්වා දුරකථන ගාස්තු දීමනා සඳහා රු.200,500 ක් ද ප්‍රවාහන දීමනා සඳහා රු. 548,510 ක් ද ආයතනය විසින් ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

---

### 5.1 අයවැය ලේඛනමය පාලනය

---

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තත්‍ය ආදායම් හා වියදම් සැසඳීමේදී අයිතම 07ක් සඳහා සියයට 16 සිට සියයට 349 දක්වා විචලනයක් දක්නට ලැබීම නිසා අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

### 5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව වාර්ෂික වාර්තාව මූල්‍ය වර්ෂය අවසාන වී දින 150 ක් තුළ පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2011 හා 2012 වර්ෂවල වාර්ෂික වාර්තා පිළිවෙලින් 2013 ජූලි 23 දින හා 2014 ජුනි 09 දින සභාගත කර තිබුණි.

## 6. පද්ධති හා පාලන

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අයවැය පාලනය

(ආ) ස්ථාවර වත්කම් පාලනය

(ඇ) ගිණුම්කරණය

(ඈ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය

(ඉ) කාර්ය මණ්ඩල පරිපාලනය

(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය

(උ) ව්‍යාපෘති පරිපාලනය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

වැඩබලන විගණකාධිපති.

| අදාල වගන්තිය | විගණකාධිපති වාර්තාවෙහි විස්තර / අදහස් දැක්වීම | කාර්මික තාක්‍ෂණ ආයතනයීය අදහස් දැක්වීම |
|---|---|---|
| **2.2.3** | **ගිණුම්කරණ අඩුපාඩු**<br>පහත නිරීක්ෂණ කරනු ලැබේ. | |
| (අ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත ප්‍රකාරව සම්පූර්ණ වශයෙන් සේවය කරන ලද එක් එක් වර්ෂ සඳහා පාරිතෝෂික වෙන් කිරීම් ගණනය කළ යුතු වුවද ජනවාරි 01 දින සේවයට බැඳුනු පුද්ගලයන් 15 දෙනෙකු වෙනුවෙන් ඔවුන් සේවයට බැඳුනු වර්ෂය ගණන් නොගැනීම මත පාරිතෝෂික දීමනා වෙන් කිරීම් රු. 274,025 ක් අඩුවෙන් සිදුකර තිබුණි.මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2013.01.01 දින සේවයට බැඳුනු පුද්ගලයන් ගණන දෙදෙනෙකි. කෙසේනමුදු එම පුද්ගලයන් දෙදෙනාට අදාල පාරිතෝෂික වෙන්කිරීම සිදුකර නොතිබිණි. මේ සමඟ ඉදිරිපත්කරණ මූල්‍ය ප්‍රකාශන තුළ අදාල ගැලපීම සිදුකර ඇත. ඉතිරි පුද්ගලයන් සඳහා ප්‍රවර්තන වසරේදී අදාල ගැලපීම් සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තොගය රු. 9,612,559 ක් වූ අතර, භෞතික සත්‍යාපන්ෂණ වාර්තාව අනුව එම තොගය රු. 9,340,426 ක් විය. ඒ අනුව රු.272,133 ක තොග කපා හැරීමක් මූල්‍ය ප්‍රකාශන තුල හඳුනා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා අවසන් තොගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තොගය රු. 9,612,559 ක් වූ අතර, භෞතික සත්‍යාපන්ෂණ වාර්තාව අනුව එම තොගය රු. 9,340,426 ක් විය. ඒ අනුව රු.272,133 ක වටිනාකම පොත්වලින් ලියහැරීමට පාලක මණ්ඩලයේ අනුමැතිය ලද අතර මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලැබීමෙන් පසු කපා හැරීමට ක්‍රියාකරනු කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| (ඇ) | දේපල, පිරියත හා උපකරණ ගිණුමෙහි දක්වා ඇති පිරිවැය වටිනාකම සහ භෞතික සත්‍යාපන වාර්තා අනුව පිරිවැය වටිනාකම පහත පරිදි වෙනස් වී තිබුණි.<br><br>අයිතමය \| මූල්‍ය ප්‍රකාශන අනුව පිරිවැය වටිනාකම \| භෞතික සත්‍යාපන වාර්තාව අනුව පිරිවැය වටිනාකම \| වෙනස<br>යන්ත්‍ර සූත්‍ර හා රසායනාගාර උපකරණ \| 668,100,727 \| 694,658,745 \| 26,558,018<br>ලී බඩු හා කාර්යාල උපකරණ \| 44,733,359 \| 39,103,373 \| (5,629,986)<br>පරිගණක යන්ත්‍ර \| 45,913,890 \| 42,617,309 \| (3,296,581)<br>පුස්තකාල පොත් සහ සඟරා \| 13,038,343 \| 13,893,059 \| 854,716<br>එකතුව \| 771,786,319 \| 790,272,486 \| 18,486,167<br><br>භෞතික සත්‍යාපන වාර්තාවේ දැක්වෙන පිරිවැය වටිනාකමට වඩා මූල්‍ය ප්‍රකාශන අනුව පිරිවැය වටිනාකමඉහත පරිදි අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබීම මඟින් වත්කම් අත්පත්කර ගන්නා අවස්ථාවේදී හා ඉවත් කරන අවස්ථාවේදී ගිණුම් තැබීමේ දෝෂ පවතින බවත් දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් දුර්වල පාලනයක් පවතින බවත් විගණනයේදී නිරීක්ෂණය විය. | කාර්මික තාක්‍ෂණ ආයතනයේ මූල්‍ය පරිගණක පද්ධතියේ ස්ථාවර වත්කම් මොඩලයෙහි වත්කම් ප්‍රත්‍යගණන වටිනාකම් ඇතුළත් කිරීමට පවතින අපහසුතාව හේතුවෙන් මෙමෙ විචලනය ඇතිවී ඇත. සේවා සැපයුම් ආයතනය සමඟ කරණ ලද සාකච්ඡා මගින් අදාල ආදාන ක්‍රම ස්ථාපිත කිරීමට හැකියාව පවතින බව තහවුරු වන අතර අමගින් මෙමෙ විචලනය නිවැරදි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. |

| | | |
|---|---|---|
| **2.2.4** | **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**<br>පහත නිරීක්ෂණ කරනු ලැබේ | |
| (අ) | වර්ෂ කිහිපයක සිට ගිණුම් තුල ඇතුලත්වූ අගරු චෙක්පත් හා වෙනත් ණයගැති ශේෂ එකතුව රු. 617,796 ක් සමාලෝචිත වර්ෂය තුලදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂ කිහිපයක සිට ගිණුම් තුල ඇතුලත්වූ අගරු චෙක්පත් හා වෙනත් ණයගැති ශේෂ සඳහා අවස්ථා ගණනාවකදී ශේෂ තහවුරු කීරීම් ලිපි යොමු කර අතර කිසිදු ප්‍රතිචාරයක් අදාල පාර්ශවයන්ගෙන් නොලැබුණි. එමනිසා එකී ශේෂයන් වටිනාකම පොත්වලින් ලියහැරීමට පාලක මණ්ඩලයේ අනුමැතිය ලද අතර මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලැබීමෙන් පසු කපා හැරීමට ක්‍රියාකරනු කරනු ලැබේ. |
| (ආ) | වර්ෂ ගණනාවක සිට ගිණුම් තුල ඇතුලත් රු. 83,339 ක් වූ ටෙන්ඩර් තැන්පතු හා රු.160,746 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු එකතුව රු. 244,085 ක් සමාලෝචිත වර්ෂය තුලදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි, අදාල තැන්පතු හිමියන්ගෙන් තහවුරු කීරීම් ලබාගෙන ඒ අනුකූලව පාලක මණ්ඩල අනුමැතිය යටතේ ආපසු ගෙවීමට හෝ අදායමට ගැලපීමට ක්‍රියා කරනු ලැබේ. |
| (ඇ) | 2011 වර්ෂයේ මැයි 30 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ නියෝග අංක 16 ප්‍රකාරව විදේශ ශිෂ්‍යත්ව ගිවිසුම්වල කොන්දේසි කඩකළ නිලධාරීන් 18 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 7,810,032 ක් විගණිත දිනය වූ 2014 ජුනි 25 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | මෙමෙ රු. 4,069,011/- මුදල හා සම්බන්ධ ගිවිසුම් කඩකළ නිලධාරීන්ගෙන් අදාල මුදල් අයකර ගැනීමට ගතහැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගත් අතර, එම ක්‍රියාමාර්ග ව්‍යවර්ථ වුයේ එම නිලධාරීන් දිවයින හැරගොස් සිටින බැවිනි. ඔවුන්ගේ බොහෝ ඇප කරුවන්ද දිවයිනෙන් බැහැර ගොස් සිටින අතර ඇතැමෙක් ජීවතුන් අතර නැත. මේ සම්බන්ධව 2011.06.30 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේද සාකච්ඡා කළ අතර මෙමෙ වටිනාකම පොත් වලින් ලියාහැරීමට අදාලව මේ වනවිට පොදු 286 ආකෘති පත පිරවීමට කටයුතු යොදා ඇත.<br>රු. 3,789,640/- වටිනා ගිවිසුම කඩකළ නිලධාරිණිය සම්බන්ධව නීති උපදෙස් ලබාගැනීම සඳහා ඇටෝර්නි ජනරාල් වෙත ඉදිරිපත් කර ඇත. |

| | | |
|---|---|---|
| (ඇ) | 2006 සැප්තැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 යටතේ සේවයෙන් ඉවත්ව ගිය හා සේවයේ රැඳී සිටින නිලධාරීන් සඳහා ගෙවිය යුතු වැටුප් වශයෙන් 2009 වර්ෂයේ සිට රු. 7,030,873 ක වෙන් කිරීමක් කර තිබුණු අතර, 2013 වර්ෂයේදී නිලධාරීන් 06 දෙනෙකු සඳහා රු. 50,522 ක් පමණක් ගෙවා තිබුණි. | 2006 සැප්තැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 යටතේ සේවයෙන් ඉවත්ව ගිය හා සේවයේ රැඳී සිටින නිලධාරීන් සඳහා ගෙවිය යුතු වැටුප් වශයෙන් 2009 වර්ෂයේ සිට රු. 7,030,873 ක වෙන් කිරීමක් කර තිබුණු අතර මෙමගින් 2010,2011,හා 2012 වසර වලදීද ගෙවීම් කර තිබුණි. පවතින ශේෂය ප්‍රවර්තන වසරේදී මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීමට ක්‍රියා කරනු ලැබේ. |
| **2.2.5** | **නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**<br>පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය. | |
| **<u>නීතිරීති, රෙගුලාසි ආදියට යොමුව</u>** | | |
| (අ) | 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(1) වගන්තියේ 6.5.3 ඡේදය<br><br>ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත 2013 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගනිමි. 2014 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු යොදමි. |
| (ආ) | මු.රෙ. 371(2) (ඇ)<br><br>අතුරු අග්‍රිමයන් දෙන ලද කාර්යය අවසන් වූ විගසම පියවිය යුතු වුවත්, ආයතනය විසින් මාස 01 සිට මාස 07 දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් යුතුව අතුරු අග්‍රිම පියවා තිබුණි. | අතුරු අග්‍රිමයන් දින 14 හෝ දෙනලද කාර්ය නිම වූ විගස යන දෙකෙන් අඩු කාලයකදී පියවීම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග යොදනු ලැබේ. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.5 වගන්තිය<br><br>සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් සමීක්ෂණය සඳහා නිලධාරීන් 4 දෙනෙකුගෙන් සමන්විත භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත් කර තිබුණු අතර රු. 13,581,898 ක් වටිනා පරිගණක මෘදුකාංග හා උපාංග සහ රු. 4,512,594 ක් වටිනා අනෙකුත් වත්කම් සත්‍යාපනය කර නොතිබුණි. | පිළිගනිමි. කාර්මික තාක්‍ෂණ ආයතනයේ සම්පූර්ණ ස්ථාවර වත්කම් වටිනාකම රු.මි. 447.4/- ක් වන අතර රු.මි. 13 වටිනාකමක් ඇති පරිගණක මෘදුකාංග සත්‍යාපනය සඳහා ඒ පිළිබඳව විශේෂඥ ඥානය ඇති පුද්ගලයෙකු ලබාගැනීමට අවස්ථාව නොතිබූ බැවින් මෙම පරිගණක මෘදුකාංග සත්‍යාපනය කළ නොහැකිවිය. එසේම මුළු වටිනාකම රු.මි. 4.5 වූ |

| | | |
|---|---|---|
| | | අනෙකුත් වත්කම් තුළ අන්තර්ගත ඒකක වටිනාකම් රු.500/-, රු.1000/- ආදී කුඩා වටිනාකම් ඇති අයිතමයන් බැවින් සත්‍යාපනය නොකරන ලදී. |
| (ඉ) | 2011 අප්‍රේල් 21 දිනැති අංකඑම්ඕඑෆ්පී/ඊආර්ඩී/2011/1දරන මුදල් හා ක්‍රම සම්පාදන චක්‍රලේඛය.<br><br>රු. 38,469,075 ක් වටිනා කැනඩා ව්‍යාපෘතියක් සහ රු. 9,471,996 ක් වටිනා ඉන්දු ශ්‍රී ලංකා ව්‍යාපෘතියක් පිළිවෙලින් 2012 අප්‍රේල් මාසයේදී සහ 2013 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව දැනුවත් කර නොතිබුණි. | පිළිගනිමි මින් ඉදිරියේදී ලැබෙන විදේශ ව්‍යාපෘති පිළිබඳව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට කටයුතු කරමි. |
| (ඊ) | 2000 ජනවාරි 19 දිනැති අංක 380 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය.<br><br>i. 01 වගන්තිය<br>උපදේශන සේවා සඳහා පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි.<br><br>ii 7.1 වගන්තිය<br>උපදේශන සේවා ආදායමින් සෘජු පිරිවැය අඩු කළ පසු සියයට 10 සිට සියයට 25 දක්වා ප්‍රතිශතයක මුදලක් ආයතනය මඟින් රඳවාගෙන භාණ්ඩාගාරයේ විශේෂ අරමුදලක් වෙත මාස 03කට වරක් යැවිය යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. 2014 වසරේ සිට උපදේශන සේවා සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ඇත.<br><br>මේ සම්බන්ධව මහා භාණ්ඩාගාරය සමග සාකච්ඡා කළ අතර මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන උපදෙස් අනුව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |
| (උ) | 2004 පෙබරවාරි 11 දිනැති අංක ඩීඑම්එස්/ඊආර්එස්ටී/21-4/ වෙළුම iiදරන කළමනාකරණ සේවා අධ්‍යක්ෂකගේ ලිපිය.<br><br>එක් නිලධාරියෙකුට මාස දෙකක වැටුප හෝ රු. 20,000 යන දෙකෙන් අඩු අගය දිරි දීමනාවක් ලෙස ලබාදීමට අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව 2012 වර්ෂය සඳහා නිලධාරීන් 307 දෙනෙකුට ලබාදිය හැකි දිරි දීමනාව රු. 6,140,000 ක් වුවද 2013 වර්ෂය තුලදී රු. 1,802,397 ක් වැඩිපුර ගෙවා තිබුණි. එමෙන්ම 2013 වර්ෂය සඳහා එක් අයෙකුට රු. 27,500 බැගින් නිලධාරීන් 395 කට දිරි දීමනා සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර අනුමත ප්‍රමාණයට වඩා රු. 2,962,500 ක් වැඩියෙන් ප්‍රතිපාදන වෙන් කර තිබුණි. | මෙය තීරණය 2004 වසරේදී ලබාගන්නා විට මාධ්‍ය මට්ටමේ සේවකයෙකුගේ මාසික වැටුප රු. 10,000/- පමණ විය. ඒ අනුව මෙම ගෙවීම කරණ ලද අතර මේ වනවිට මධ්‍ය මට්ටමේ මාසික සේවක වැටුප රු. 25,000/ පමණ වේ.<br>එමෙන්ම 2006 DMS 30 චක්‍රලේඛය අනුව සේවක |

<table>
<tr><td></td><td></td><td>වැටුප් විශාල ලෙස ඉහල ගිය අතර ඊට සාපේක්ෂව දිරි දීමනා ගෙවීමද රු. 7500/-න් පාලක මණ්ඩල අනුමැතිය ඇතිව ඉහළ දමන ලදී.<br>එම පදනම සලකමින් 2013 වසර සඳහාද වෙන්කිරීම් සිදු කරණ ලදී.</td></tr>
<tr><td>3.</td><td><u>මූල්‍ය සමාලෝචනය</u></td><td></td></tr>
<tr><td>3.1</td><td>මූල්‍ය ප්‍රතිඵල<br><br>ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේමෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.69,829,343 ක අතිරික්තයක් පෙන්නුම් කරන ලද අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා රු.22,628,443 ක අතිරික්තයක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.47,200,900 ක වැඩි වීමක් පෙන්නුම් කෙරුණි. මේ සඳහා 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී ක්ෂයවීම මත භාණ්ඩාගාර ප්‍රදාන කපා හැරීම 127% කින් ද පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් මත භාණ්ඩාගාර ප්‍රදාන කපා හැරීම 46% කින් ද ආදායම් 30% කින් හා වෙනත්ආදායම් 35% කින් වැඩිවීම හේතු වී ඇති බව නිරීක්ෂණය විය.</td><td>2.2.3. (ආ) හි සඳහන් කරණ ලද භාණ්ඩාගාර ක්‍රමක්ෂය නිසිපරිදි ගැලපීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රථිපලය රු.මි 39,200,516/= දක්වා අඩුවිය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිපලය වැඩිවීමේ වෙනස රු.මි. 16,572,073 විය.</td></tr>
<tr><td>3.2</td><td>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය<br>ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව මණ්ඩලයේකාරක ප්‍රාග්ධන අනුපාත විශ්ලේෂණය පහත පරිදි දැක්විය හැකිය.<br><table><tr><th>අනුපාත</th><th>2013<br>වර්ෂය</th><th>2012<br>වර්ෂය</th></tr><tr><td>ජංගම</td><td>1.5</td><td>1.8</td></tr><tr><td>ක්ෂණික</td><td>1.5</td><td>1.7</td></tr></table></td><td>එකඟ වෙමි.</td></tr>
</table>

| | | |
|---|---|---|
| **4**<br><br>**4.1** | **මෙහෙයුම් සමාලෝචනය**<br><br>**කාර්යසාධනය**<br>ආයතනය විසින් මෙහෙයවනු ලබන පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳව පහත නිරීක්ෂණකරනු ලැබේ. | |
| (අ) | ප්‍රමාද වූ ව්‍යාපෘති<br>(i) සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘති 07 ක් නිම කිරීමට නියමිත වූ දිනයට වඩා මාස 03 සිට මාස 23 දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් යුතුව නිම කර තිබුණි.<br><br>(ii) ටීජී12/00/04 ව්‍යාපෘතිය රු. 1,000,000 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන මත 2006 වර්ෂයේදී ආරම්භ කර 2010 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂිතව තිබුණි. එහෙත්, ව්‍යාපෘතිය මෙහෙයවනු ලැබූ නිලධාරියා 2010 ජනවාරි 17 දින සිට 2012 ජනවාරි 16 දින දක්වා වසර 2 ක කාලයක් අධ්‍යයන නිවාඩු ලබා ගැනීම හේතුවෙන් එම ව්‍යාපෘතිය වසර 03 ක ප්‍රමාද කාලයකින් යුතුව 2013 දෙසැම්බර් මාසයේදී නිම කර තිබුණි. අධ්‍යයන නිවාඩු ලබා ගත් නිලධාරියා වෙනුවට වෙනත් නිලධාරියෙකු යොදවා ව්‍යාපෘතිය අප්‍රමාදව සාර්ථක කර ගැනීමට ආයතනය විසින් කටයුතු කර නොතිබූ අතර අධ්‍යයන නිවාඩු කාලය වසර 2 ක් වුවත් ව්‍යාපෘතිය වසර 3 ක ප්‍රමාද කාලයකින් යුතුව සම්පූර්ණ කර තිබුණි. | එකඟ වෙමි<br><br>එකඟ වෙමි |
| (ආ) | අතහැර දැමූ ව්‍යාපෘති<br>(i) ටීජී/08/24 ව්‍යාපෘතිය පර්යේෂණ නිලධාරීන් තිදෙනෙකුගේ සහභාගිත්වයෙන්රු.2,000,000 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන මත 2011 මැයි මාසයේදී ආරම්භ කර 2014 මැයි මාසයේදී නිම කිරීමට අපේක්ෂිතව තිබුණි. මෙයින් එක් පර්යේෂණ නිලධාරියෙකු 2011 දෙසැම්බර් 09 දින විශ්‍රාම ගැනීමට නියමිත බව නොසලකා හරිමින් ව්‍යාපෘතිය සැලසුම් කිරීම හේතුවෙන් එම ව්‍යාපෘතිය අතහැර දමා තිබූ අතර වෙනත් පර්යේෂණ නිලධාරියෙකු හෝ යොදවා ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට කටයුතු කර නොතිබුණි.<br><br>(ii) එෆ්පී 83 ව්‍යාපෘතිය යුරෝපා සංගමයේ යූරෝ 683,528 ක මූල්‍යාධාර යටතේ 2009 මාර්තු මාසයේදී ආරම්භ කර 2012 අගෝස්තු මාසයේදී නිම කිරීමට අපේක්ෂිතව තිබුණි. එහෙත්, ආයතනික ඉහළ කළමනාකරණයේ පැවති දුර්වලතා හේතුවෙන් එම සංගමය විසින් මූල්‍යාධාර ලබා දීම නවත්වා තිබුණු අතර අලාභ පියවා ගැනීම සඳහා 2014 අගෝස්තු 25 දිනට කල්පිරෙන යූරෝ 81,097.48 ක් වටිනා හරපතක් ආයතනය වෙත නිකුත් කර තිබුණි. | එකඟ වෙමි<br><br>එකඟ වෙමි. මෙම තත්වය ආයතනයේ ගැටළුවක් නිසා නොව ව්‍යාපෘතියේ හවුල්කාර සමාගමක් සම්බන්ධ ගැටලුවකි. ආයතනය මෙම ව්‍යාපෘතියේ ප්‍රමුඛ පාර්ශවය බැවින් මෙම ගැටලුවට මැදිහත් වී ඇත. කෙසේ නමුදු යුරෝපා සංගමය සමඟ සාකච්ඡා කොට මෙම තත්වය නිරවුල් කරගැනීමට මේ වනවිට කටයුතු කරමින් සිටී. |

| | | |
|---|---|---|
| **4.2** | **කළමණාකරණ අකාර්යක්ෂමතා**<br>පහත නිරීක්ෂණ කරනු ලැබේ. | |
| (අ) | ආයතනයේ සනීපාරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් වූ කොන්ත්‍රාත් ගිවිසුම හා රු.36,644 ක් වටිනා කාර්ය සාධන බැඳුම්කරය දීර්ඝ කිරීමෙන් තොරව, සමාලෝචිත වර්ෂයේ මාස 05 ක කාලයක් සඳහා රු. 581,608 ක මුදලක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි. | එකඟවෙමි.ආයතනයේ සනීපාරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් 2013.03.01 සිට 2013.05.31 දක්වා කාර්ය සාධන බැඳුම්කරයක් සමඟ පෞද්ගලික ආයතනයක් වෙත කොන්ත්‍රාත්තුවක් ලබාදී තිබුණි. පසුව කාර්ය සාධන බැඳුම්කරය තවත් මස තුනක කාලයක් සඳහා එනම් 27.08.2013 තෙක් දීර්ඝ කරණ ලදී. එහෙත් එම ආයතනයේ කාර්යක්ෂමතව දිනෙනේ දින පිරිහීම නිසා කොන්ත්‍රාත්කරුවකු සපයා ගැනීමට ටෙන්ඩර් කැඳවන ලදී. එම නව කොන්ත්‍රාත්තුව 10.11.2013 දින වෙනත් ආයතනයකට පවරූ අතර 28.08.2013 සිට 09.11.2013 තෙක් දින 73 කාලයක් කාර්ය සාධන බැඳුම්කරයක් නොමැතිව ඉහත කී ආයතනයෙන් සේවා සපයා ගැනීමට සිදුවිය. මන්ද වෙනත් ආයතනයක් තෝරාගන්නා තෙක් පිරිසිදු කිරීම් කිරීමට වෙනත් ක්‍රමවේදයක් නොමැති බැවිනි. |
| (ආ) | ආයතනයේ සනීපාරක්ෂක සේවා සැපයීම සඳහා නියමිත ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටිය මඟින් තෝරාගත් ආයතනය වෙනුවට වෙනත් ආයතනයක් කිසිදු සේවා ගිවිසුමකට එළඹීමෙන් තොරව 2013 නොවැම්බර් 11 දින පත්කර තිබුණි. | ආයතන භූමිය පිරිසිදු කිරීම් සම්බන්ධව පරිසර පොලීසිය විසින් ආයතනය වෙත කිහිප විටක්ම චෝදනා එල්ල කළ අතර එමනිසා පිසිදු කිරීමේ කාර්යයන්ට ප්‍රසිද්ධයක් දරණ යටෝක්ත සමාගමට අදාල පිරිසිදු කිරීමේ කොන්ත්‍රාත්තුව පවරන ලදී. එමෙන්ම 31.10.2013 දින අදාළ ආයතනය සමඟ සේවා ගිවිසුමකට එලබී ඇත. |
| **4.4** | **නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්**<br><br>පහත නිරීක්ෂණ කරනු ලැබේ | |
| (අ) | එකතුව රු. 1,815,377 ක් වූ බැංකු ගිණුම් ශේෂ 03 ක් වසර 05 කට අධික කාලයක් තිස්සේ ක්‍රියාත්මක නොවන ජංගම ගිණුම් 03 ක පවත්වාගෙන ගොස් තිබූ අතර එම අරමුදල් සමාලෝචිත වර්ෂය තුලදී ද අදාල කටයුත්ත හෝ වෙනත් ඵලදායි කටයුත්තක් සඳහා උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමෙන් පසු ආයතනයේ බැංකු ගිණුම වෙත මුදල් පවරාගැනීමට ක්‍රියා කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| (ආ) | එෆ්පී 96 ව්‍යාපෘතිය ජාතික විද්‍යා පදනමේ රු. 1,920,000 ක මූල්‍යාධාර යටතේ 2011 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කර 2013 සැප්තැම්බර් මාසයේදී නිම කර තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ රු. 654,886 ක් වටිනා යන්ත්‍රයක් මුළු ඇස්තමේන්තු පිරිවැය රු.126,910 කින්ද ඉක්මවමින් සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගෙන තිබුණු අතර එම යන්ත්‍රය අවශ්‍යතාවයට නොගැලපීම හේතුවෙන් විගණිත දින වූ 2014 ජුනි 25 දින වන විටත් නිෂ්ක්‍රීයව පැවතුණි. | එෆ්පී 96 ව්‍යාපෘතිය සඳහා රු. 654,886.01 වටිනාකමක් ඇති පළතුරු යුෂ සිසිල් කරණ උපකරණය ව්‍යාපෘතියේවැඩ කටයුතු සඳහා යොදාගත නොහැකි වූයේ එය එම කටයුත්ත සඳහා නවයකරණය කිරීමකින් තොරව යොදාගත නොහැකි බැවිනි. මන්ද මෙම නව්‍යකරණය සඳහා ව්‍යාපෘතිය සඳහා වෙන් කරණ ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ හෙයිනි. එහෙත් මෙම උපකරණය මේ වනවිට අහාර තාක්ෂණ අංශයේ වාෂ්පීකරණ ක්‍රියාවලිය සඳහා යොදාගන්නා rotor evapоrator උපකරණයේ ක්‍රියාකාරීත්වය සඳහා යොදාගනු ලැබේ. |
| **4.5** | **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**<br><br>Waste Water Treatment Plant" නම්වූ යන්ත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත රු. 10,752,000 ක මුදලකට උප කොන්ත්‍රාත්තුවක් ලබාදී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු | |
| | (අ) මෙම උප කොන්ත්‍රාත්තුව ලබාදීම සම්බන්ධයෙන් සේවා ගිවිසුමකට එළඹ නොතිබුණු අතර කාර්යසාධන බැඳුම්කරයක්ද ලබා ගෙන නොතිබුණි. | පිළිගනිමි. ඉදිරියේදී කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීමෙන් තොරව උපකොන්ත්‍රාත්තු ලබාදීම සම්පූර්ණයෙන්ම තහනම් කර ඇත. |
| | (ආ) උප කොන්ත්‍රාත්තුව ලබා දුන් ආයතනය විසින් ලබා දී තිබුණු රු. 3,648,000 ක් වටිනා අත්තිකාරම් බැඳුම්කරය 2012 සැප්තැම්බර් 20 දින කල් ඉකුත් වී තිබුණු අතර එය දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. උපකොන්ත්‍රාත්තු ලබාදීමේදී මූල්‍ය අංශයේ පූර්ණ අනුදැනුම මත පමණක් කටයුතු කිරීමට උපදෙස් දී ඇත. එමගින් මෙවැනි තත්වයන් වලක්වාගැනීමට කටයුතු කරනු ලැබේ. |
| | (ඇ) සේවාදායකයාගේ ඉල්ලීමට අනුව 2012 අප්‍රේල් 23 දින සිට මාස 4 ක් ඇතුලත යන්ත්‍රාගාරයේ ඉදිකිරීම් නිම කළ යුතු වුවත්, 2013 මාර්තු මාසයේදී වැඩ නිම කර භාර දී තිබුණු නමුත් යන්ත්‍රාගාරය ක්‍රියා කරවීමේ අත්පොත හා අනෙකුත් වාර්තා විගණිත දින වූ 2014 මාර්තු 17 තෙක්ම ලබා දී නොතිබුණි. | පිළිගනිමි. යන්ත්‍රාගාරය ක්‍රියා කරවීමේ අත්පොත හා අනෙකුත් වාර්තා මේ වනවිට ලබා දී ඇත. |

**4.6** **කාර්ය මණ්ඩල පරිපාලනය**

2013 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු පහත දැක්වේ

| ශ්‍රේණිය | අනුමත | තත්‍ය | කොන්ත්‍රාත් | අතිරික්ත | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 52 | 34 | - | - | 18 |
| තෘතියික | 148 | 140 | 12 | 4 | - |
| ද්විතියික | 106 | 101 | 20 | 15 | - |
| ප්‍රාථමික | 86 | 60 | 13 | - | 13 |
| | 392 | 335 | 45 | 19 | 31 |

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුමත කාර්ය මණ්ඩලය වැඩිකර ගැනීමකින් තොරව තෘතියික මට්ටමේ තනතුරක් වූ පර්යේෂණ විද්‍යාඥයින් අනුමත සංඛ්‍යාව ඉක්මවා 09 දෙනෙකු වෙත ස්ථිර පත්වීම් ලබා දී තිබුණු අතර, එම තනතුරටම නිලධාරීන් 11 දෙනෙකු කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගෙන තිබුණි.

ආයතනයේ අනුමත සමස්ත සේවක සංඛ්‍යාවට යටත්ව සේවා අවශ්‍යතාව මත පර්යේෂණ විද්‍යාඥයන් බන්දවගනීමට ක්‍රියාකරන ලදී.

(ආ) ආයතනය වෙත අත්‍යවශ්‍ය ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ - පරිපාලන හා මානව සම්පත්, ප්‍රධාන ඉංජිනේරු, ප්‍රධාන ගණකාධිකාරි, ප්‍රධාන අලෙවි කළමනාකරණ නිලධාරී සහ පර්යේෂණ සහකාර තනතුරු පුරප්පාඩු 5 ක් පිරවීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂතනතුරට මේ වනවිට බඳවාගෙන ඇත.
ප්‍රධාන ඉංජිනේරු තනතුර සඳහා අයදුම්පත් කැඳවා ඇත.
බඳවා ගැනීමේ පටිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නව උපදෙස් අනුව සංශෝධනය කිරීමට කටයුතු කෙරෙමින් පවතින අතර අදාල සංශෝධන ලබා ගැනීමෙන් පසුව ඉතිරි නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලය තුල ස්ථිර නිලධාරීන් බඳවා ගැනීම සඳහා පුරප්පාඩු පැවතියද ස්ථිර පත්වීම් ලබා නොදී කොන්ත්‍රාත් පදනමට නිලධාරීන් බඳවාගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

පිළිගනිමි. ඉදිරියේදී බඳවාගැනීමේ පරිපාටිය අනුව කටයුතු කරණු ලැබේ.

<table>
<tr><td></td><td>

| තත්ත්වය | පුරප්පාඩු සංඛ්‍යාව | කොන්ත්‍රාත් පදනමට බඳවා ගත් සංඛ්‍යාව |
|---|---|---|
| රියදුරු | 04 | 03 |
| පුහුණු | 07 | 02 |
| අර්ධ පුහුණු | 14 | 05 |

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 හා 9.10 වගන්ති උල්ලංඝනය කරමින් ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් භාණ්ඩාගාර ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව නිලධාරීන් 06 දෙනෙකුගේ තනතුරු නාමයන් 2012 ජුලි 01 දින සිට වෙනස් කර තිබුණු අතර සියයට 50 ක දුරකථන ගාස්තු දීමනාවක් සහ ප්‍රවාහන දීමනා අනුමත කර තිබුණි. ඒ මත විගණිත දින වූ 2013 නොවැම්බර් 30 දිනට දුරකථන ගාස්තු දීමනා සඳහා රු.200,500 ක් ද ප්‍රවාහන දීමනා සඳහා රු. 548,510 ක් ද ආයතනය විසින් ගෙවා තිබුණි.</td><td>මෙම තනතුරු ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු ලෙස බඳවාගැනීමට අයදුම්පත් කැඳවා ඇත. එමෙන්ම මෙම තනතුරු සඳහා ගෙවන ලද 50% ගෙවීම පාලක මණ්ඩලයේ අනුමැතිය මත ගෙවීමට කටයුතු කරණ ලදී.මෙම අයදුම්කරුවන් 2012/05/22 දින අනුමත වූ බඳවාගැනීමේ පරිපාටිය අනුව අයදුම් කර ඇති අතර ඒ වනවිටද මෙම නිලධාරීන්අදාල සුදුසුකම් සපුරා ඇති බැවින් අදාල උසස්වීම් පසුදාතම් කිරීමෙන් පසු මෙම ගෙවීම සැසදෙනු ඇත.</td></tr>
<tr><td>5</td><td>ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය</td><td></td></tr>
<tr><td>5.1</td><td>අයවැය ලේඛනමය පාලනය<br><br>සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තත්‍ය ආදායම් හා වියදම් සැසඳීමේදී සියයට 1 සිට සියයට 349 දක්වා විචලනයක් දක්නට ලැබීම නිසා අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.</td><td>ඉදිරියේදී අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස උපයෝගී කරගැනීමට කටයුතු කරනු ලැබේ.</td></tr>
</table>

| | | |
|---|---|---|
| **5.2** | **වාර්ෂික වාර්තා සභාගත කිරීම**<br><br>2003 ජුනි 02 දින හා අංක පීඊඩී - 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව වාර්ෂික වාර්තාව මූල්‍ය වර්ෂය අවසාන වී දින 150 ක් තුළ පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව මේ දක්වා සභාගත කර නොතිබුණි. 2011 වාර්ෂික වාර්තාව ද2013 ජූලි 23 දින සභාගත කර තිබුණි. | වාර්ෂික වාර්තාව මේ වනවිට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. |
| **6** | **පද්ධති හා පාලන**<br><br>විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.<br>(අ) අයවැය පාලනය<br>(ආ) ස්ථාවර වත්කම් පාලනය<br>(ඇ) ගිණුම්කරණය<br>(ඈ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය<br>(ඉ) කාර්ය මණ්ඩල පරිපාලනය<br>(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය<br>(උ) ව්‍යාපෘතිපරිපාලනය | මෙම පද්ධතීන් අඛණ්ඩව වැඩිදියුණු කිරීමට සටහන් කරගතිමි. |